මම එක නිදර්ශනයක් දෙන්න කැමතියි. ඔවැනි දෙයක් ඇමතිතුමාගේ අමාත්‍යාංශය යටතේත් තිබෙනවා. මම එකක් පෙන්වන් නම්. ඇමතිතුමාගේම අමාත්‍යාංශය යටතේ තිබෙන ගෘහ කර්මාන්ත අංශය නැත්නම් "කොටේජ් ඉන්ඩස්ට්‍රීස්" අංශය ගැන බලන්න. එක්සත් ජාතීන්ගේ මණ්ඩලය වෙනුවෙන් ඉන්දියානු ජාතික නිලධාරීන් තුන් දෙනෙක් එයට ඇවිත් සිටිනවා. කරුණාකර ඒ අය මෙපමණ කලක් කර තිබෙන වැඩ මොනවද කියා සොයා බලන්න. ගෘහ කර්මාන්තය දියුණු කිරීම වෙනුවට ගෘහ කර්මාන්ත දියුණුවේ සම් පූර්ණ හතුරන් හැටියට මේ අය වැඩ කර තිබෙන බව මට කියන්න පුළුවන්. ඇත්ත වශයෙන්ම මා එක අතකින් මේ ඇමති තුමාට ප්‍රශංසා කරන්න ඕනෑ. වයිට්එවේ ගොඩනැගිල්ලේ ගෘහ කර්මාන්ත ප්‍රදර්ශනය කිරීමේ නැත්නම් අලෙවි කිරීමේ කටයුත්ත පිළිබඳව අවුරුදු දෙකක් තිස්සේ එහි හතු රන් හැටියට මේ අය කටයුතු කළා. මේකත් එවැනි තත්ත්වයකට ගෙනෙන්න එපා. කවුරුත් බලාපොරොත්තු වූ දෙයක් දැන් නිකම් ව්‍යවර්ථ වී තිබෙනව.

අනික් එක මේකයි. මේ ඇමතිතුමා කර් මාන්ත පිළිබඳව පනත් දෙකක් ඉදිරිපත් කර තිබෙනව. එකක් "රෙගුලේෂන් ඔෆ් ඉන්ඩස්ට්‍රීස්" ඒ කියන්නෙ කර්මාන්ත විධිමත් කිරීමේ පණත. අනික මේ පරිමාණ කාර්යාංශ පණත. මේවා ගෙනෙන්නෙ විශේෂයෙන්ම කර්මාන්තවල යම්කිසි තත්ත්වයක් ඇති කිරීම පිණිසයි. මූලික වශයෙන් ඔය පනත් දෙකට මේ පැත්තෙ කවුරුවත් විරුද්ධයි කියා මා හිතන්නෙ නැහැ. මේ ගැන මන්ත්‍රීවරුන් ගණනාවක්ම කථා කරන්නට යෙදුණා. අනික් පණතත් හෙට ගන්න යනව. නමුත් මෙහිදී මතු කරන ප්‍රශ්නය මේකයි. මේ රටේ නොයෙ කුත් අන්දමේ කර්මාන්ත ආරම්භ කර තිබෙනවා, නොයෙකුත් දේ නිෂ්පාදනය කරගෙන යනව. මෙපමණ කාලයක් අඩු පාඩුවක් වශයෙන් තිබුණු කාරණා දෙකක් මෙම පණත් දෙක ඉදිරිපත් කිරීමෙන් තර මක් දුරට පිරිමැසෙනවායයි කල්පනා කරන්නට පුළුවනි. මෙරට නිෂ්පාදනය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරන ද්‍රව්‍යවල තත්ත්වය පිරිසිදු අන්දමින් උසස් අන්දමින් පවත්වා ගෙන යාම සඳහායි, මෙම පණත ඉදිරිපත් කර තිබෙන්නෙ. එය ඉතාමත් වැදගත් දෙයක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙරට බඩු නිෂ්පාදනය කරනවා වාගේම ඒවා අලෙවි කරන්න ඕනෑ. ඒවා පාරිභෝගිකයන් ලබා ගන්න ඕනෑ. නමුත් පාරිභෝගිකයන් ලබා ගන්නා මිල පිළිබඳ ප්‍රශ්නය ගැන මොකක්ද කර තිබෙන්නෙ ? මෙය ඉතාමත් වැදගත් ප්‍රශ්නයක්. බඩුවල තත්ත්වය උසස් අන්දමින් පවත්වාගෙන යාමටයි මේ පණත ගෙනත් තිබෙන්නෙ. අපි ප්‍රාර්ථනය කරමු බඩුවල තත්ත්වය හොඳින් පවත්වා ගෙන යාමට මේ පණතින් අවකාශ ලැබේ වායි කියා. නමුත් බඩුවල මිල නියම කිරීම ගැන මෙපමණ කාලයක් තිස්සේ ඇමති තුමා මොනවාද කර තිබෙන්නෙ ?

**ගරු මෛත්‍රීපාල සේනානායක**
*(கௌரவ மைத்திரிபால சேனநாயக்க)*
(The Hon. Maithripala Senanayeke)

ඒ අංශය මට අයිති නැහැ. නමුත් ඒ සම්බන්ධයෙන්—මිල නියම කිරීම සම්බන්ධයෙන්—අපේ වාණිජ අමාත්‍යාංශය දැනට කටයුතු කරගෙන යන බව කියන්න කැමතියි.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

මම අහන්නෙත් ඒ ප්‍රශ්නය ගැනමයි. පාර්ලිමේන්තු වාරය මාස හතරකට කල් දමන්නට කලින් මිල පාලන ආඥා පණත සංශෝධනය කිරීම සඳහා කෙටුම්පත් පණතක් ගෙනවා. ඒ ගැන කථා කරන කොට ඇමතිතුමා කියා සිටියා, ඊට අදාළ කෙටුම්පත් පණතක් ඉදිරිපත් කරන්නෙ නැතුව පාලනය කරන්නට බැරිය කියා. ඊට පසුව පාර්ලිමේන්තුව රැස් වූ විට වැඩි කාලයක් නොගෙන, පැය ගණනාවකින් එම පණත සම්මත කරගෙන දැන් මාස දෙකක් ගත වී තිබුණත් අද වනතුරුවත් මිල නියම කර නැහැ.

**ගරු මෛත්‍රීපාල සේනානායක**
*(கௌரவ மைத்திரிபால சேனநாயக்க)*
(The Hon. Maithripala Senanayeke)

"ක්වොලිටි කොන්ට්රෝල්", එහෙම නැත්නම් තත්ත්වයේ මැනීමක් නැතුව ද්‍රව්‍යයක මිල නියම කරන්න අමාරුයි. සමහර විට එකවගේ බඩු දෙකක් දෙවිධියකට හදන්න පුළුවනි. එහෙම වුණොත් දෙවිධියකින් මිල නියම කරන්න සිදු වෙනව. එම නිසා එහි "ස්ටෑන්ඩඩ්" නැත්නම් තත්ත්වය පරීක්ෂා කර බලා මිල නියම කරන්නට පුළුවනි. ඒ වාගේම මෙම මිල නියම කිරීම වාණිජ අමාත්‍යාංශයෙන් ක්‍රියාවේ යෙදවිය යුතු දෙයක්.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

නමුත් මෙය ක්‍රියාවේ යොදන නැතැත්තා කවුරු හෝ වේවා අපට දැන ගන්නට ඕනෑ කවදා විතර මෙම බඩු මිල නියම කරනවාද කියා. ඉදිරිපත් කර තිබෙන මේ පණත අද සම්මත වෙයි. ඇමතිතුමාගෙ පක්ෂයෙ අය වැඩි නිසා මෙය කාරක සභා අවස්ථාවත් අවසන් කර ඉක්මනින් සම්මත කර ගනීවි. මම හිතන හැටියට අදම සම්මත වෙයි. එහෙම නම් මම ඇමතිතුමා ගෙන් අහනව, ද්‍රව්‍යවල මිල නියම කිරීම ගැන පොරොන්දුවක් දෙනවාද කියා. අද බොහොමයක් බඩුවල මිල ඉහළ නැගල. දවසින් දවස ඉහළ නගිනව.

**ගරු මෛත්‍රීපාල සේනානායක**
*(கௌரவ மைத்திரிபால சேனநாயக்க)*
(The Hon. Maithripala Senanayeke)

එක පාරටම අහවල් දවසට නියම කරන වාය කියල පොරොන්දුවක් දෙන්න අමාරුයි. නමුත් පුළුවන්තරම් ඉක්මනට එය කරනව.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

අනික් කාරණය : මේක බල පාන්නෙ පෞද්ගලික කර්මාන්තවලට පමණයි. එත කොට රජයේ කර්මාන්ත ගැන—

**ගරු මෛත්‍රීපාල සේනානායක**
*(கௌரவ மைத்திரிபால சேனநாயக்க)*
(The Hon. Maithripala Senanayeke)

රජයේ කර්මාන්තත් ඇතුළත් කරන්න පුළුවනි. මේකෙන් නැති වුණත් අණපනත් වලින් ක්‍රියාවේ යොදවන්න පුළුවනි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

වෙනත් වෙනත් මාර්ගවලින් ක්‍රියාවේ යොදවනවායයි කියනව. එහෙම නම් දැන් පෝර සංයුක්ත මණ්ඩලයක් තිබෙනව, මේ සංයුක්ත මණ්ඩලයෙන් පෝර ගෙන් වීම කරනව—

**ගරු මෛත්‍රීපාල සේනානායක**
*(கௌரவ மைத்திரிபால சேனநாயக்க)*
(The Hon. Maithripala Senanayeke)

පෝර ගෙන්වා මිශ්‍ර කරනවා පමණයි කරන්නෙ.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

මහජනතාවට පෝර ලැබෙන්නෙ මේ සංයුක්ත මණ්ඩලයේ මාර්ගයෙන්. ඇමතිතුමාට අයත් අංශයක් නොවන නිසා සම හර විට මම ඉදිරිපත් කරන කාරණය එතුමා නොදන්නවා ඇති. කෙසේ වුණත් මෙම සංයුක්ත මණ්ඩලයෙන් බෙදා හරින පෝර හොණ්ඩරයක මිල නියම කර තිබෙන්නෙ රුපියල් 20 කට. අද ගොවියන් පැමිණිලි කර තිබෙනව, පෝරවලට අධික මිලක් නියම කිරීම නිසා ඒ අයට විශාල දුෂ්කරතාවකට මුහුණපාන්නට සිදු වී තිබෙනවාය කියා. ඒ අය කියනවා, කවද වත් පෝර හොණ්ඩරය රුපියල් 20 කට මිල නියම කර නැති බව. එහෙම නම් ඒ ගොවියන් වැඩ කටයුතු කරගෙන යන්නෙ කොහොමද? ඒ අය වගාවන් දියුණු කරන්නෙ කොහොමද? ඒ අය කොයි තරම් දුක් විඳිනවද ? එහෙත් අවශ්‍ය දේවල් නැහැ. මෙහෙන් බඩු මිල ඉහළ නගිනව. ගොවියන්ට ඉතාමත් අවශ්‍ය ද්‍රව්‍යයක් වන පොහොරවල මිල ඉහළ නංවා තිබීම කොයි තරම් වැරදිද? එම නිසා මිල පාලනය කිරීම සම්බන්ධයෙන්, මිල නියම කිරීම සම්බන්ධයෙන්, හරියාකාර වැඩ පිළිවෙළක්-හැම අංශයක් ගැනම—ඉතාමත් ඉක්මනින් අර ගන්නට ඕනෑ. දවසින් දවස ප්‍රමාද වෙන කොට දවසින් දවස බඩු මිල ඉහළ නගිනව, ජනතාව විශේෂයෙන්ම ගොවි ජනතාව දුක් විඳිනව. පරිහරණය කරන ද්‍රව්‍යවල මිල නගිනව, අපේ ද්‍රව්‍යවල මිල, පිටරට පටවන ද්‍රව්‍යවල මිල පහත වැටෙනව. නමුත් ඒවා කිසිවක් ගැන සලකන්නෙ නැතුව අතන්—මතන් කියනව. පාරිභෝගික මිල නගින විට බඩු මිල පහත වැටෙනව. අපේ නිපදවන ද්‍රව්‍යවල තත්ත්වය පහතට වැටෙනව. එම නිසා මෙය ජනතාවට බලවත් කරදරයට මුහුණ පෑමට හේතුවක් වී ඇති බැවින් පුළුවන් තරම් ඉක්මනට, නියම පිළිවෙළට කර්මාන්ත ගෙන යාමට අවශ්‍ය නීතිරීති සකස් කරන ලෙස, ක්‍රියාත්මක කරන ලෙස, මම ඉල්ලා සිටිනව. මේ පණත් අද නැතිනම් හෙට සම්මත වෙයි. ඊළඟ පියවර වන මිල නියම කිරීම පිළිබඳව, පුළුවන්තරම් ඉක්මනට යෝජනා ඉදිරිපත් කර, සම්මත කර මහජනතාවට සහනයක් සලසා දෙන ලෙස ඉල්ලා සිටිමින් මගේ කථාව මෙයින් අවසන් කරනව.

අ. භා. 3.53

**ගරු මෛත්‍රීපාල සේනානායක**
*(கௌரவ மைத்திரிபால சேனநாயக்க)*
(The Hon. Maithripala Senanayeke)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා සිතන හැටියට මේ කෙටුම්පත් පණතේ අවශ්‍යතාව ගැන කවුරුවත් තර්ක කරන්නෙ නැහැ. ප්‍රථමයෙන් මේ පණත ඉදිරිපත් කරන අවස්ථාවේදී මා සඳහන් කළ පරිදි, ගිය අවුරුද්දෙත් මේ පණත ඉදිරිපත් කිරීමට මා මහන්සි ගත්තා. නමුත් යම් යම් කාරණා නිසා පණත ඉදිරිපත් කිරීම ප්‍රමාද වුණා. අද කර්මාන්ත අතින් රටේ යම් දියුණුවක් ඇති වීගෙන යන නිසා ඒ නිෂ්පාදන පාරිභෝගිකයා අතට පත් කරන අවස්ථාවේදී යම් විධියක තත්ත්වයක් ඒ නිෂ්පාදනවල තිබීම අවශ්‍ය නිසයි මේ කෙටුම්පත් පණත වුවමනා කරන්නෙ. එය වැඩි දුර වත් විස්තර කළ යුතුය කියා මා සිතන්නෙ නැහැ. මේ සංස්ථාව ඇති කළාට පසු ඒ මාර්ගයෙන් රටේ නිෂ්පාදනය කරන බඩු සම්බන්ධව යම් විධියක තත්ත්වයක් ඇති කිරීමට අපි බලාපොරොත්තු වෙනව. මේ පිහිටුවන ආයතනය මගින් එය කළ හැකි වේය කියා අපි බලාපොරොත්තු වෙනව.

වැලිමඩ ගරු මන්ත්‍රීතුමා (කේ. එම්. පී. රාජරත්න මයා.) සැකයක් පහළ කළා දඬුවම් දීම සම්බන්ධයෙන් මේ පණතේ විශේෂත්වයක් තිබෙනවාද කියා. මම කලින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කී 13 ජේ කොටස නොවෙයි, 19 වැනි වගන්තිය බැලුවොත් මෙසේ සඳහන්ව තිබෙන බව පෙනී යනවා ඇති :

The Minister may, subject to the provisions of sub-section (2) of this section and section 20, by Order published in the Gazette—

(a) on the recommendation of the Bureau, declare any standard specification for any commodity or for the manufacture, production, processing or treatment of any commodity to be, with effect from a date specified in the Order, a compulsory standard specification for that commodity or for the manufacture, production, processing or treatment of that commodity, and

(b) prescribe, in respect of any compulsory standard specification, a distinctive mark for any commodity which complies with that specification or which has been manufactured, produced, processed or treated in accordance with that specification.

ඒ වගන්තිය යටතේත් 45 වන වගන්තිය යටතේ ඇති තරම් බලතල තිබෙනවාය යන්නයි අපට නීතිවේදීන් කියා තිබෙන්නේ. කෙසේ වුවත් ක්‍රියාවේ යෙදීමේදී යම් විධියක අඩුපාඩුකම් තිබෙනවාය කියා පෙනී ගියහොත්, ඒවා සම්පූර්ණ කර ගැනීම සඳහා අවශ්‍ය සංශෝධන මේ ගරු සභාවට ඉදිරිපත් කිරීමට මා මැළි නොවන බව මේ අවස්ථාවේදී මතක් කරන්නට සතුටුයි.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

දැන් මේ 19 වන වගන්තිය අනුව වරදක් වෙනවා නම් සොයා බලන්න ඇමතිතුමාට බලතල දී තිබෙනවාය යන්න මාත් පිළිගන්නවා. නමුත් දඬුවම් දීම පිණිස 19 වන වගන්තිය සම්බන්ධයෙන් 45 වන වගන්තියේ කිසිම දෙයක් සඳහන් කර නැහැ. අන්න ඒකයි මම කියන්නේ. 19 වන වගන්තිය යටතේ ඇමතිවරයාගෙ නියමය කඩ කරනවා නම් එය දඬුවම් ලැබිය යුතු කාරණයක්ය කීවොත් හරි යනවා. දැන් අර "ඒ" එකේ තිබෙන්නේ:

"Any person who—

(a) contravenes, or fails to comply with, the provisions of sub-section (1) . . . ."

ඒ විධියට 18 වන වගන්තියට පසුව අලුත් වගන්තියක් දමන්න. අර මුල් එකේ වාගෙ "ජේ" කියා අලුත් එකක් 19 ට දම්මාම හරි.

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

මා කරුණාවෙන් මතක් කරනව, මේ පණත සම්මත කළාට පසු යම් යම් වැඩ පිළිවෙළවල් ගන්න තියෙනව. අඩුපාඩුකම් තිබෙනවාය කියා පෙනී ගියොත් පසුව ඒවා හරිගස්සා ගැනීමට මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නම්.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

කෙටුම්පත් පණත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.

මතු පළ වන යෝජනාව සභාසම්මත විය :

"කෙටුම්පත් පණත පූර්ණ මන්ත්‍රි මණ්ඩල කාරක සභාවකට පැවරිය යුතුය." [ගරු මෛත්‍රීපාල සේනානායක]

කාරකසභා නියෝජ්‍ය සභාපති
(குழுக்களின் பிரதி அக்கிராசனர்)
(Mr. Deputy Chairman of Committee)

The Sitting is suspended till 4.30 P.M.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ. භා. 4.30 ට නැවත පවත්වන ලදී.

[කාරකසභාවෙහිදී]

කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ විය.

1 වන වගන්තියේ සිට 18 වන වගන්තිය තෙක් කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

CLAUSE 19.—(*Power of Minister by Order to declare compulsory standard specifications.*)

**කේ. එම්. පී. රාජරත්න මයා.**

*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*

(Mr. K. M. P. Rajaratna)

ප්‍රථමයෙනුත් සඳහන් කළ කරුණක් මෙම වගන්තිය යටතෙ නැවත වරක් විස්තර කර දෙන්න කැමතියි. ගරු ඇමතිතුමා කීව, ගිනිපෙට්ටිවලට කඩදාසි පටිය යොදන්නෙ මිල සම්බන්ධයෙන්ය කියා. ගැසට් නිවේදනයෙ පළ කර තිබුණු ආකාරයට, මට පෙනී ගියා ශත 05ට විකුණන ගිනිපෙට්ටියට එක්තරා කූරු ගණනකුත් ඇතුළත් කර ඇති බව.

ගරු නියොජ්‍ය සභාපතිතුමනි, පරිමාණ අංශය යටතෙ එක්තරා ගිනිපෙට්ටි වර්ගයකට යම්කිසි ලාංඡනයක් දුන්නය කියා සිතමු. නියම තත්ත්වයට අනුව මෙතරම් ප්‍රමාණයක් ගිනිකූරු එම ගිනිපෙට්ටියකට ඇතුළත් කළ යුතුය කියා නියෝගය කළාය යි සිතමු. නමුත් කූරු 50කට අනුමත කළ ගිනිපෙට්ටියක් පාරිභෝගිකයට ලැබෙන විට එහි තිබෙන කූරු ගණන 20ක් තිබෙන්න පුළුවනි. සමහරවිට එවැනි ගිනිපෙට්ටි නිසා අනතුරු සිදු වන්නත් ඉඩ තියෙනව. වැසිපොදට අසුවීමෙන් ඒවයෙ බෙහෙත් වර්ග දියවී හෝ ගැළවී හෝ යන්නත් පුළුවනි. පිටිසර අයට මෙවැනි තත්ත්වයන්ට මුහුණ පාන්න සිදු වුණාම මොකක්ද වන්නෙ? මෙවැනි දේ සිදු වන්න ඉඩ තිබෙන නිසයි, මා මේ ගැන කතා කරන්නෙ. වැලිමඩ ආසනයෙ, වලපනේ ආසනයෙ, නැතිනම් හපුතලේ ආසනයෙ සිටින දුප්පත් පිටිසර තැනැත්තෙකු එවැනි භාණ්ඩයක් මිලදී ගෙන අර විධියෙ තත්ත්වයකට මුහුණ පාන්න වුණාම කොතරම් නරකද?

**ඩබ්ලිව්. පී. ජී. ආරියදාස මයා. (සෞඛ්‍ය කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. டபிள்யூ. பீ. ஜீ. ஆரியதாச—சுகாதார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. W. P. G. Ariyadasa—Parliamentary Secretary to the Minister of Health)

අද එසේ සිදු වෙනව.

**කේ. එම්. පී. රාජරත්න මයා.**

*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*

(Mr. K. M. P. Rajaratna)

සෞඛ්‍ය කටයුතු පිළිබඳ ගරු ඇමතිගෙ පාර්ලිමේන්තු ලේකම්තුමා කියනව එසේ සිදු වෙනවය කියා. පරිමාණ අංශය මඟින් අනුමත කළ තත්ත්වයට සරිලන්නෙ නැති එවැනි භාණ්ඩ සඳහා ක්‍රියා කරන්න ගරු ඇමතිතුමාට හෝ පරිමාණ අංශයට හෝ තියෙන බලය කුමක්ද? තේ පානය සඳහා විසිර ගිය අවස්ථාවෙදි මේ ගැන මා විශෙෂයෙන් සොයා බැලුව. නමුත් ඒ අයට එවැනි බලයක් නැහැ. කවුරු හෝ එවැනි බඩුවක් අරගෙන සතියකින් විතර ගරු ඇමතිතුමාට ලැබෙන්න එවන්න පුළුවනි. එතුම 19 වන වගන්තිය යටතෙ ඒ ගැන පරීක්ෂා කර බලන්න පරිමාණ අංශයට යවාවි. එම අංශයෙ අයත් ඒ ගැන පරීක්ෂා කර බලා "නියම තත්ත්වයට නැහැ" කියා ප්‍රකාශ කරාවි. සුදුසු නැති තත්ත්වයක තිබෙන එවැනි ද්‍රව්‍යයන් සම්බන්ධයෙන් ක්‍රියා කරන්න නීතියක් නැහැ. නීතියක් තියෙනව නම් පෙන්වන්නය කියා මා අභියෝග කරනව. 19 වන වගන්තිය යටතෙ එවැනි දෙයක් නිසියාකාර සකස් කර තිබෙනවද නැද්ද කියා සොයා බලන්න පරිමාණ අංශයට යවන්න පුළුවන්කම තියෙනව. ඊට වඩා කිසිවක් කරන්න බැහැ. නීති කෙටුම්පත්කරුත් කැඳවා මේ සම්බන්ධයෙන් යමක් කරන්න කල්පනාව යොමු කරන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව.

මා මේ අන්දමට කතා කරන්නෙ, මෙම නීති රීති හරියාකාර ක්‍රියාවෙ යොදවන්න උපකාර කිරීමෙ අදහසිනුයි.

**ආරියදාස මයා.**

*(திரு. ஆரியதாஸ)*

(Mr. Ariyadasa)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මාත් මේ සම්බන්ධයෙන් වචන ස්වල්පයක් කථා කරන්න බලාපොරොත්තු වෙනවා. මේ කාරණය ගැන මීට කලිනුත් මා ගරු ඇමතිතුමා වෙත අදහස් ඉදිරිපත් කර තිබෙනව. මා ඉදිරිපත් කළ කරුණුවලට එතුමා මා වෙත පිළිතුරක් එවලත් තිබෙනවා. පළමුවෙන්ම මට කියන්න තියෙන්නෙ වැලිමඩ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ කරුණු ඇත්ත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වශයෙන්ම මාත් පිළිගන්න බවයි. එතුමා සඳහන් කළ දේම මාත් ගරු ඇමතිතුමාට මීට පෙර ලියා යැව්වා. අපේ රටේ ගිනි පෙට්ටි සෑදීමේ කාර්මාන්තය පටන් ගෙන දැන් අවුරුදු විස්සක් විසිපහක් වෙනවා. ඒ තරම් දීර්ඝ කාලයක් තිස්සේ අපේ රටේ ගිනි පෙට්ටි සෑදීම කරගෙන යන නමුත් තවමත් මේ රටේ සාදන ගිනිපෙට්ටි වල තත්ත්වය සතුටුදායකය කියන්න නම් පුළුවන්කමක් නැහැ. අවුරුද්දෙන් අවුරුද්ද අපට පෙනී යන්නෙ ඒවායේ තත්වය බැහැගෙන බැහැගෙන යන බවයි. මේ ගැන මා ගරු ඇමතිතුමාට දොස් කියනවා නොවෙයි. මා සඳහන් කරන්නෙ අපට දකින්න ලැබෙන දේවල් ගැනයි. සමහර විට අකෘතඥවාදී පුද්ගලයන් මුදල් ඉපයීමේ අදහසම පෙරදැරි කරගෙන ක්‍රියා කිරීම නිසා මෙවැනි තත්ත්වයක් උදා වී තිබෙනවා වෙන්න පුළුවනි. ඒ වගේම එවැනි දේවල් මැඩ පැවැත්වීම සඳහා බලපාන සැලකියයුතු නීති නැති නිසාත් අපේ රටේ සාදනු ලබන ද්‍රව්‍යවල තත්ත්වය දවසින් දවස ඔය ආකාරයට වැටීගෙන යනවා වෙන්නත් පුළුවනි. කොයි හැටි වෙතත්, මා මුලින් සඳහන් කළ විධියේ අවාසනාවන්ත තත්ත්වයක් දැන් ඇති වෙලා තිබෙනවා. මා කියන කාරණය ගරු ඇමතිතුමා පිළිගන්නවා ඇති.

විදුලි බුබුලු සාදන කර්මාන්ත ශාලාවක් විවෘත කිරීමට පසුගිය කාලයේ දවසක ගරු ඇමතිතුමාත් මාත් ගියා. එතුමට මතක ඇති එදා අපට විදුලි බුබුලු දුසිමක් තෑගි වශයෙන් ලැබුණු බව. ගරු ඇමතිතුමාට හයයි, මට හයයි එදා ලැබුණා. ඒ විදුලි බල්බ් හය තවමත් පත්තු වෙනවා. ඒ වුණත් ඊට පස්සේ හදන විදුලි බල්බ් වල තත්ත්වය ඊට වඩා බොහොම පහළ ගොස් ඇති බව පෙනෙනවා. සමහර විට මකුළු දැළක් කඩන්න ගිය අවස්ථාවක ටිකක් හෙළවුණොත් එහෙම කාපිය ඒ බල්බ් නිවී යනවා. ඔන්න ඔය විධියේ තත්ත්වයක් මෑත කාලයේ සාදන බල්බ් වල දකින්න ලැබෙනවා. වෙනත් රට වලත් "බියුරෝ ඔෆ් ස්ටෑන්ඩඩ්ස්" තිබෙනවාය කියා මා හිතනවා. බලන්න අපේ රටට පිටරටින් ගෙන්වනු ලබන ගිනි පෙට්ටි ගැන. චෙකෝස්ලෝවාකියාවෙන් ගෙන්වන ගිනිපෙට්ටි බොහොම හොඳයි. ඒවායේ ගිනිකූරු සියේට සීයක්ම පත්තු වෙනවා. එහෙත් අපේ රටේ සාදනු ලබන ගිනිපෙට්ටි බොහොමයකම ගිනිකූරුවලින් සියේට අනූවක් තරම පත්තු වෙන්නෙ නැහැ; පත්තු වෙන්නෙ සියේට දහයක් පමණය කියන්නත් පුළුවන් තරමයි. ඒ සම්බන්ධයෙන් ටිකක් කල්පනා කර බලන්න ඕනෑ. මා කී විධියේ අකෘතඥ පුද්ගලයින්ට ඔය විධියේ කර්මාන්ත ලැබුණාම මුදල් ඉපයීමේ මූලික අදහසින්ම වැඩ කරනවා මිස මහජනයාගේ ඕනෑ එපාකම් අනුව වැඩ කරන්න කිසිම උත්සාහයක් නොකරන බව ගරු ඇමතිතුමා වෙත සඳහන් කරන්න කැමතියි.

**මාකන්-මාකර් මයා.**
*(ஜனாப் மாக்கன் மாக்கர்)*
(Mr. Macan Markar)

As reference has been made to bulbs manufactured by Ceylon Bulbs and Electricals Limited, of which I happen to be a director, I think in fairness I should reply to the hon. Parliamentary Secretary.

During the early stages of production, no doubt, there were cases where the bulbs did not function properly.

**ආරියදාස මයා.**
*(திரு. ஆரியதாஸ)*
(Mr. Ariyadasa)

No, no ; that is not my point.

**මාකන්-මාකර් මයා.**
*(ஜனாப் மாக்கன் மாக்கர்)*
(Mr. Macan Markar)

But now, the Company on its own initiative has got these bulbs tested by the C. I. S. I. R. Samples to be tested are not submitted to the C. I. S. I. R. by the Company. The C.I.S.I.R. makes random purchases from various dealers throughout Colombo City and subjects the bulbs to a test. The test is that the bulbs should on an average burn for at least 1,000 hours. If they burn throughout the 24 hours of the day at a stretch, they should have a life of 42 days. Further, 90 per cent of the bulbs tested should conform to the minimum standard of 1,000 hours.

The directors of the Company wished to have these bulbs tested in order to ensure that whatever they


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මාකන්-මාකර් මයා.]

sold came up to British standard specifications. The reports on the test are available for inspection by any hon. Member. The test is a completely independent one conducted by the C.I.S.I.R. They themselves make the purchases, for which the Company pays, and test the bulbs selected. According to their certificates, the bulbs now conform to British standard specifications. No doubt, during the early stages, immediately after trial production, the bulbs in some cases did not function properly.

**ආරියදාස මයා.**
*(திரு. ஆரியதாஸ)*
(Mr. Ariyadasa)

That is not actually what I said. What I said was that when the Minister and I went to declare open the Factory, we were given six bulbs each. Judging from those bulbs, the standard of production was very much better then. In fact, there was a demonstration to show that the bulbs actually burned for 1,200 hours. What I say is that the bulbs produced at the beginning were superior.

**මාකන්-මාකර් මයා.**
*(ஜனாப் மாக்கன் மாக்கர்)*
(Mr. Macan Markar)

No ; it is the other way about. Perhaps, when they selected the bulbs for presentation they may have made absolutely certain that those bulbs would burn for 1,000—odd hours. But, according to the C.I.S.I.R. reports, the Company has been able to produce bulbs which come up to British standard specifications.

**ගරු මෛත්‍රීපාල සේනානායක**
*(கௌரவ மைத்திரிபால சேனநாயக்க)*
(The Hon. Maithripala Senanayeke)

I think they have changed the gas which they use.

**මාකන්-මාකර් මයා.**
*(ஜனாப் மாக்கன் மாக்கர்)*
(Mr. Macan Markar)

Yes.

**සිංගල්ටන්-සැමන් මයා.**
*(திரு. சிங்கல்டன்-சமன்)*
(Mr. Singleton-Salmon)

According to the reports mentioned by the hon. Second Member for Batticaloa, the bulbs produced in Ceylon are as good as those we used to import, from the point of view of the number of hours they will burn.

As regards the point made by the hon. Member for Welimada (Mr. K. M. P. Rajaratna), I think he is confusing this Bill with the Control of Prices Bill. He talks about controlling the prices of matches. Well, this Bill has nothing to do with the control of prices. I agree with him that we should insist on certain standards of manufacture, but you cannot control prices in a Bureau of Standards Bill.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පත් කරන ලද ගරු මන්ත්‍රීතුමාට මා කී කාරණය තේරුම් නොයාම ගැන මා පුදුම වන්නේ නැහැ. සෞඛ්‍ය කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමා කළ ප්‍රකාශය සම්බන්ධයෙන් මඩකලපුවේ දෙවන ගරු මන්ත්‍රීතුමා කළ ප්‍රකාශය ගැන මා එතුමට දොස් කියනවා නොවෙයි. එතුමා අධ්‍යක්ෂවරයෙකු හැටියට තමන්ට ලැබී තිබෙන තොරතුරු අනුව ඇති කර ගත් දැනුම අනුවයි ඒ ප්‍රකාශය කළේ. විදුලි බුබුලක් පැය දාහක් තරම කාලයක් තුළ සාමාන්‍යයෙන් පත්තු වෙනවය කියලයි එතුමා කිව්වෙ. දළ වශයෙන් ඒකයි ගණන. සී. අයි. එස්. ආර්. හෙවත් ලංකා විද්‍යා පර්යේෂණායතනය මගිනුත් ඒ ගැන ඒ ආකාරයට වාර්තා කර තිබෙනවාය කියනවා. වාර්තාවල එහෙම තිබෙන්නත් ඇති. ඒ වුණාට ඒ ගරු මන්ත්‍රීතුමා කළ ප්‍රකාශය ගැන මට පුදුම හිතුනා. එතුමා කී දේ වැරදියි කියන්නෙ නැහැ, මම. මා කියන්නෙ මගේ අත්දැකීම් අනුවයි. අපට දැන් ලැබෙන්නෙ ලංකාවේ සාදා විකුණනු ලබන බල්බ්. වෙනත් ඒවා අපට ලැබෙන්නෙ නැහැ. අපට පාවිච්චි කරන්න ලැබෙන ඒවා සාමාන්‍යයෙන් දවසකට පැය පහකට [illegible] වඩා අප අතින් පාවිච්චි වෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නෙත් නැහැ. දවස් පහළොවකට විස්සකට වැඩි කාලයක් ඒවා පාවිච්චි වෙන්නෙ නැහැ. අප ගත් එකක්වත් ඊට වඩා කාල යක් පාවිච්චි කරන්න අපට බැරි වුණා. ඊයේ පෙරේදා විදුලිය කෙටීමක් සමග තද වර්ෂාවක් ඇති වුණා. ඉබේම බල්බ් දහ යක් දොළහක් නිවී ගියා. මීට ඉස්සර නම් කොයි තරම් විදුලි කෙටුවත්, අහස ගෙරෙව්වත් ඔය විධියට බල්බ් ගහලා ගියේ නැහැ. ඒ නිසයි ගරු ඇමතිතුමාට මා කියන්නෙ පණත සකස් කරගෙන අප මෙතැනින් පිට වී ගියත්, පණතේ අඩුපාඩුකම් තිබුණත් සැහෙන තත්ත්වයකට මේවා ගෙන එන්න ඕනෑය කියල. නමුත් ක්‍රියාත්මක කිරීමේදී දොස් ඇති වෙනවා. මඩකලපුවේ ගරු මන්ත්‍රීතුමා විසින් සඳහන් කරන ලද ආයතනයත් මේකේ සාමාජිකයකු වන්නට යනවා. මෙවැනි ආයතනයක් ඒ භාණ්ඩ හොඳ බවට සහතික කළාලු. පැය 1,000ක් වැඩ කරන බවට සහතික කළාලු. නමුත් අප කථා කරන්නේ අත්දැකීම් අනුවයි. මේ භාණ්ඩවල තත්ත්වය සතුටු දායක නැහැ. මා මෙසේ කියන්නේ ද්වේෂසහගතව නොවෙයි. නමුත් මේ විධියේ ආයතනත් මේ ගැන ඔය ආකාරයට සහතික දීම නම් භයානක බව කියන්න ඕනෑ.

දැනට කර්මාන්ත සම්බන්ධයෙන් විශාල ජාවාරමක් යන බව සමහර විට ගරු ඇමතිතුමාත් දන්නවා ඇති. එවැනි ජාවාරමක් තිබෙන බව පිළිගන්න ඕනෑ. කෙසේ වුවත් තව දුරටත් ඒ ගැන සොයා බලනවා නම් හොඳයි. කර්මාන්ත වැඩි වන තරමට අප කවුරුනුත් කැමතියි. කාගේත් වුවමනාව කර්මාන්ත වැඩි කර ගැනීමයි. ඒ වගේම නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩවල තත්ත්වය ආරක්ෂා කර ගැනීම අවශ්‍යයි. යම් යම් භාණ්ඩ නිෂ්පාදනය කිරීම පිළිබඳව කටයුතු ක්‍රියාත්මක කිරීමේදී සමහර විට හිතුවක්කාර අන්දමට වැඩ කරන නිසා අර මා කී ආකාරයේ වගන්තියක් ඇති කළ යුතු බව නැවතත් මතක් කරන්නට සතුටුයි. එවැනි වගන්තියක් ඇති කිරීම නියම තත්ත්වයෙන් බඩු නිෂ්පාදනය කිරීමට ආධාරයක් වෙනවා. මුලදී සැම්පලයක් ඉදිරිපත් කොට පසුව ඊට වඩා බාල තත්ත්වයෙන් භාණ්ඩ නිෂ්පාදනය කිරීම වැළැක්වීමට නම් එවැනි වගන්තියක් තිබෙන්න ඕනෑ. එසේ නැත්නම් අර සැම්පලය නිකම් හොර ලාංඡනයක් බවට පත් වෙනවා. නරක අන්දමින් භාණ්ඩ නිෂ්පාදනය කිරීමට කාර්මිකයන් බිය වන්නේ ඒ විධියේ වගන්තියක් ඇති කළොත් පමණයි.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මාත් මේ ගැන වචනයක් දෙකක් කථා කරන්නට කැමතියි. විදුලි බුබුළු ගැන වැලිමඩ ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ කරුණු මාත් අනුමත කරනවා. හපුතලේ මන්ත්‍රීතුමා කොහොම කිව්වත් දැනට නිෂ්පාදනය වන විදුලි බුබුළු දවස් 10 කට, 15 කට වඩා පාවිච්චි කරන්නට බැහැ. ඒ වගේම ගමේ මිනිසුන්ට නිතරම වුවමනා වන ඉටිපන්දම්වල තත්ත්වයද දැන් බොහොම අසතුටුදායකයි. ඉස්සර පැය දෙක හමාරක් දැල්විය හැකි වූ ඉටිපන්දම දැන් පැයක් වත් දල්වන්නට බැහැ.

පසුගිය කාලයේදී සමූපකාර තොග වෙළෙඳ ආයතනය මඟින් දිනපතා ප්‍රයෝජනයට ගන්නා ආහාර ද්‍රව්‍ය ගෙන්වීම හා බෙදා හැරීම කරන ලද නමුත් එය ඉතාමත්ම අසතුටුදායක තත්ත්වයක පැවතුණා. ඒ වැඩේ හරියට කරන්න බැරි නම් මෙවැනි වැඩ හරියට කරන්නේ කොහොමද? කෙසේ වුවත් මේ වැඩ ගැන අප බොහොම සතුටුයි. ඉටිපන්දම්, විදුලි බුබුළු ආදිය නියම පිළිවෙළට සාදනවා නම් අප බොහොම සතුටුයි. ගම්බද ප්‍රදේශවලට ඉටිපන්දම් විශාල වශයෙන් වුවමනා වෙනවා. මගේ ගෙදරත් හදිසි වේලාවල දල්වන්නේ ඉටිපන්දම් තමයි. ඉටිපන්දම් මෙන්ම ලාම්පුවලට වුවමනා කරන "මෙන්ටල්ස්" ගම්බද ප්‍රදේශවලට අවශ්‍යයි. නමුත් දැන් මේ භාණ්ඩ නියම පිළිවෙළට ලැබෙන්නේ නැහැ. සියයට 70ක් තරම දෙනා මේවා පාවිච්චි කරතත් නියම තත්ත්වයෙන් මේවා නිෂ්පාදනය කර පාරිභෝගිකයන්ට දෙන්නට තවම පුළුවන් වී නැහැ. පෙරදී ගන්නා ලද මිළට වඩා වැඩි මිළක් ගෙවා දැන් මේවා ගත්තත් ඇත්තෙන්ම දැන් මේවායේ තත්ත්වය බැහැලා. කෙසේ වුවත් මේ පණත ඉදිරිපත් කිරීම ගැන අප සතුටුයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.]

හොංකොංවල නිෂ්පාදනය කරන රෙදි, ඔප දැමීම සඳහා නැත්නම් පොලිෂ් කිරීම සඳහා එංගලන්තයට යවන බව මා දන්නවා. දැනට ගම්බද ප්‍රදේශවල නිෂ්පාදනය කරන සරොම් හා වෙනත් රෙදි වර්ගද පොලිෂ් කිරීම සඳහා අලුත් මැෂින් ගෙනැවිත් තිබෙනවා. ඒ මැෂින් වලින් සුද්ධ වෙලා යන්නෙ ටිකයි. ඉස්සර සරමක් අවුරුද්දක් පාවිච්චි කළා නම් අද තමුන්නාන්සේලා නිෂ්පාදනය කර රටට දෙන සරමක් හය මාසයක්වත් අඳින්ට බැහැ. මේවයි පරීක්ෂා කරල "ස්ටෑන්ඩඩයිස්" කරන්ට ඕනෑ. මේ පනතෙන් ආරක්ෂාවක් ලබා දෙන්ට වැයම් කිරීම ගැන අපි සතුටුයි. එහෙත් මේ පනතෙන් ඒක කරන්ට බැහැ. මෙතෙක් කාලයක් වැරදි අල්ලන්ට දෙපාතමේන්තුව හැඩුව නිති ක්‍රියාවෙ යෙදුනෙ නැහැ. මේ පනතෙන් යෙදිය හැකිද? සුළු කර්මාන්තශාලාවලින් නිෂ්පාදනය කරන බඩු භාණ්ඩ ලංකාවේ සියයට 70 ක් පමණ පාවිච්චි කරනව. නිෂ්පාදකයන් හිතුවක්කාර අන්දමට ඔවුන්ට වුවමනා මිළට ඒවා විකුණනව. වටිනාකම මෙන් හතර ගුණයක් ගෙවා ඒවා මිළ දී ගන්ට මහජනයාට සිදු වී තිබෙනව. එහෙත් තමන් බලාපොරොත්තු වන කාලසීමාව ඒක පාවිච්චි කරන්ටත් බැහැ. ඔය තත්ත්වය ආරක්ෂා කරන මගකුයි ඕනෑ. ඔකෙනුයි, අද ජීවන අංකය නගින්නෙ. අවුරුද්දක් පාවිච්චි කරන්න හිතාගෙන සරම නැත්නම් රෙදි කෑල්ල ගන්නව; හය මාසයක්වත් අඳින්ට බැහැ, බාල අන්දමට නිෂ්පාදනය කරන නිසා. "ස්ටෑන්ඩඩයිස්" කරන විට ඒ තත්ත්වය වළක්වන්ට මගක් යෙදිය හැකියි.

මා පසුගිය කාලයේ දිනක් මේ ගරු සභාවෙදි කිව්ව, අපේ හැන්සාඩ් වාර්තාව අච්චු ගහන කඩදාසිය ගැන. විශේෂඥයන් දමා මේ කඩදාසි ගැන පරීක්ෂණයක් පවත්වන ලෙස මා ඒ අවස්ථාවේදී මතක් කළා. මේ සඳහා දැනට පාවිච්චි කරන කඩදාසිය වැඩි කලක් පවතින්නෙ නැහැ. බොහොම ඉක්මණින් මේ කඩදාසියට වේයො ඇදෙනව; කාවො ඇදෙනව. ඒක වළක්වන්ට වැඩ පිළිවෙළක් යොදන්ට කියා මා ඉල්ලුව. වේයන් හා කාවන් අනික් කඩදාසිවලට වඩා මේ කඩදාසියට ආසයි. සමහරවිට මේ කඩදාසියේ අමුතු රසක් ඇති. කඩදාසිය නියම අන්දමට ශුද්ධ කර නැතිකමක් හෝ අවශ්‍ය බෙහෙත් වර්ගයක් නොදමන කමක් හෝ ඇති. [බාධා කිරීමක්] පරීක්ෂණයක් කළාද? පරීක්ෂා කරන්ට ඇති. වාර්තා ලබාගන්ටත් ඇති. නමුත් සිදු වී තිබෙන දේවල් ගැනයි මා කියන්නෙ. පර්යේෂණ ඕනෑ තරම් කරයි. සම්පලය විතරක් පෙන්වයි. එහෙත් රටට දෙන එක වෙනස්.

**පී. බී. එම්. හේරත් මයා.**
*(திரு. டீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
බිම දමන්න ඕනෑ.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
බිම දමන්න ඕනෑ තෙත් ගතිය තිබෙනව නම්. මේ කාර්යාලවල තිබෙන දේවල් ආරක්ෂා කරන්නෙ කොහොමද? නුවර එළියට ගොස් බලන්න ලිපි ලේඛන තැන්පත් කර තිබෙන තැන සිදුවෙලා තිබෙන්නෙ මොකක්ද කියා. එකම තැනකවත් මේවා ආරක්ෂා කරන්ට මගක් යොදා නැහැ. පෙලක් කඩදාසිවලට සතුන්ගේ විශේෂ ආසාවක් තිබෙනවා.

පුළුන් ගස්වලට වැළඳෙන ලෙඩ රෝග ගැන තමුන්නාන්සෙල දන්නව. පුළුන් ගෙඩිය හොඳට වැඩිගෙන එන විට ඕකට පණුවො එනව. පණුවො කාල ගෙඩි නරක් වෙනව පමණක් නොවෙයි; ගහත් සම්පූර්ණයෙන් මැරිල යනව. ඒ පණුවන් මරන්ට තවත් සත්තු වර්ගයක් යොදා තිබෙනව, චීනය. පණුව එන විට තවත් සතෙක් දානව,; ඌව අල්ලන්න. පණුව ඉන් මත්තට හැදෙන්න නැහැ. පණුවන් අල්ලන්න දමන්නෙ ඊට වඩා කුඩා මැස්සන් වර්ගයක්. චීනයේ සංචාරය කරන විට මා හොඳට දැක්ක. මේ කොයි වැඩේ කළත්, පණත ගෙනාවත් නියම විධියට ක්‍රියාත්මක කරන්ට මග පාදගන්ට ඕනෑ.

**ගරු මෛත්‍රීපාල සේනානායක**
*(கௌரவ மைத்திரிபால சேனநாயக்க)*
(The Hon. Maithripala Senanayeke)
නියෝජ්‍ය සභාපතිතුමනි, මා කලින් කීපිදී, මම කියන්නෙ නැහැ අපේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කර්මාන්තවල අඩුපාඩු නැත කියා. විශේෂයෙන්ම අලුත් කරමාන්තයක් පටන් ගැනීමේදී නොයෙකුත් අඩුපාඩුකම් ඇති වෙනව. ඒ නිසා යම් ප්‍රමාණයක තත්ත්වයක් පාරිභෝගිකයාට ලබා දීමටයි මෙම ආඥාපණත ඉදිරිපත් කර තිබෙන්නෙ. වැලිමඩ ගරු මන්ත්‍රීතුමා (කේ. එම්. පී. රාජරත්න මයා.) සඳහන් කළා, දැනට ඉදිරිපත් කර ඇති මෙම පණතේ නීති රීති දඬුවම් දීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් නැත කියා. මම ඉතාමත් ඕනෑකමින් ඉල්ලනවා, මේ අවස්ථාවෙදි වෙනසක් නොකර මෙය සම්මත කිරීමට ඉඩ දෙන්නය කියා. විශේෂයෙන් 48 වෙනි වගන්තියෙ මෙසේ සඳහන්ව තිබෙනව :

"48. (1) The Minister may make regulations for the purpose of carrying out or giving effect to the principles and provisions of this Act and in respect of all matters for which regulations are authorized or required by this Act to be made."

එම නිසා යම් කිසි අඩුපාඩුවක් ඇති වූ අවස්ථාවකදී එම වගන්තිය අනුව ඒ අඩුපාඩු සකස් කිරීමට පුළුවන් වෙනවා ඇති. එසේ නැතිව තව දුරටත් යම් කිසි වෙනසක් කිරීමට සිදු වුවහොත් ඒ පිළිබඳ සංශෝධන මම මේ සභාවට ඉදිරිපත් කරන්නම්. දැනට අවුරුදු දෙකක පමණ සිට මෙම පණත නීති ගත කර ගැනීමට මම උත්සාහ ගන්නව. අයවැය ලේඛනයෙන්ද මේ සඳහා රුපියල් 2,71,000 ක් වෙන් කර තිබෙනව. විශෙෂයෙන්ම මෙම ආයතනය පිහිටුවීමට කල් ගත වන නිසා දැනට මේ සම්බන්ධයෙන් යම් සංශෝධනයක් යෝජනා නොකර මෙය අනුමත කරන හැටියට මම ඉල්ලනව. යම් අඩුපාඩුවක් ඇති වූ අවස්ථාවකදී ඒ පිළිබඳ සංශෝධන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට මම බලාපොරොත්තු වෙනව.

**වගන්තිය කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**19 වන වගන්තිය කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

**20 වන වගන්තියේ සිට 49 වන වගන්තිය තෙක් කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

**උපලේඛනය කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

**ප්‍රඥප්ති වගන්තිය සහ නාමය කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

**කෙටුම්පත් පණත, සංශෝධන රහිතව, වාර්තා කරන ලදී.**

**ගරු මෛත්‍රීපාල සේනානායක**
*(கௌரவ மைத்திரிபால சேனநாயக்க)*
(The Hon. Maithripala Senanayeke)

"කෙටුම්පත් පණත දැන් තුන් වන වර කියවිය යුතුය" යි මම යෝජනා කරනවා.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**කෙටුම්පත් පණත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.**

## මෝටර් වාහන (සංශෝධන) කෙටුම්පත් පණත

## MOTOR TRAFFIC (AMENDMENT) BILL

**දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.**

අ. භා. 4.56

**පී. ආර්. රත්නායක මයා.**
*(திரு. பீ. ஆர். ரத்னாயக்க)*
(Mr. P. R. Ratnayake)

නියෝජ්‍ය සභාපතිතුමනි, "මෝටර් වාහන (සංශෝධන) කෙටුම්පත් පණත දැන් දෙවන වර කියවිය යුතුය" යි මම යෝජනා කරනව.

මෙම සංශෝධනය පිළිබඳව විස්තර ස්වල්පයක් ඉදිරිපත් කිරීමට මම බලාපොරොත්තු වෙනව. මෙම කෙටුම්පත් පණතේ 2 වෙනි ඡේදයෙන් බලාපොරොත්තු වන්නේ මෙයයි. මෝටර් ප්‍රවාහණ ආඥා පණතේ 125 වන ඡේදය අනුව අපරාධ ආඥා පණත යටතේ ලියාපදිංචි අපරාධකරුවෙක් වශයෙන් තීරණය වුණු කෙනෙකුට දැනට වෙළඳ වාහන පැදවීම සඳහා රියැදුරු බල පත්‍රයක් නිකුත් කළ නොහැකියි. එසේ ලියාපදිංචි අපරාධකරුවෙකු වශයෙන් හංවඩු ගැසූ දිනවලට පසු ඔහුගේ චරිතය යහපත් වී තිබුණත්, දැනට තිබෙන නීතිය අනුව එවැනි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. ආර්. රත්නායක මයා.]

කෙනකුට බල පත්‍රයක් නිකුත් කිරීමට නොහැකි වීම නිසා පසුව චරිතය යහපත් වූ අයට විශාල කරදරයක් ඇතිවී තිබෙනව. මෙම සංශෝධනයෙන් අදහස් කෙරෙන්නේ ලියාපදිංචි අපරාධකරුවෙකු, පසුව හොඳ චරිතයකින් යුක්තව කාලය ගත කෙළේ නම්, පොලිස්පති තුමාගේ නිර්දේශය අනුව එවැනි අයෙකුට වෙළඳ වාහන පැදවීම සඳහා බල පත්‍රයක් නිකුත් කිරීමට මෝටර් ප්‍රවාහණ කොමසාරිස්තැනට බලය පැවරීමයි.

3 වෙනි ඡේදයෙන් සංශෝධනය කිරීමට අදහස් කරන්නේ මෝටර් ප්‍රවාහණ ආඥා පණතේ 164 වෙනි ඡේදයයි. මෙහි අදහස ලංකා ගමනාගමන මණ්ඩලයට බස් නවත්වන සහ ගාල් කරන ස්ථානයන් පෙන්වීම සඳහා සංඥා පුවරු සහ දැන්වීම් ඉදි කිරීමේ බලය ලංකා ගමනාගමන මණ්ඩලයට පැවරීමයි.

4 වෙනි ඡේදයෙන් බලාපොරොත්තු වන්නේ මෝටර් ප්‍රවාහන ආඥා පණතේ 185 වෙනි ඡේදය සංශෝධනය කිරීමටයි. ඒ අනුව ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථයක් එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට යාමේදී, ඒ ස්ථාන දෙක අතරේදී මඟීන් ගැනීමට හෝ බැස්සවීමට නවත් වන්නේ නැතිව කෙළින්ම ධාවනය කිරීමේ අවස්ථාවක් ලැබෙනව. දැනට තිබෙන නීතිය අනුව සෑම බස් රථයකටම කොන්දොස්තර කෙනෙක් සිටිය යුතුයි. මෙම සංශෝධනය නිසා බස් නැවතුම් පළකදී ටිකට් මිල දී ගන්නා මඟීන් බස් රථයට නංවා ගැනීමෙන් පසු නොනවත්වාම ධාවනය කරන සීඝ්‍රගාමී බස් රථයක් වශයෙන් කොන්දොස්තර කෙනෙකු නොමැතිව ධාවනය කිරීමට කටයුතු සැලැස්වීමයි.

5 වන ඡේදයෙන් මෝටර් ප්‍රවාහන ආඥා පණතේ 186 වන ඡේදය සංශෝධනය වෙනව. 186 වන ඡේදය අනුව සෑම මඟියකුටම ටිකට් පත බැගින් තිබිය යුතුයි. මෙම සංශෝධනය අනුව බස් රථයක් සම්පූර්ණයෙන්ම මඟීන්ගෙන් පිරී—වන්දනා කණ්ඩායමක් හෝ එවැනි වෙනත් කණ්ඩායමක්—ගමන් කරන විට ඔවුන් සඳහා කණ්ඩායමක් වශයෙන් එක් ටිකට් පතක් පමණක් නිකුත් කිරීමට බලය පැවරීමයි.

6 වන ඡේදයෙන් අදහස් කරන්නේ ලංකා ගමනාගමන මණ්ඩලය යන්නෙහි තේරුම විග්‍රහ කර දක්වීමයි.

7 වන ඡේදයෙන් අදහස් කරන්නේ මෙම සංශෝධන පණතින් මූලික පණතේ වන වෙනස්වීම් 1957 ඔක්තෝබර් මස 31 වන දින සිට බලපවත්වන ලෙස නීති ගත කිරීමයි.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

අ. භා. 5

**ඒ. එච්. මාකන්-මාකර් මයා.**

*(ஜனாப் ஏ. எச். மாக்கன் மாக்கர்)*

(Mr. A. H. Macan Markar)

With regard to the issue of driving licences, I should like to make a suggestion that there should be greater care exercised in the issue of driving licences to hiring car and taxi drivers. I have found that most of these taxi drivers have no regard for other users of the road. They very seldom or never observe the rules of the road. I would also suggest that, at some future date, an amendment to this Bill be brought—I do not say this should apply to driving licences already issued—requiring that all applicants for licences to drive taxis and hiring cars should have a clean record for at least 10 years.

Then, with regard to the other matter—allowing the driver himself to act as conductor in C. T. B. buses plying between two points with no intermediate halts—I believe it should be possible to introduce the system that is obtained in some of the cities in Canada and in other countries where the driver himself acts as conductor. There is a till-like device placed near the driving seat and the passenger drops his money into it so that the other passengers are able to see what is done, and then any balance due is paid. Those are manipulated by the driver from his seat, and one man is able to do the work of both the driver and the

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

conductor. I suppose the principal of allowing the bus driver to act as conductor could be extended to all buses, whether plying between two points nonstop, or otherwise. I would request the hon. Parliamentary Secretary to kindly give due consideration to these suggestions.

අ. භා. 5.3

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

නියෝජ්‍ය සභාපතිතුමනි, බස් ධාවනය සම්බන්ධයෙන් මෙහි සඳහන් වුණා. බස් නැවතුම් පොලවල් ගැනත් මට වචනයක් කියන්න තිබෙනවා. බස් නවත්වන බොහෝ ස්ථානවල ආවරණ ඇත්තේ නැහැ. බස් මඟීන්ගේ පහසුව සඳහා සෑම බස් නැවතුම්පොලවලම ආවරණ ඇති කිරීමට ලංකා ගමනාගමන මණ්ඩලයට අපහසු ද? මඟියෙක් වැස්ස නිසා අල්ලපු කඩේට ගිහින් සිටියොත් සමහර විට බස් එකට නැඟ ගන්න බැරි වෙනවා. කඩේ තිබෙන්නේ බස් නැවතුම් පොළේ සිට යාර 20ක් පමණ ඈතින් නම් බස් එකක් එන විට එතැන සිට දුව එන්න අමාරුයි. ඒ නිසා වැස්සට නොතෙමී මඟීන්ට බස් එකට නැඟ ගන්න අමාරු වෙනවා. ඒ නිසා සෑම බස්නැවතුම්පොලකම ආවරණ ඇති කරන්න යයි අපි කියා සිටිනවා. එසේ කරන්න බැරි නම් මඟියෙක් අත ඉස්සුවාම බස් එක නවත්වන්න ඕන. දැන් තිබෙන පිළිවෙලට එය කරන්න බොහොම අමාරුයි. ඒ නිසයි, ආවරණ ඇති කරන්න යයි අපි ඉල්ලන්නෙ. එසේ ආවරණ සෑදුවේ නැති නම් මඟීන් තෙමී අවුත් බස් එකට නඟිනවා. ඔවුන්ගේ තෙමුනු බඩුමුට්ටුත් බස් එකේ තබා ගන්නවා. මේ නිසා බස් එක ඉක්මනටම නරක් වෙනවා. එසේ නරක් වන බස් සුද්ධ කිරීමටත්, හරිගැස්සීමටත් යන වියදම, මම හිතනවා, ආවරණ සෑදීමට යන වියදමට වඩා වැඩි වෙන්න පුළුවනි. ඒ නිසා සෑම බස් නැවතුම්පොළකම ආවරණ තනන්නයයි මම ඉල්ලා සිටිනවා.

දැන් බස් ගමනාගමනයට බොහොම අවහිරකම් තිබෙනවා. ලංගමයේ සේවයේ යෙදී සිටින සියලුම සේවකයන්ට නොයෙකුත් අවහිරකම් තිබෙනවා. විශේෂයෙන්ම ඉංජිනේරු අංශයේ කරදර තිබෙනවා. අද වේරහැර මොකක්ද වෙන්නෙ? එක පුද්ගලයකුගේ වැරදි නිසා තුන් හාර දහසකගේ වැඩ නවත්වන්න සිද්ධ වී තිබෙනවා. එහි සේවය කරන කම්කරුවන්ගේ සංවිධාන මඟින් යම් තීරණ ගෙන කටයුතු කරනවා යයි පසු ගිය දිනවල කොපමණ කෑ ගැහුවත් අද එසේ කෙරෙන්නෙ නැහැ. මේ ක්‍රමය අනුව ඒවා කරන්න බැහැ. ඒක පැහැදිලිවම පෙනෙනවා, වේරහැරට ගියාම. අද වේරහැර වැඩ අඩපණ වෙලා, විශේෂයෙන් ම ඉහළ සිටින නිලධාරියාගේ වරද නිසා. තමුන්නාන්සේලා සූදානම් නැහැ, වෘත්තීය සමිති සමඟ සාකච්ඡා කොට ඇතැම් දේ බේරුම් කර ගැනීමට. තවම මේ ආණ්ඩුවට ඒ ප්‍රතිපත්තිය නැහැ. ඒක පැහැදිලියි. වෙලෝනා වැඩ පොළේ මාස කිහිපයක සිට ස්ට්‍රයික් එකක් තියෙනව. එක සැරයක් සාමදානයක් ඇති කරගෙන ගිවිසුමකුත් ඇති කර ගත්ත. ඊට පසුවදා වැඩපොළ අයිතිකාරයා ඒ ගිවිසුමට පයින් ගැහුව. පෞද්ගලික හිමියන් ගෙන යන ඒ ප්‍රතිපත්තියමයි, රජයේ ආයතනවලත් ගෙන යන්නෙ. කොපමණ කෑගැහුවත් අර පරණ පුරුදු වැඩ පිළිවෙළෙන් කිසිම දෙයක් වෙනස් වෙලා නැහැ. රස්කින් ප්‍රනාන්දු කම්කරුවන්ට පයින් ගහපු හැටි තමුන්නාන්සෙ දන්නව. කම්කරුවන් හාරපන්සියයක් දැන් එළියෙ ඉන්නව. සමහර අයව එළියට දාල අළුත් අය වැඩපොළට ගන්නව. ගිරිදර මෝලෙ සිදු වුනෙත් එහෙමයි. දැන් 18 දෙනෙක් පිට කරල තියෙනව. ඒ නිසා තමුන්නාන්සෙලා කවදාවත් මෙය කරාවිය කියා අපි හිතන්නෙ නැහැ. කම්කරුවන් දහස් ගණන් වැඩ කරන ස්ථානවලත්, දහ දෙනෙක් වැඩ කරන ස්ථානවලත්, කම්කරුවාගේ අයිතිවාසිකම රැකෙන පිළිවෙළට මේ රටේ නියම සංවර්ධන වැඩ පිළිවෙළක් යොදන්න බැහැ, ඉහළින් ම තීරණ ගන්න නිසා. අද තිබෙන ගමනාගමන සේවයෙන් එය පැහැදිලි වෙනව. වරායේ තත්ත්වයත් එහෙමමයි. බොහොම නදින් වැඩ කර ගෙන යනවය කියා ඒ දවස්වල කීව. නැව් 18 ක් 20 ක් "කිව්" එකේ තිබුනය, පටස් ගාල "ක්ලියර්" කළාය කිව්ව. මාස දෙකයි, ඒ රස්නය තිබුණේ. දැන් තමුන්නාන්සෙලා නැවතත් මඬේ එරිලා. තවම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.]

හරියට එරුණේ නැහැ. ඒවා වහ ගන්න තමයි, මේ විධියෙ පණත් ගෙනෙන්නෙ. මේ පණත්වලට අපි බොහොම සතුටුයි; නමුත් තමුන්නාන්සෙලට මේවා කරන්න බැහැ. ගමනාගමනය සම්බන්ධයෙන් ඒ ආවරණය කිරීමේ වැඩ පිළිවෙළ ඇති කරන ලෙස මම ඉල්ලනව.

මේ ගරු සභාවේ කීප වතාවක්ම මා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්නයක් තියෙනව. දැනට බස් ධාවනය කරන පාර වල පුද්ගලයන්ට අයිති වෙනත් වාහන ධාවනය කරනව. මඟීන් ගෙන යාමට. වෑන් ධාවනය කරනව. පසුගිය දිනවල මේ ගැන ඇමතිතුමා සමග කථා කළාම දැනට පුද්ගලයන්ට දීල තියෙන බලපත්‍ර අවලංගු කර ගමනාගමන මණ්ඩලයේ බස් ධාව නය කරනවය කීව; නමුත් ඒක කරන් නෙ නැහැ. හෙට කරනවාය, අනිද්දා කරන වය, ඉන් අනිද්දා කරනවය කියා පොරොන්දු වෙනව; නමුත් කරන්න බැහැ. මොකද නොකරන්නෙ? කඩුවෙල වෑන් 22 ක් තියෙනව. ගරු ඇමතිතුමා ඒ ගැන දන්නව. ලබන සුමානෙ ඒක කරනවය, වෑන් 22 ම ගන්න බැරි වුණොත් 10 ක්වත් අරගෙන ගමනාගමන මණ්ඩල යට පාර භාර දෙනවය, කීව. නමුත් අද වන තෙක් ඒක කෙරුණෙ නැහැ. එසේ කරන්න බැරි නම් පොරොන්දු වීම වැර දියි. කරන්න පුළුවන් දේ පමණක් කියන්න. එතකොට කරන්න පුළුවන් මෙපමණය කියා දැන ගන්න පුළුවන්.

අද යාපනේ වර්ජනයක් තියෙනව; වේරහැර වර්ජනයක් තියෙනව. නුවරඑළි යෙ දෙන්නෙක් ගහගෙන තුවාල කර ගත්ත. ඒ දෙන්නට මොනවත් කළේ නැහැ. පස්සෙ බැණගත්ත අයගෙ වැඩ තහනම් කළා. පසුගිය දිනවල පැලියගොඩ සිද්ධිය ගැන කරුණු ඉදිරිපත් කළා. 9 දෙනකුට ගමනාගමන අංශයේ රක්ෂාව දීල නැහැ, කෝලාහලයක් ඇති වුණාය කියා. ගරු ඇමතිතුමාට කරුණු ඉදිරිපත් කළාම වහම රක්ෂාව දෙනවය කීව. තවම රක්ෂාව දීල නැහැ. 1958 දී පැටලිල්ලකට සහභාගි වූ නිසා 9 දෙනකු ගමනාගමන අංශයෙන් අස් කළා. මේවා ගැන පරීක්ෂා කර වහම පියවරක් ගන්න ලෙස ඉල්ලා සිටිනව. පණත් ඉදිරිපත් කළාට මදි. වැඩ කරන සේවකයට තමන්ගෙම සතුටින් වැඩක් කරන හැටියට හැඟීමක් ඇති වන පිළිවෙළට වැඩ පිළිවෙළ සකස් කරන්න ඕනෑ. මගේ හිතේ පාර්ලිමේන්තු ලේකම් තුමා දන්නවා ඇති. එතුමා සමහර වෙලා වට මා සමග කියනවා කරන්න බැරිය කියල. ඇයි බැරි? කරන්න පුළුවන් ඒවා කරන්න. ඊයේ න්‍යාය පත්‍රයේ තිබුණා පෞද්ගලික මන්ත්‍රී කෙනෙකුගෙ යෝජනා වක් හැටියට—මේ පැත්තෙ කෙනෙකුගෙ යෝජනාවක්—රජයේ සේවකයින්ට දේශ පාලන අයිතිවාසිකම් දෙන්නය කියා. ඒක දෙන්න බැරි ඇයි? සී. ටී. බී. එකේ දෙන්න බැරිලු; වරායේ දෙන්න බැරිලු. ඇයි ඒ අයට දෙන්න බැරි? ඒවාගෙ කම්කරුවන්ට, ඩ්‍රයිවර්ලාට, කොන්දොස් තරවරුන්ට, එහෙම නැත්නම් වෙනත් සේවාවන් කරන අයට දේශපාලන අයි තිය දෙන්න බැරි ඇයි? අතින් යනවද, මිටින් යනවද? වරායෙ කම්කරුවන්ට, රේල්වේ වැඩ කරන කම්කරුවන්ට දේශ පාලන අයිතිය දෙන්න බැරි ඇයි? එයින් පෙනෙන්නෙ වැඩ කරන ජනතාවට බලය දෙන්නෙ නැත කියන එකයි. කම්කරු වන්ට අපි බලය දෙන්නෙ නැහැ කියන එකයි කියන්නෙ. මුදල් වියදම් වන එක කුත් නොවන නිසා එහෙනම් කියන්නෙ දෙන්නෙ නැත කියන එකයි. වරායෙ කම් කරුවන්, සී. ටී. බී. එකේ කම්කරුවන්, රේල්වේ කම්කරුවන්, දේශපාලන අයි තිය ඉල්ලුව. සී. සී. එස්. කාරයින් වැනි උසස් නිලධාරීන්ට දෙන්න කියා අපි කියන්නෙ නැහැ. නමුත් ගුරුවරුන්, කම් කරුවන්, වැනි අයට දෙන්න බැරි ඇයි? සී. ටී. බී. අංශය පිළිබඳව අතුරු පණතක් ඉදිරිපත් කළ නිසයි මේවා කියන්නෙ. ගමනාගමන අංශයේ අද 22,000 ක් පමණ සිටිනව.

**පී. ආර්. රත්නායක මයා.**
*(திரு. பீ. ஆர். ரத்நாயக்க)*
(Mr. P. R. Ratnayake)

28,000 ක් පමණ සිටිනව.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

ඒ 28,000 ට ලංකාවේ පාලනය සම්බන් ධව අත ගහන්න බැරිද? ඡන්දය දෙන්න පමණක්ද පුළුවන්? දේශපාලන කටයුත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තකට කෙලින්ම බැස කටයුතු කරන්න ඒ අයට තහනම් කරල. සී. ටී. බී. එකේ 28,000 යි, වරායෙ 18,000 යි. රේල්වෙත් ඉන්නව. මේ විධියට මුකවාඩම් බැඳපු අය රජයේ සේවයේ කී දෙනෙක් සිටිනවද ? පත්තර අරගෙන තව දුරටත් මුකවාඩම් බඳින්න හදනව. රජය ගමන් කරන ආකාරය එයින්ම පෙනෙනව. සී. ටී. බී. එකේ පඩි සම්බන්ධ ප්‍රශ්නයක් ඉදිරිපත් කළාම, ස්ට්‍රයික් එකක් සම්බන්ධ ප්‍රශ්නයක් වුණාම, මොකවත් කරන්නෙ නැහැ. එතන උසස් අය යම් කොම්පැනියක් සමග සම්බන්ධව වරදක් කළත් ඒ ගැන සොයන්නෙත් නැහැ.

දැන් බටහිර ජර්මනියෙන් බෙන්ස් බස් ගෙන්වන්න යනවලු. ඊට මාස දෙකකට පමණ කලින් ඉතාලියෙන් fියට් බස් ගෙන්වනවාය කියා තිබුණ. ඒක දැන් ජර්මනියෙන් වෙලා. මේ අන්දමට ඔය අදහස් විටින් විට මාරු වන්නෙ ඇයි කියා මා දන්නෙ නැහැ. දැන් මහ කොන්ත්‍රාත් එක බටහිර ජර්මනියෙන් බෙන්ස් බස් ගෙන්වන්න. ඊට කලින් අදහස තිබුණා ඉතාලියෙන් fියට් බස් ගෙන්වන්න. ඊටත් කලින් වෙනත් ඇමතිවරයෙක් සිටියදී අදහස තිබුණේ වෙන එකක්. එතකොට බටහිර ජර්මනියෙන් බෙන්ස් ඕනැ; එංගලන්තයෙන් ඕනැ ඒකට වෙන ටයර්; ඒකට වුවමනා කරන වෙන පාර්ට්ස් ආදිය ඉතාලියෙන්, සංවිධානය යන්නෙ ඔය විධියටයි. එක තැනකින් ගන්නට ලැහැස්ති වන්නෙ නැත්තෙ ඇයි ?

යම් යම් සිද්ධීන් ඇති වුණාම ඉදිරියට මට දොස් කියන්න එපා. මා මේවා ගැන බොහොම පරීක්ෂාවෙන් සොයන කෙනෙක්. මා සෙවූ ඒවා වැරදුණේ නැහැ. වැරදි කෙරෙනවා නම් අල්ලා දී තිබෙනව. එම නිසා බොහොම පරිස්සමෙන් කටයුතු කරන්න. රටේ සංවර්ධනය පිණිසයි, රටේ ජනතාවට නියම තැන දීම පිණිසයි, නියම පහසුකම්දීම පිණිසයි, මේ සියළුදේ්ම යොදවන්නෙ. ඒවා ක්‍රියාවේ යෙදීමේදී ඉතා පරීක්ෂාවෙන් වැඩ ගෙන යන්න ඕනැ. ඒවා ගැන පරීක්ෂා කරන්න කීවාම පුළුවන් තරම් ඒවා වහන්න උත්සාහ ගන්නව. මේ ගැනත් වචනයක් දෙකක් මේ අවස්ථාවෙදි මට කථා කරන්න ලැබුණු එකත් හොඳයි. මම විශෙෂයෙන් ඉල්ලා සිටිනවා, මේ අංශයේ සේවය කරන උදවියගේ—කම්කරු පිරිසගේ—අයිතිවාසිකම් ආරක්ෂා කර දෙන ලෙස. කම්කරු පිරිස සමග ඒ අයගේ වැඩ කටයුතු සඳහා, වෘත්තීය අයිතිවාසිකම් සඳහා හුඟක් දුරට සම්බන්ධව කටයුතු කරන පුද්ගලයකු වශයෙනුයි මම එසේ ඉල්ලා සිටින්නෙ. මොකද ? ඔතැන ඉන්න නායකයා—මුදල් ඇමතිතුමා—සම්බන්ධ වෙලා පසුගිය දවස්වලදි කම්කරුවන්ගෙ ඉල්ලීම් විසි එකක් ඉදිරිපත් කළා. අද ඒක කුණු බාල්දියට දාලා. මේ රටේ කම්කරු ජනතාව ඉදිරිපත් කරන ලද ඉල්ලීම් 21 අද ඒ ඇමතිතුමා කුණු බාල්දියට දාල. මාස ගණනක් වෙනව, කට ඇරල ඒ ගැන කිසිම දෙයක් කීවෙ නැහැ. සී. ටී. බී. අංශයේ ඉන්න කම්කරුවනුත් ඊට සම්බන්ධයි.

**කාරකසභා නියෝජ්‍ය සභාපති**
*(குழுக்களின் பிரதி அக்கிராசனர்)*
(Mr. Deputy Chairman of Committees)
Order, please. Come to the Bill please.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
Yes, Sir. This is very important on this partcular matter.

**කාරකසභා නියෝජ්‍ය සභාපති**
*(குழுக்களின் பிரதி அக்கிராசனர்)*
(Mr. Deputy-Chairman of Committees)
But you should confine yourself to the matters relating to the Bill.

**විවියන් ගුණවර්ධන මිය.**
*(திருமதி விவியன் குணவர்தன)*
(Mrs. Vivienne Goonewardene)
He is not talking on the Bill.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
Perhaps irrelevancies do creep in at certain times. I shall try not to be irrelevant.

**විවියන් ගුණවර්ධන මිය.**
*(திருமதி விவியன் குணவர்தன)*
(Mrs. Vivienne Goonewardene)
ඒ මන්ත්‍රීවරයා හැම අවස්ථාවෙම ප්‍රශ්නයට අදාළව නොවෙයි කථා කරන්නෙ.


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

But, unfortunately, you are ignoring relevant subjects which have been brought to your notice.

**විවියන් ගුණවර්ධන මිය.**
*(திருமதி விவியன் குணவர்தன)*
(Mrs. Vivienne Goonewardene)

They will be attended to in due course. Then you will understand.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

" In due course ! In due course ! "

**විවියන් ගුණවර්ධන මිය.**
*(திருமதி விவியன் குணவர்தன)*
(Mrs. Vivienne Goonewardene)

At that time at least understanding will dawn on you. It does not come now.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

We do understand many a thing. But the unfortunate thing is that when you are in positions of power, you do not seem to realize those things. You forget those things.

**විවියන් ගුණවර්ධන මිය.**
*(திருமதி விவியன் குணவர்தன)*
(Mrs. Vivienne Goonewardene)

Only you must be in that position and only you and your brother can carry them on.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

Oh ! Do not think about me and my brother or your other uncle, but do what is best to be done. Our grouse is that you are not doing those things. Unfortunately, you seem to have forgotten those things. the very things you said just a few days ago. You went across and came. Your husband was here.

**විවියන් ගුණවර්ධන මිය.**
*(திருமதி விவியன் குணவர்தன)*
(Mrs. Vivienne Goonewardene)

Unfortunately, you were only looking into horoscopes.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

I think if I did believe in horoscopes, I would not be like this. The unfortunate thing is you too believed in horoscopes, and you two were brought together because of your horoscopes.

**කාරක සභා නියෝජ්‍ය සභාපති**
*(குழுக்களின் பிரதி அக்கிராசனர்)*
(Mr. Deputy-Chairman of Committees)

Order, please ! Come on to the Bill.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

Sir, I do not want to discuss this matter again.

**විවියන් ගුණවර්ධන මිය.**
*(திருமதி விவியன் குணவர்தன)*
(Mrs. Vivienne Goonewardene)

I agree. I am duly grateful to you for that.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

Probably her stay in different countries during the last few weeks must have upset her a little because her husband was here.

මම විශෙෂයෙන් මේවා ගැන සඳහන් කළේ මුදල් ඇමතිතුමා මේවා ගැන පරීක්ෂා කර බැලිය යුතු නිසයි. මුදල් ඇමතිතුමා සභාවෙ නැති නිසා එතුමාට මේ කාරණා දන්වන්නටය කියා මම ඉල්ලා සිටිනව. එසේ ඉල්ලා සිටිමින් ඉක්මනින් මේ ප්‍රශ්න විසඳීමට කටයුතු කරන ලෙස මතක් කරනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 5.21

**එම්. සිවසිතම්පරම් මයා. (උඩුප්පිඩ්ඩි)**

*(திரு. எம். சிவசிதம்பரம்—உடுப்பிட்டி)*

(Mr. M. Sivasithamparam—Uduppiddi)

I have one or two suggestions to make. As our law stands today, compulsory insurance under the Ordinance is confined to third party insurance alone.

Drivers of cars are only covered by third party insurance, and when they are injured, either in the course of an accident or otherwise, they are unable to get any compensation from the insurance company. And if the owner of the car is not in a position to pay, these unfortunate drivers are unable to get any form of compensation. I think it is a matter for the Hon. Minister of Communications to consider whether he should not extend compulsory insurance to cover the driver of a car even when he is not the owner of the car, particularly in the case of taxi driver.

We are aware that during the past few months a number of taxi drivers have been murdered for the purpose of theft of the taxi, or otherwise victimized, and their families are unable to get anything from either the owner or the insurance company because compulsory third party insurance does not cover the driver of a car when he is not the owner of the car.

Secondly, there is an alarming rise in the accident rate in our country, and one finds that a large number of these accidents are due to the fact that the people at the wheel are under the influence of liquor. I am not saying this of the paid drivers. I think generally it is gentlemen drivers who commit these faults: they go to the club in the evening and have probably one too many. Generally it is they who meet with accidents. The law relating to driving whilst under the influence of liquor should certainly be made more stringent. In countries like the Soviet Union, if a man is found to be smelling of liquor while driving, immediately his licence is cancelled. I think it is a very desirable step that our Government should take.

We all know what happened at Buller's Road the other day. A very good gentleman, a staff officer, I believe, in some big department was involved in an accident. I do not want to give the details because the matter is *sub-judice*. Two unfortunate people were coming in another car, and one of them was killed. The law relating to driving while under the influence of liquor should be made more stringent. It is an absolute necessity.

I wish to join with the hon. Member for Kottawa in asking that shelters be provided, if not at all bus halting places, at least at the central places because more and more people are now travelling by bus. Some sort of shelter should be provided for the passengers who use the buses.

අ. භා. 5.24

**විලියම් ප්‍රනාන්දු මයා.**

*(திரு. வில்லியம் பெர்னாண்டோ)*

(Mr. William Fernando)

බස් සේවය පිළිබඳව කථා කිරීමට මේ අවස්ථාවේදී ඉඩ ලැබීම ගැන මා සන්තෝෂ වෙනව. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නුවරඑළිය ශීතාධික ප්‍රදේශයක් පමණක් නොවෙයි, නිතරම වර්ෂාවත් තිබෙන ප්‍රදේශයක්. ඒ වාගේම නුවරඑළිය සැඩ සුළං හමන ප්‍රදේශයක්. එවැනි ප්‍රදේශයක වෙසෙන ජනතාවට යටත්පිරිසෙයින් ආවරණ සහිත නැවතුම් ශාලා සකස් කර තබන්නේ නම් ඒක ඉතාමත් වැදගත් දෙයක් බව මා මේ අවස්ථාවේ දී මතක් කර සිටිනව. නුවරඑළිය නගරයේ පාසැල් ශිෂ්‍යශිෂ්‍යාවන් සඳහාත් එවැනිම නැවතුම් ශාලා පිහිටුවා දිය යුතුයි. බස්වලට මගීන් ගන්න සමහර ස්ථානවල කිසිම ආවරණයක් නැති අතර බොහෝ දෙනා ගස් යට දුකසේ තෙමී තෙමී සිටින බව අපට පෙනෙනව. අපේ ප්‍රදේශවල තිබෙන මේ අඩුපාඩුකම් ගැන මා කීප විටක්ම ඒ ප්‍රදේශයේ සම්බන්ධ කරන කාරක සභා රැස්වීම්වලදී කියා තිබෙනවා. නමුත් මේ තාක් ඒ සම්බන්ධයෙන් කිසිම පිළිසරණක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විලියම් ප්‍රනාන්දු මයා.]

ලැබී නැහැ. මා විශේෂයෙන්ම මේ නව ප්‍රවාහණ ඇමතිතුමාට ස්තුති කරනව. පළමුවරට ලබන 17 වැනිදා නුවරඑළිය නගරයේ සීමාව තුළ බස් සේවයක් එතුමා විවෘත කරන්නට යනව. ඇත්ත වශයෙන්ම අප ඉල්ලීම් රාශියක් ඉදිරිපත් කර තිබුණා. ඒ ඉල්ලීම් ගැන ගරු ඇමතිවරුන් පිළිවෙලින් කටයුතු කර තිබෙනව. නව ප්‍රවාහණ ඇමතිතුමාත් ලබන 17 වැනිදා නුවරඑළිය නගර සභා සීමාව තුළ පළමුවරට බස් සේවයක් ආරම්භ කරන්න යනව. ඒ ජනතාව වෙනුවෙන් අනුකම්පා කර දැනට කුඩා බස් රථ කීපයක් දීම ගැන මා විශේෂයෙන්ම ගරු ඇමතිතුමාටත් ලංගමයටත් ස්තුති කරනව.

ඒ සමගම මතක් කළ යුතු විශේෂ කාරණයක් තමයි, මගීන්ට ආවරණ ස්ථාන ඇතිකර දීම. අනික් ප්‍රදේශවලට වඩා ඉක්මනින් ඒ ප්‍රදේශයේ ආවරණ සථාන ඇති කළ යුතු බව ගරු ඇමතිතුමාටම ලබන 17 වැනිදා අවබෝධ වේවි.

මට තවත් කාරණයක් කියන්නට තිබෙනව. නානුඔයත් නුවරඑළියත් ඉස්සර සම්බන්ධවී තිබුණෙ කුඩා දුම්රිය මාර්ගයකින්. ඒ දුම්රිය ඉවත් කළාට පසු දැන් සම්පූර්ණයෙන්ම දුම්රියෙත් බස් රියෙත් සම්බන්ධය ඇතිවයි එහි ගමනාගමනය කළ යුතුව තිබෙන්නෙ. පාන්දර 3.45 ටයි මෙහෙන් යන මේල් දුම්රිය නානුඔයට යන්නෙ. ඒ වෙලාවට මගීන්ට දුම්රියෙන් බැස බස්රිය එනතුරු විවෘත ස්ථානයක බොහෝ වේලාවක් ගත කරන්නට සිද්ධ වී තිබෙනව. එවැනි අවස්ථාවලදී සමහර විට බස් රියැදුරු මහතුන් නියම වෙලාවට බස් රිය ගෙනෙන්නෙ නැහැ. ඒ නිසා අර මගීන්ට තද වර්ෂාවේ පින්නෙ, සීතලේ එළිමහනෙ සිටින්න සිද්ධ වී තිබෙනවා. දැනට ඒ දුම්රිය පොළේ අලුත් ගොඩනැගිලි පිළියෙල කරගෙන යනව. ඒ අතරම බස් සේවයත් ඒකට සම්බන්ධ නිසා බස් මගීන් සඳහාත් ආවරණ ස්ථාන ඇති කර දෙන්න ඕනැ. නානුඔය දුම්රිය පැමිණෙනවාත් සමගම ඒ දුම්රියට බස් රියත් සම්බන්ධ වී තිබෙනවා නම් මගීන්ට ඉතාමත් පහසුයි. අද බොහෝ විට සිද්ධ වෙන්නෙ දුම්රිය පැමිණ පැය කාලක් භාගයක් ගතවුණාට පසුව බස් රථය පැමිණීමයි. ඒ නිසා අසරණ දුප්පත් ජනතාවට තෙමි තෙමී ඉන්න සිද්ධ වී තිබෙනව. පුළුවන් අය නම් පෞද්ගලික කුලී කාර් අරගෙන ගමන් කරනව. ඒ නිසා කාල සටහන් සකස් කිරීමේදී ඒ ගැන විශේෂයෙන්ම සළකා බැලිය යුතුයි.

මට තවත් කාරණයක් මතක් කරන්ට තිබෙනව. නුවරඑළිය නගරයේ සිට ටොප් පාස් ස්ථානයට ඇති දුර ප්‍රමාණය ඉතාම කෙටියි. සැතපුම් 1½ ක් පමණ තිබෙනව. නමුත් ඒ කෙටි දුර ප්‍රමාණය සඳහා ශත 25 ක් අය කරනව. මේක අසාධාරණයි. නොයෙක් වර මේ සම්බන්ධයෙන් පැමිණිලි කර තිබෙනව. නුවරඑළිය නගර සභා සීමාව තුළම තිබෙන මේ ස්ථානයට ගමන් කරන මගීන්ගෙන් ශත 25 ක් අය කරනව. මේක පෞද්ගලික සමාගම් තිබුණු කාලයෙ අය කළ ගණනක්. ලංගමයත් ඒ ගණනම අනුමත කළා. ඒක අසාධාරණයි. ඒ ජනතාවගේ සුභසිද්ධිය සඳහා මේ ගාස්තුව වෙනස් කරනවා නම් ඒ ජනතාව කෘතඥ වෙනවා ඇති. දැන් එම ස්ථානයට අළුත් කර්මාන්ත ශාලා කීපයකුත් එනව. දින පතා මගීන් 300 ක් විතර එම ස්ථානයට ළඟා වෙන බව පේනව. එම නිසා එතැන දක්වා ගමන් ගාස්තුව ශත 10 තෙක් අඩු කරනව නම් එමගින් විශාල ප්‍රයෝජනයක් සැලසෙනව.

කොත්මලේ ගරු මන්ත්‍රීතුමා (ජේ. ඩී. වීරසේකර මයා.) දැන් මෙතන නැහැ. එතුමා නැති නිසා එතුමගෙ කොට්ඨාශයට බලපාන කාරණයක් ගැන මා දැන් මතක් කරනව. නුවරඑළියෙ තේ වැවිලි සංස්ථාව කරා වැඩිපුර කම්කරුවන් එන්නෙ එතුමගෙ ආසනයෙ පලාගොල්ල ප්‍රදේශයෙ සිටයි. එම ප්‍රදේශයෙ සිට ඔවුන් සැතපුම් 8 ක් පමණ මග ගෙවා එන්න ඕනැ. ඔවුන්ට දිනකට රුපියල් දෙකකුත් ශත පණස් ගණනක් වේතනය වශයෙන් ලැබෙනව. අර දුර ප්‍රමාණය එන්න බස් එකට ශත 55 ක් ගෙවන්න සිදු වෙනව. එම බස් ගාස්තුව වැඩි බව කියන්න සිදු වී තිබෙනව.

අද දවසෙ විශාල කම්කරු පිරිසක් පලාගොල්ලෙ සිට "ටොප් පාස්" කරා ගමන් කරන බව පේනව. රම්බඩ සිට පැමිණෙන බස් සම්පූර්ණයෙන්ම පිරී ගොස් තිබුණොත් අතර මගදී එම බස්වලින් ගමන් කරන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බලා සිටින මගීන්ට ලොකු හිරිහැරයකට මුහුණ පාන්න සිදු වෙනව. එම නිසා වැඩි පුර බස් සේවාවක් පලාගොල්ලේ සිට "ටොප් පාස්" දක්වා ගමන් කරවන ලෙස මා ඉල්ලා සිටිනව. එසේ කළාම කම්කරුවන්ට විශාල යහපතක් සැලසෙනව ඇති.

මාගස්තොට හන්දිය කරා යන බස් සේවාව සම්බන්ධයෙනුත් කියන්න තියෙන්නෙ මේ අන්දමටමයි. එතැනටත් බස් ගාස්තුව වශයෙන් වැඩි මිළක් අය කරනව. පෞද්ගලික බස් රථ දුවද්දී ඒ අය අනුගමනය කළ වැඩ පිළිවෙලම ලංගම යත් අනුගමනය කරන බවයි. එයින් පෙනෙන්නෙ. නැවත වරක් එම තැන්වල තත්ත්වය ගැන පරීක්ෂා කර බලා ගමන් ගාස්තු පිළිබඳ සහනයක් ඇති කරන්න ඕනෑ.

ගරු ඇමතිතුමා ඇතුළු ලංගමයෙ සියලු දෙනාට නුවරඑළි ජනතාව වෙනුවෙන් මා මෙම අවස්ථාවේදී ස්තුති කරනව. විශේෂයෙන් ලබන 17 වන දින එම අසරණ ජනතාවගෙ ගමන් පහසුව සඳහා නව පියවරක් ගන්ට යාම නිසා. නාගරික බස් සේවා අංශයෙන් විශාල සේවයක් මින් පසුව සිදු වෙනව ඇති.

ගමනාගමන අංශයෙන් එම ප්‍රදේශයෙ ජනතාව කරන විශාල ඉල්ලීමක් තියෙනව. නුවරඑළියෙ සිට ගල්ඔය ජනපදය කරා ගොස් පදිංචි වී සිටින අයගෙ සංඛ්‍යාව විශාලයි. ගල්ඔය සිට බදුල්ල දක්වා දුවවන ශීඝ්‍රගාමී බස් සේවය නුවරඑළිය දක්වා දීර්ඝ කරන ලෙස එම ප්‍රදේශයෙ ජනතාව ඉල්ලා සිටිනව, මේ සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාගෙ අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනව.

කාලවේලා මදිකම නිසා මගේ වචන සවල්පය මෙතනින් සමාප්ත කරනව.

අ. භා. 5.32

**කේ. එච්. ජී. ඇල්බට් මයා.** (බෙන්තර-ඇල්පිටිය)
*(திரு. கே. எச். ஜீ. அல்பேட்—பெந்தற-எல்பிட்டிய)*
(Mr. K. H. G. Albert—Bentara-Elpitiya)

ගරු කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාවේදී මාත් වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්න කල්පනා කරනව. ගරු ගමනාගමන ඇමතිතුමාගෙ ක්‍රියා පිළිවෙළ අපි අගේකොට සලකන බව මුලින්ම සඳහන් කරන්න කැමතියි. වෙනදාට වඩා උසස් සේවයක් මහජනතාවට දෙන්න වෑයම් කරන එතුමට අපි විශෙෂයෙන් ප්‍රශංසා කළ යුතුයි.

**අමරනන්ද රත්නායක මයා.**
*(திரு. அமரானந்த ரத்நாயக்க)*
(Mr. Amarananda Ratnayake)
ඇයි, පාර්ලිමේන්තු ලේකම්තුමා ?

**ඇල්බට් මයා.**
*(திரு. அல்பேட்)*
(Mr. Albert)

පාර්ලිමේන්තු ලේකම්තුමත් බොහොම මහන්සි ගන්නව. එතුමත් අපේ ප්‍රශංසාවට ලක් වෙනව. බස් සේවකයන් අතර නොයෙකුත් භේද ඇති කරන්න මේ රටේ ප්‍රවෘත්ති පත්‍රත් මෙම රජයට නොකැමැති යම් යම් කණ්ඩායමුත් නොයෙකුත් විධියෙ ව්‍යාපාර ගෙනියන බව පේනව. මේ රටේ බස් සේවකයන් ඊට ලක් වෙන්න එපාය කියා මෙම අවස්ථාවේදි අවවාදයක් වශයෙන් මතක් කරන්න කැමතියි. ඒ අය කරන්නෙ ජාතික සේවයක්. එම සේවය ජාතික සේවයක් වශයෙන්ම සලකාගෙන ක්‍රියා කරන්න ඒ අය පොරොන්දු වෙන්න ඕනෑ.

අපේ රටට තව්වු දෙකේ බස් විශාල සංඛ්‍යාවක් ගෙන්වන බව පේනව. ඒ ගැන අපි සන්තෝෂ වෙන්න ඕනෑ. ඒ වගේම වැඩි වශයෙන් මහජනය ගැවසෙන පිටිසර ප්‍රදේශවලටත් වැඩි වැඩියෙන් කුඩා බස් රථ ගෙන්වා ඔවුන් අතර බස් සේවාව ජනප්‍රිය කරවන්න එතුමා මහන්සි ගතයුතුව තිබෙන බව ගරු ඇමතිතුමාට මතක් කරන්න සතුටුයි. ගම්බද ජනතාවගෙ ගමනාගමනය සඳහා යෙදවිය යුත්තේ කුඩා බස් රථයි. ලොකු බස් රථ යෙදවීම නිසා ගම්බද පාරවල් වැඩි වශයෙන් අබලන් වී තිබෙන බව පේනව. එම නිසා පුළුවන් තරම් වැඩියෙන් කුඩා බස් රථ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඇල්බට් මයා.]

ගම්බද ප්‍රදේශවල භාවිතයට යොදවන ලෙස මා ඉල්ලා සිටිනවා.

මේ රටේ ටැක්සි රියැදුරන් පිළිබඳව යම් යම් නීති රීති තියෙනවා. අත්දැකීම් ලැබී තිබෙන නිසා ඒ අය පිළිබඳව කරුණක් මතක් කරන්න ඕනෑ. ටැක්සි රියැදුරු මහතුන් හඳුනා ගැනීම සඳහා රථය එලවන රියැදුරු මහතාගේ ඡායාරූපයක් සහිත හැඳින්වීමේ පත්‍රිකාවක් රථයේ ඉස්සරහ පැත්තේ අලවා තබන්න වැඩ පිළිවෙළක් ඇති කළොත් මගීන්ට ප්‍රයෝජනවත් වෙනවා. එවැනි වැඩ පිළිවෙළක් ඇතැම් රටවල තිබෙනවා. රියැදුරු මහත්මයා පිළිබඳ සම්පූර්ණ විස්තරයක් දැන ගන්න මගීන්ට ලැබෙන විධියේ වැඩ පිළිවෙළක් ඇති කරනවා නම් බොහොම හොඳ නිසා ඒ ගැන සලකා බලන මෙන් මා ඉල්ලා සිටිනවා. ඒ යෝජනාව ඉදිරිපත් කරන්න කැමතියි. ඒ යෝජනාව පිළිගෙන වැඩ කළොත් ටැක්සි රියැදුරන් නිසා සිදු වන බොහොමයක් අපරාධ නැති කරන්න නැත් නම් වළක්වන්න පුළුවන් වේය කියා මා හිතනවා.

අ. භා. 5.35

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රවාහණ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා මේ අවස්ථාවේ සභා ගර්භය තුළ සිටීම ගැන මා සන්තෝෂ වෙනවා. මේ කෙටුම්පත් පණත ඉදිරිපත් කරමින් ප්‍රවාහණ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමා කියා සිටියේ බස් කොන්දොස්තරවරුන් නොමැතිව බස් ධාවනය කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම සඳහා මෙවැනි සංශෝධනයක් තිබීමේ ඇති අවශ්‍යතාව ගැනයි. මා ඒ කතාව අහගෙන හිටියා. ඒ විධියටයි මා තේරුම් ගත්තෙ. මා දන්න තරමින් නම් අද එවැනි බස් ධාවනයක් මේ රටේ නැහැ. කොන්දොස්තරවරුන් නොමැතිව ධාවනය කරන බස් රිය එකක්වත් මගේ දැනීමේ හැටියට නම් අද ලංකාවේ නැහැ. එහෙම වැඩ පිළිවෙළක් අද නැහැ. එහෙම එකක් ඇති කරන්න හෙට අනිද්දා දිහාට ගරු ඇමතිතුමා බලාපොරොත්තු වෙනවද දන්නෙ නැහැ. එවැනි අදහසක් තිබෙනවා නම් ඒ ගැන එක කාරණයක් කියන්න තිබෙනවා. එවැනි අදහසකට අපට එකඟ වෙන්න පුළුවන්ය කියා මා නම් හිතන්නෙ නැහැ. සමහර විට වියදම් අඩු කිරීමේ මාධ්‍යයක් හැටියට කොන්දොස්තරවරුන් නැතිව බස් රිය දුවවන්න වැඩ පිළිවෙළක් සකස් කරන්න කල්පනා කරනවා වෙන්න ඇති. ඒ අදහසින් මේ සංශෝධනය ඉදිරිපත් කළා වෙන්න ඇති. ඒ කොයි හැටි වෙතත්, රැකීරක්ෂා නැති අයගෙ ප්‍රශ්නය ගැන සලකන විට මෙවැනි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමෙන් ලොකු විපතක් වෙන්න ඉඩක් තිබෙන බව කියන්න ඕනෑ. වාහනයකට බස් කොන්දොස්තර කෙනෙකු නොදා වැඩ කිරීමෙන් ඒ තරම් විශාල ලාභයක් ගන්න බලාපොරොත්තු වෙනවය කියා මා හිතන්නෙ නැහැ. බස් කොන්දොස්තර කෙනෙකු සිටීමෙන් අඩු ගණනේ එක්කෙනෙකුටවත් රක්ෂාවක් නම් ලැබෙනවා. පාර්ලිමේන්තු ලේකම්තුමා කළ කථාවෙන් කියැවුණේ එවැනි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම සඳහා මේ සංශෝධනය උපයෝගි කර ගන්න බලාපොරොත්තු වන බවය කියායි මා හිතන්නෙ.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

ඒක ඇත්ත.

**පී. ආර්. රත්නායක මයා.**
*(திரு. பீ. ஆர். ரத்நாயக்க)*
(Mr. P. R. Ratnayake)

සාමාන්‍යයෙන් හැතැප්ම දහයෙ පහ ළොවෙ පමණ ශීඝ්‍රගාමී බස් සේවාවල් තිබෙනවා. ඒ සේවාවට අයිති බස් හැම නැනම නවත්වන්නෙ නැහැ. කිසිම තැනක නවත්වන්නෙ නැතිව දිගටම වේගයෙන් යන්නයි ඒ සේවාවල් තියෙන්නෙ. ඉක්මනින් යන්නයි ඒවා තියෙන්නෙ. රැකීරක්ෂා ප්‍රශ්නය සම්බන්ධයෙන් නොවෙයි මේ ගැන මා කළ කථාවෙන් කියා සිටියෙ. මුදල් උපයන වෙනත් ක්‍රම අපට තියෙනවා. මේ විධියට නොතිබුණොත් මේ පණතින් අපට කිසිම ප්‍රයෝජනයක් නැති වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**

*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*

(Mr. D. B. R. Gunawardena)

කොන්දොස්තර කෙනෙකු නැතිව බස් එකක් එලවගෙන යන ඩ්‍රයිවර් මහත්මයෙකුට යම් යම් කරදරවලට මුහුණ පාන්න සිද්ධ වෙනව. යම් අවස්ථාවක බඩයක් දෙකක් බස් එක පස්සට ගන්න ඩ්‍රයිවර් මහත්මයාට වුවමනා වුණොත් වචනයක්වත් දෙන්න කෙනෙක් නැතිව යනවා නේද? එහෙම වුණාම ඇක්සිඩන්ට් සිද්ධ වෙන්නත් ඉඩ තියෙනවා නේද? ඒ නිසා කොන්දොස්තර මහත්මයෙක් ඉන්නම ඕනෑ හැම බස් එකකටම.

**කේ. එම්. පී. රාජරත්න මයා.**

*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*

(Mr. K. M. P. Rajaratna)

අනෙක් කාරණය, හැතැප්ම දහයක් දොළහක් දුරට ශීඝ්‍ර ධාවනයක් ඇති කිරීමේ කිසිම තේරුමක් තියෙනවය කියා මට නම් පෙනෙන්නෙ නැහැ. ඒ විධියට අතර මග නවත්වන්නෙ නැතිව බස් ගමන් කරනවා නම් අතර මග ඉන්න මගීන් කොහොමද යන්නෙ? කොට්ටාවේ ගරු මන්ත්‍රීතුමා කී කාරණයේ තේරුමක් තියෙනවා. දිග බස් එන්නෙ සාමාන්‍යයෙන් නගරබද පළාත්වලටයි. ගම්බද පළාත්වල වංගු වැඩියි. ඒ වගේම වෙනත් අවහිරකම් වුණත් වැඩියි. පාරවල් වුණත් පළල නැහැ ගම්බද ප්‍රදේශවල. අපේ පළාත්වල අද විශාල බස් එකක්වත් නැහැ. බස් එකක් පස්ස ගහනකොට වුණත් ඒ කටයුත්ත කොයි විධියට කරන්න ඕනෑද කියල මතක් කරන්න කවුරු නමුත් කෙනෙකු බස් රථයේ ඉන්න ඕනෑ. කෙසේ වුවත් කොන්දොස්තර්වරුන් නැතිව බස් රථ ධාවනය කිරීම අද තත්ත්වයේ හැටියට ප්‍රඥාගෝචර යයි මා හිතන්නේ නැහැ. එය රැකීරක්ෂා නැතිකමේ ප්‍රශ්නය උග්‍ර කිරීමට තවත් හේතුවක් වෙනවා. එම නිසා ඒ වගන්තියට අප විරුද්ධයි. ඒ නිසා ඒ වගන්තිය ඉල්ලා අස් කර ගන්නා ලෙස අප ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම සමාජවාදී ඇමතිවරයකු මේ වගන්තිය ඇති කිරීම ගැන කනගාටුයි.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**

*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*

(Mr. D. B. R. Gunawardena)

ඩ්‍රයිවර් නැතිව රේල්ලු දුවවන්නටත් වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. නමුත් තවම ඒක කෙරිලා නැහැ. [බාධා කිරීමක්].

**කේ. එම්. පී. රාජරත්න මයා.**

*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*

(Mr. K. M. P. Rajaratna)

අද තිබෙන තත්ත්වය අනුව මේ විධියේ බලතල දීම ඒ තරම් සුදුසුය කියා මා හිතන්නේ නැහැ. ඇමතිතුමාට මේ ගැන යමක් කියන්න තිබෙනවා නම් මගේ කථාව සවල්ප වේලාවකට නවත්වා වාඩි වෙන්නම්.

**ගරු අනිල් මුණසිංහ (ප්‍රවාහණ කටයුතු පිළිබඳ ඇමති)**

*(கௌரவ அனில் முனசிங்க—போக்குவரத்து அமைச்சர்)*

(The Hon. Anil Moonesinghe—Minister of Communications)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ප්‍රශ්නය වැරදි පිළිවෙළට මතු කර තිබෙන බව පේනවා. සමහර අවස්ථාවලදී කොන්දොස්තර මහතුන් නැතිව බස් ධාවනය කරන්නටයි, අප අවසර ඉල්ලා තියෙන්නේ. උදේ 6 ට කෝට්ටේ සිට නැත්නම් බත්තරමුල්ලේ සිට කොළඹට බස් රථයක් ධාවනය කරනවා යයි සිතමු. ඒ බස් රථය එක වරක් කොළඹට පැමිණ ඒ ප්‍රදේශයේ සිටින ඉතිරි මගීන් ගෙන ඒම සඳහා ඉක්මනින්ම ආපසු යන්නට ඕනෑ. ඒ බස් රථය මගීන් නොගෙන ඉක්මනටම ආපසු නොගියොත් 7 ට පිටත් වන මගීන් ගෙන එන්නට විධියක් නැහැ. දැනට කොන්දොස්තර කෙනකු නැතිව බස් රථයක් ධාවනය කරන්නට නීතියෙන් ඉඩක් නැහැ. දවසේ වැඩ අවසන් වී බස් රථය ඩිපෝ එකට ගෙන යන විටත් කොන්දොස්තර කෙනකු ඉන්නට ඕනෑ. කිසිම වැඩක් නැතිව ධාවනය කරන විටත් කොන්දොස්තර කෙනකු ඉන්නට ඕනෑ. නමුත් මේ නීතිය ඉදිරිපත් කර තිබෙන්නේ වැඩක් නැතිව බස් රථය ධාවනය කරන විට, වෙනත් විධියකට කියතොත් මගීන් නොගෙන බස් රථය ධාවනය කරන විට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු අනිල් මූනසිංහ]
කොන්දොස්තර කෙනකු නැතිව ගමන් කළ හැකි වීම සඳහායි. ඒ මිසක් මේ මගින් රක්ෂාවලට පහර ගැසීමක් නැහැ. මේ නීතිය ඉදිරිපත් කිරීමේදී එවැනි අදහසක් ඇති වුණේ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපති තුමනි, අසුවල් අසුවල් සංයුක්ත මණ්ඩලවලින් කොතරම් ලාභයක් තිබෙනවාද යනාදී වශයෙන් විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් මේ ගරු සභාවේදී අපෙන් ප්‍රශ්න කරනවා.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)
අපත් අහනවා.

**ගරු අනිල් මූණසිංහ**
*(கௌரவ அனில் முனசிங்க)*
(The Hon. Anil Moonesinghe)
ඔව්; අප ඒ ප්‍රශ්නවලට පිළිතුරු දෙන්නට ඕනෑ. අපට ඒ ප්‍රශ්නවලට පිළිතුරු දීමට ශක්තියක් ඇති වන්නේ ඒ ඒ සංයුක්ත මණ්ඩලයෙන් ලාභ පෙන්වන තරම අනුවයි. පසුගිය මාස 6 ඇතුළත ලංගමයෙන් රුපියල් ලක්ෂ 80 ක ලාභයක් ලැබී තිබෙනවා. මේ අවුරුද්ද අවසාන වන විට රුපියල් ලක්ෂ 160 ක ලාභයක්වත් පෙන්වන්නට පුළුවන් වෙතැයි මා කල්පනා කරනවා. ඒ විධියට ලාභ පෙන්වීමේදී විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් කියන සෑම දෙයක්ම අපට කරන්නට පුළුවන් වන්නේ නැහැ. මේ සංශෝධනය ඉදිරිපත් කර තිබෙන්නේ මගීන් නොගෙන ශීඝ්‍රගාමීව ගමන් කරන බස් රථවල කොන්දොස්තරවරුන් නොයෑම වරදක් නොවනු පිණිසයි.

**ඇල්බට් මයා.**
*(திரு. அல்பேட்)*
(Mr. Albert)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මටත් කාරණයක් මතක් කරන්නට තිබෙනවා. කොන්දොස්තර මහතුන් නිවාඩු යෑම හේතුකොටගෙන ඇල්පිටිය හා ගාල්ල යන ප්‍රදේශවල බස් ගමන් නතර වූ අවස්ථා තිබෙනවා. කොන්දොස්තර මහතුන් නැති නිසා බස් රථ ධාවනය නතර කරනවා. මහජනයාට ගමන් කිරීම සඳහා බස් රථ නැති වෙනවා. එම නිසා මේ සංශෝධනය කුමන විධියේ තත්ත්වයක් ගන්නවාදැයි පේනවා ඇති.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇමති තුමා විසින් දෙන ලද පිළිතුරු ගැනත්, බෙන්තර-ඇල්පිටිය ගරු මන්ත්‍රීතුමා කී කාරණය ගැනත් සතුටුයි. ඇත්තෙන්ම ලංගමයෙන් ලාභයක් ලැබෙන බව කීම ප්‍රීතියට කාරණයක්. නමුත් දැන් ඒ ගැන විග්‍රහ කිරීමට මා බලාපොරොත්තු වන්නේ නැහැ. ඒ ගැන විග්‍රහ කිරීමට පසුව අවස්ථාවක් ලැබෙනවා ඇති කෙසේ වෙතත් ඇමතිතුමා දුන් පිළිතුර ගැන ප්‍රශංසා කරනවා. නමුත් මෙහි එක්තරා දෝෂයක් තිබෙනවා. කෝච්චියෙන් උදේ පිටත් වන බස් රථය සඳහා කොන්දොස්තර කෙනකු අවශ්‍ය නැති බව ඇමතිතුමා ප්‍රකාශ කළා. ඩිපෝ එකෙන් බස් එකක් එළියට ගෙන පදවා ගෙන ඒමේදීත් කොන්දොස්තර් කෙනකු අවශ්‍ය නැති බව කීවා. බස් එකක් ඩිපෝවෙන් එළියට ගන්න විට රියැදුරත් කොන් දොස්තරත් දෙදෙනාම සමග එළියට ගන්ට ඕනෑ. කෝච්චියට බස් එකක් ගෙනෙන්නෙ මහරගම ඩිපෝවෙන්. කෝච්චියේ සිට පිට කොටුව දක්වා ශීඝ්‍රගාමී ලෙස දුවන බස් රථයට සමහරවිට යම්කිසි කාරණාවක් උඩ සෙනග නැතිව කෝච්චියේ සිට පිටකොටුවට එන්ට සිදු වෙනවා කියන කාරණය මා පිළිගන්නව. ඒ බසය මහරගමින් පිටත් වෙන කොට කොන්දොස්තර කෙනෙක් එනවද නැද්ද? ඒ එන කොන්දොස්තරට මොකද වෙන්නෙ? පිටකොටුවට ඒ බස් එක ගිහින් ආපසු එන විට කොන්දොස්තර කෙනෙක් වුවමනා නැද්ද? කෝච්චියෙ පාර එතරම් විශාල එකක් නොවෙයි. සමහරවිට බස් එක පස්ස ගහන්ට සිදු වෙන්නෙ නැද්ද? වෙනත් අවහිර ඒ අතර සිදු වෙන්නෙ නැද්ද? ඒ නිසා එය හේතුවක් හැටියට ගන්නව නම් මා හිතන්නෙ නැහැ, ඒක යුක්තිසහගතයි කියා. බෙන්තර—ඇල්පිටියෙ ගරු මන්ත්‍රීතුමා වැදගත් කාරණයක් කිව්ව. ඒක ඇමතිතුමාගේ අදහසද නැද්දැයි මා දන්නෙ නැහැ. කොන්දොස්තරවරුන් නිවාඩු ගැනීම නිසා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඇල්පිටිය—ගාල්ල බස් කොපමණ නවත් වන්ට සිදු වී තිබෙනවාදැයි ඒ මන්ත්‍රීතුමා ඇසුවා. ඒකට පිළියමක් තිබෙනව. තවත් වැඩට වැඩිපුර මිනිස්සු ගන්න ඕනෑ.

**ඇල්බට් මයා.**
*(திரு. அல்பேட்)*
(Mr. Albert)
හිටපු ගමන් නිවාඩු.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)
මිනිසුන්ට අසනීප වෙනව; කරදර වෙනව. අපට අසනීප, කරදර වෙන්නෙ නැද්ද? මේ ගරු සභාවේ ගරු මන්ත්‍රී වරුන් හැමදාම ඇවිත් සිටිය යුතුව තිබෙද්දී අද ගණපූරණයක් තරමටවත් නැත්තෙ; අපි ප්‍රශ්න නොකළාට. මන්ත්‍රී වරුන්ට වෙන කරදර නැද්ද? අපි දොස් කියන්නෙ නැහැ. ඒ වගේ වැඩ කරන මිනිසුන්ටත් කරදර ඇති. හැබැයි, නිකරුණේ රාජකාරියට ආදරයක් නැතිව කිසිවෙක් වැඩ කරනවා නම් නීත්‍යානුකූලව, විනයානුකූලව ක්‍රියා කරන්ට ලංකා ගමනා ගමන මණ්ඩලයට බලය තිබෙනව. ඒක කාරණයක් හැටියට කීම යුක්තිසහගත නැහැ. සමහරවිට මේ නීතිය ගෙන එන්නෙ ඇමතිතුමාගෙ අදහස උඩම යහපතක් ලබා දෙන්ට වෙන්ට ඇති. එහෙත් මේ බලතල ලබා ගැනීම මහා භයානක දෙයක්. සමහර දියුණු රටවල, හැමෝටම වගේ රැකීරක්ෂා තිබෙන රට වල අද කම්කරුවන් නැතුව වැඩ කරන්ට පුළුවන් "ලේබර් සේවිං" මැෂින් තිබෙනව. ඒ වගේ ක්‍රමයක් අද අපට ගෙන යන්ට පුළුවන්කමක් නැහැ, අපේ රටේ රැකීරක්ෂා නැතිකමේ ප්‍රශ්නය දිනෙන් දිනම උග්‍ර වෙන නිසා. ඒ නිසා එක බස් එකකට එක කොන්දොස්තර කෙනෙකු සිටිය යුතුමය කියා අපි කියනව. එවිට අඩු ගණනේ බස් එකක් අළුතෙන් එන විට තවත් එක්කෙනෙකුටවත් රක්ෂාවක් ලැබෙනව.

අනික් කාරණය බස් මුදලාලිලාගේ කාලයේ බස්වලින් හොඳ ලාභයක් ඔවුන් ලැබුව. මා හිතන්නෙ නැහැ, එක බස් මුදලාලි කෙනෙක්වත් පාඩු වින්දා කියා. ඒ කාලයෙත් කොන්දොස්තරල සිටියා; නැත්තෙ නැහැ. අද බස් සේවය පාඩු පිට පවත්වාගෙන යන්නෙ වෙනත් ප්‍රශ්න නිසයි. කොන්දොස්තර අයින් කිරීමෙන් ඔය ප්‍රශ්නය විසඳන්ට පුළුවන් වෙයිද, නැද්ද කියා මා දන්නෙ නැහැ. කොහොම වුණත් අපට මේකට එකඟ වන්ට බැහැ.

**රෝයි රාජපක්ෂ මයා.** (හක්මන)
*(திரு. ரோய் ராஜபக்ஸ—ஹக்மன)*
(Mr. Roy Rajapakse—Hakmana)
ඒ කාලයේ හරි හැටි සේවකයන්ට පඩි දුන්නෙ නැහැ.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)
ඊට වඩා අද ආදායමක් ලැබෙන බව හක්මන ගරු මන්ත්‍රීතුමා හොඳට හිතට ගන්න.

**ඇල්බට් මයා.**
*(திரு. அல்பேட்)*
(Mr. Albert)
එදාට වඩා අද සැප පහසුකම් දෙනව.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)
තවත් කාරණයක් තිබෙනව, ඇමති තුමාට විශේෂයෙන් මතක් කළ යුතු. සම හර බස්වල පුදුම දුම් දැමීමක් තිබෙනව. විශේෂයෙන්ම නගරබද පළාත්වල සෞඛ්‍ය තත්ත්වයට එය හානිකරයි. වෙනත් ඩීසල් ලොරි ආදිය දුවන නමුත් ඒවායින් ඔය තරම් දුමක් නගින්නෙ නැහැ. කොළඹ නගරයේ පමණක් නොව පාර දෙපස ගෙවල් රාශියක් තිබෙන අනික් නගරවලත් සෞඛ්‍ය තත්ත්වයට මෙය හානිකරයි. සම හර විට පසුපස ගමන් කරන වාහනවලටත් මේ නිසා ගමන් කිරීම අපහසුයි. ඇතැම් රටවල දුම දැමීම සම්පූර්ණයෙන් තහනම් කර තිබෙනව. ලංකා ගමනා ගමන මණ්ඩලයේ හැම බස් රථයකින්ම වගේ මේ දුම් පිටවීම කෙරෙනව. නැති එකක් කියන්ට අමාරුයි. මේ ගැන පරීක්ෂා කර බලන ලෙස ඉංජිනේරු අංශයට නියම කරන ලෙස ඇමතිතුමාට මතක් කරන්ට සතුටුයි. මා විශේෂඥයකු නොවෙයි. දන්න උදවිය කියනව, මේක සුළුවෙන් නතර කර ගන්ට පුළුවන් දෙයක්ය කියා. සැලකිලිමත්ව එන්ජිම සකස් කිරීමෙන් මෙය පහසුවෙන් කරන්ට පුළුවන් දෙයක්. ඒ ගැන හිත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. එම්. පී. රාජරත්න මයා.]

යොමු කරල නැහැ, තවම කවුරුවත්. මේ ප්‍රශ්නය බස් මුදලාලිලාගේ කාලයේත් තිබුණු දෙයක්. මට මතකයි, මේ පිළිබඳව ඒ කාලයේ පත්‍රවල වාර්තා පළ වුණු බව. එදා වගේ අද මේ ප්‍රශ්නය ගැන කවුරුවත් ලොකුවට කථා කරන්නෙ නැහැ, ආණ්ඩුවේ ආයතනයක් නිසා. නමුත් මෙය දවසින් දවස දරුණු වන නිසා, අඩුවීමක් නැති නිසා, මෙය මේ අවස්ථාවේදී ඇමතිතුමාගේ සැලකිල්ලට භාජන කරනව.

දෙවෙනි කාරණය නුවරඑළියේ ගරු මන්ත්‍රීතුමා (විලියම් ප්‍රනාන්දු මයා.) දුම්රියක් සම්බන්ධයෙන් ඉදිරිපත් කළ අදහසයි. රාත්‍රී 10ට කොළඹින් පිටත් වී පසු දින උදේ 7 ට නුවරඑළියට ළඟා විය හැකි දුම්රියක් තිබෙන බව තමුන්නාන්සේ දන්නවා ඇති. එම දුම්රියෙන් ගොස් නුවරඑළියට ළඟා වන වෙලාවට අනුව වැලිමඩ ආදි පළාත්වලට බස් සේවයක් තිබෙනවා නම් එයින් විශාල සේවයක් සිදු වන බව නුවරඑළියේ ගරු මන්ත්‍රීතුමා සඳහන් කරන්න යෙදුණා. නුවරඑළියෙ මන්ත්‍රීතුමා කී ඒ කාරණය මම සනාථ කරන අතර ඒ සම්බන්ධයෙන්ද ඇමතිතුමාගේ අවධානය යොමු වෙනවා ඇත කියා බලාපොරොත්තු වෙනව.

තවත් එක් කාරණයක් තිබෙනව. ටයර් ගෙන්වීම සඳහා ටෙන්ඩර් කැඳවන්නෙ නැතිව ජපානයෙන් ටයර් ගෙන්වීමට ජැෆර්ජී සමාගමට බලය දී තිබෙනව. අපට ලැබී තිබෙන ආරංචිවල හැටියට, ලංගමයට මින් පස්සෙ ටයර් ගෙන්වන්නෙ ඒ විධියටය කියා මුදල් ඇමතිතුමා නිවේදනයක් නිකුත් කර තිබෙනව. මෙය ඇත්තද නැත්තද කියා මම දන්නෙ නැහැ. මගේ ප්‍රකාශය වැරදි නම් මම එය ඉල්ලා අස් කර ගන්නව. මෙය ඇත්ත නම් මම අහන්න කැමතියි, ඇයි ටෙන්ඩර් කැඳවන්නෙ නැතිව ජැෆර්ජී සමාගමට ඒ බලය පැවරුවෙ කියා. එසේ නැත්නම්, ලංකා ගමනාගමන මණ්ඩලය ආණ්ඩුවේ ආයතනයක් නිසා ඇයි කෙළින්ම මණ්ඩලය මගින්ම ගෙන්වන්න බැරි? ජපානයෙන් ලාබෙට ලැබෙනවා ඇති. නමුත් ටයර්වල තත්ත්වය කොහොමද කියා අපි දන්නෙ නැහැ. ඒවා ආවාට පසුවයි, අපට ඒවායෙ තත්ත්වය දැනගන්න පුළුවන් වන්නෙ. ඒ ගැන නොදන්න නිසා මම ඒ සම්බන්ධයෙන් විවේචනය කරන්න කැමති නැහැ. කෙසේ වෙතත් ජැෆර්ජී සමාගම වැනි පෞද්ගලික සමාගමකට දුන්නෙ ඇයි? ඇයි ලංගමයට දෙන්න බැරි? එහෙම නැත්නම්, ඇයි සමුපකාර තොග වෙළඳ ආයතනයෙන් ගෙන්වන්න බැරි? ඒ නිසා ඒ කාරණය සම්බන්ධයෙන්ද මේ අවස්ථාවේදී ගරු ගමනාගමන ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න කැමතියි. ඒ ගැන ප්‍රකාශයක් කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉල්ලනව.

අ. භා. 5.52

**ගරු අනිල් මූණසිංහ**
*(கௌரவ அனில் முனசிங்க)*
(The Hon. Anil Moonesinghe)

නියෝජ්‍ය සභාපතිතුමනි, මම යළිත් වරක් ප්‍රකාශ කරන්න කැමතියි, ලංකා ගමනාගමන මණ්ඩලය ඉදිරිපත් වී සිටින්නේ රැකීරක්ෂා ප්‍රශ්නය විසඳන්නට නොවන බව. මහජන සේවාවක් ඉෂ්ට කර ඒ වාගේම ලාභයක්ද පෙන්වීමටයි ලංකා ගමනාගමන මණ්ඩලය අදහස් කරන්නෙ. එසේ නැතිව වැලිමඩ ගරු මන්ත්‍රීතුමා (කේ. එම්. පී. රාජරත්න මයා.) කියන විධියට රැකීරක්ෂා ප්‍රශ්නය විසඳන්න නම් මට පුළුවන් වැලිමඩ කොට්ඨාශයේ සියලු දෙනාටම රක්ෂා ලබා දෙන්න. නමුත් අපි ඉදිරිපත් වී සිටින්නේ, නැත්නම් ලංකා ගමනාගමන මණ්ඩලයේ පරමාර්ථය වන්නේ රැකීරක්ෂා ලබා දීම නොවෙයි. ලංකා ගමනාගමන මණ්ඩලය නියමිත සේවාවක් හැටියට පවත්වාගෙන යා යුතු සේවාවක්. යම්කිසි ප්‍රමාණයක් රක්ෂා දෙන්න පුළුවන් නම් ඒ රක්ෂා නොදී සිටිනවාය කියා මම කියන්නේ නැහැ. නමුත් ලංගමයේ ප්‍රතිපත්තිවලට අනුකූල වයි එය කළ යුත්තෙ.

දැන් කොළඹ වරාය ගැන බලන්න. අඟුරු බෑම ගැන දැන් අපි එක්තරා ක්‍රමයක් පිළියෙළ කර තිබෙනව. අඟුරු නැව් එක පාරටම එනව. ඒ නිසා මම කිව්වා, "ඩෙමරේජ්" ගෙවන්නෙ නැතිව, ඒ සඳහා වියදම් වන මුදල ලංකාවෙ කම්කරුවන්ට ලැබෙන පරිදි, කටයුතු කරන එක හොඳය කියා. දැනට ඒ අනුව කටයුතු කරගෙන යනව. ඒ වාගේම වැලිමඩ ගරු මන්ත්‍රීතුමාට මතක් කරන්න කැමතියි, ගාලු වරාය ජනසතු කර තිබෙන්නෙ, සෑම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අවුරුද්දකම ලක්ෂ 16ක අලාභයක් පව තිද්දීය කියා. මොන හේතුන් උඩද එසේ වී තිබෙන්නෙ? මේ රටේ තේ පිටරට පැට වීමේදී රාත්තලකට ශත දෙකක් බැගින් ගෙවන්න ඕනෑ. ගාලු වරායෙන් පමණක් පටවන තේ සඳහා අවුරුද්දකට ලක්ෂ 16ක් ගෙවන්න සිද්ධ වුණා. නමුත් අපි තීරණයක් කළා, ඒ මුදල් ධනපතීන්ට දෙනවාට වඩා හොඳයි ඒ කම්කරුවන්ට වැඩ දී ඒ මුදල කම්කරුවන්ට ලැබෙන් නට සලස්වන එක කියා. එම නිසා කම් කරුවන් "ස්ටෑන්ඩ් බයි" වශයෙන් තියා ගෙන සේවයේ යෙදවීමට මෙම සහභාගි ආණ්ඩුව තීරණය කළා. ඒ නිසා කරුණා කර කියන්න එපා, අපි වෙනත් විධියකට වැඩ කරනවාය කියා.

බස් ධාවනය කරවීමේදී යම් යම් සංඛ්‍යා ලේඛන අනුවයි බස් ධාවනය කරන්නෙ. සමහර මාර්ගවලින් පාඩුත් සිදු වෙනව. අපි එය පිළිගන්නව. නමුත් මහජන සේවා වක් ඉටු කළ යුතු නිසා අපි එය කරන්න ඕනෑ. අපි බැලිය යුත්තේ මහජන සේ වය ගැනයි. වැලිමඩ මන්ත්‍රීතුමාට මතක් කරන්න කැමතියි මේ ළඟදී ශ්‍රී නොම්මර දරණ බස් රථ 5ක් මඩකලපුවට යැවූ බව. ගමනාගමන ඇමති අංශය දෙමළ මිනි සුන්ට විශෙෂ වරප්‍රසාද දෙනවාය, ඒ අය ගේ පැත්ත ගෙන වැඩ කරනවාය, කියා අපට චෝදනා කරනව. නමුත් 1957 න් පසුව, පළමුවෙනි වරට ශ්‍රී නොම්මර දරණ බස් රථ මඩකලපුවට යවන්නට මේ සහ භාගි ආණ්ඩුවට පුළුවන් වුණු බව මම වැලිමඩ ගරු මන්ත්‍රීතුමාට මතක් කරන්න කැමතියි. අපි බස් රථ 5ක් යැව්වා. ඒ බස් 5 යවන විට කොන්දොස්තර මහත් වරු 5 දෙනකුත් යවන්න ඕන. එය නිෂ් ප්‍රයෝජන වියදමක්. ඊට වඩා හොඳයි, රියැ දුරු මහත්මයාට බස් රථය බාරදී යැවීම. මේ සංශෝධනය ගෙනැවිත් තිබෙන්නේ ඒ සඳහායි.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

මම එකක් කියන්නම්. ඔය සංශෝ ධනය උඩ බස් වෙන ආකාරයකටත් ගමන් කරවන්න ඉඩ තිබෙනව. නමුන්නාන්සේ ලාට වුවමනා අන්දමට ඩ්‍රයිවර් කෙනකුත් සමඟ පොලිස් භටයකුත් යැවීමට ඉඩ තිබෙනවා. කොන්දොස්තර කෙනෙක් නැතිව බස් ධාවනය කිරීම ගැන මම විරුද් ධයි. එකක් උඩ තවත් එකක් කරන්න ඉඩ දෙන්න බැහැ. මෙය සාධාරණ එකක් යයි ඇමතිතුමා කල්පනා කරනවා ඇති. නමුත් මම කල්පනා කරනවා, කොන් දොස්තර කෙනකු නැතිව බස් ධාවනය අවදානම්ය කියා.

**ගරු අනිල් මුණසිංහ**
*(கௌரவ அனில் முனசிங்க)*
(The Hon. Anil Moonesinghe)

වැඩ වර්ජන කෙරුනු අවස්ථාවලදී කොන්දොස්තර කෙනෙක් සිටියත් නො සිටියත් පොලිස් භටයින් ගිහින් තිබෙන බව ඒ මන්ත්‍රීතුමා දන්නවා ඇති. වෘත්තීය සමිති ශක්තිමත්ව තිබෙනවා නම් වැඩ වර්ජන අවස්ථාවලදී එවැනි දේ කරන්න දෙන්නේ නැති බවත් ඒ මන්ත්‍රීතුමා දන් නවා. පණතේ කොයි විදියට තිබුණත් වෘත්තීය සමිති ශක්තිමත් නම් එවැනි දේ කෙරෙන්නෙ නැහැ.

මේ කෙටුම්පත් පණත ඉදිරිපත් කර තිබෙන්නේ මෝටර් වාහන පිළිබඳවයි. නමුත් වැලිමඩ ගරු මන්ත්‍රීතුමා (කේ. එම්. පී. රාජරත්න මයා.) ලංගමය ගැන ප්‍රශ්න මතු කළ නිසා ඒවාට පිළිතුරක් දීම මගේ යුතුකමක්. අද නොයෙක් තැන්වල ප්‍රචා රය කරගෙන යනවා, ජ.ප.පෙ. සමාගම මඟින් අපි ටයර් ගෙන්වනවාය කියා. මම මේ ගරු සභාවේදි ප්‍රසිද්ධියේම ප්‍රකාශ කරන්න සතුටුයි, මෙපමණ කාලයක් ලංග මය බඩු ගත් ප්‍රතිපත්තිය අපි සම්පූර්ණ යෙන්ම වෙනස් කර තිබෙනව බව. ලංගම යට සෑම අවුරුද්දේම රුපියල් දස ලක්ෂ 12 ක ටයර් ගන්නවා. ඒ නිසා ලංගමය තීරණය කළ යුතුව තිබුණා, අසවල් ටයර් හොඳය, අසවල් ටයර් ලාභය, අසවල් ටයර් වලින් වැඩි සැතපුම් ගණනක් යා හැකිය, යනාදිය බලා එක වර්ගයක ටයර් ගැනීමට. එසේ තීරණය කොට ඒ ටයර් පුළුවන් තරම් ලාභයට ගැනීමට කටයුතු යෙදිය යුතුව තිබුණා. නමුත් ඒ විදියට නො වෙයි, ලංගමය ටයර් ගත්තෙ. සියයට 10ක් මිචලින් ටයර්, තවත් සියයට 10 ක් තවත් සමාගමකින්, යන විදියට හැමෝම සමඟ කොන්ත්‍රාත් ඇති කරගෙන තිබුණා. අපි ඒ ක්‍රමය නැවැත්තුවා. හොඳ ටයර් මො නවා දැයි බලා ඒ ටයර් කොම්පැනියත් සමඟ සාකච්ඡා කර පුළුවන් තරම් අඩු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මුදලකට ඒවා ගන්නය කියා පමණයි, ගරු මුදල් ඇමතිතුමා නියෝග කර ඇත්තෙ. ඒ අනුව ලංගමයට නියම කර තිබෙනවා, ජපන් රටින් බ්‍රිජ්ස්ටන් හා යොකෝහාමා යන ටයර් ගන්නටය කියා. ඒ අය ණය මුදලුත් දෙන්න කැමතියි. ඒ නිසා ඒ ටයර් ගැනීමට කටයුතු කළා මිස ජෝපර්ජ් සමාගමත් සමග සම්බන්ධකමක් ඇති කර ගත්තේ නැති බව මම කියන්න කැමතියි.

එපමණක් නොවෙයි, ලංගමය මෙතෙක් කල් බස් ගත්තෙත් සමාගම් කීපයකින්. මේ වාරයේදී බස් 700 ක් ගැනීමට අපි ටෙන්ඩර් කැඳවා තිබෙනවා. මම වැඩ බාර ගන්න කලින් ටෙන්ඩර් කැඳවා තීරණය කර තිබුණා, ෆියට් බස් ගැනීමට. මම වැඩ බාරගත් හැටියේම එය නැවැත්තුවා. මම පරීක්ෂා කර බැලුවා, කුමන හේතුවක් උඩ එසේ තීරණය කළාද කියා. ගමනාගමන අමාත්‍යාංශය ටෙන්ඩර් කැඳවන්නේ මුදල් අමාත්‍යාංශයේ තීරණය අනුවයි. මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමාමයි, මේ ටෙන්ඩර් ගැන බලන්නෙත්. අපි කොම්පැනි තුනක් කැඳෙව්වා. ලේලන්ඩ්ස්, මර්සිඩිස් බෙන්ස් සහ ෆියට් යන සමාගම් තුන. ඔවුන්ගෙන් අපි ඇහුවා, මේ බස් සඳහා කොපමණ අය කරනවාද කියා. අපි කිව්වා, මීට පස්සෙ අපි ගන්නෙ එක වර්ගයක බස් පමණක්ය කියා. එපමණක් නොවෙයි, එන අවුරුද්දේ සිට ඒ බස් ක්‍රමානුකූලව නිෂ්පාදනය කරන්න වුවමනා බවත් කිව්වා. බස් පමණක් නොවෙයි, ලොරිත් එක වර්ගයක් පමණයි, ලංකාවට ගෙන්වන්නෙ. එතකොට අමතර කොටස් වුවමනා කරන්නෙ එක වර්ගයකින් පමණයි. තව කොන්දේසියක් තියෙනවා. අප බස් ගන්න යන කොම්පැනියේ ලංකාවේ ප්‍රධාන ඒජන්තකම ලංකා ගමනාගමන මණ්ඩලයට දෙන්න ඕනැය කිව්වා. මුදල් ගෙවන්න අවුරුදු 4 ක් කල් දිය යුතු බවත් එක කොන්දේසියක්. මේ විධියේ කොන්දේසි අනුවයි, අපි ටෙන්ඩර් කැඳෙව්වෙ. දැන් ප්‍රසිද්ධියේ කිව්වට කමක් නැහැ, කලින් වියදම් වුණු මුදලට වඩා ලක්ෂ 20 ක් අඩුවෙන් අද ඒ බස් ගන්න පුළුවන් වෙලා තියෙනවා. ෆියට් කොම්පැනිය කලින් නියම කළ මුදලට වඩා ලක්ෂ 9 ක් අඩු කළා.

**අමරනන්ද රත්නායක මයා.**
*(திரு. அமரானந்த ரத்நாயக்க)*
(Mr. Amarananda Ratnayake)

ඉස්සෙල්ල ටෙන්ඩර් කැඳෙව්වෙ කව්ද? කලින් සිටි ඇමතිතුමාද?

**ගරු අනිල් මූණසිංහ**
*(கௌரவ அனில் முனசிங்க)*
(The Hon. Anil Moonesinghe)

නැහැ, මණ්ඩලයයි, කැඳෙව්වෙ. ඇමතිතුමා නොවෙයි. මණ්ඩලයයි තීරණය කළේ ඒවා ගන්න ඕනැය කියා. අපි කිව්වා, අපට පුළුවන් අඩුම ගණන් දෙන්නය කියා. ෆියට් කොම්පැනිය ලක්ෂ 9 ක් අඩු කළා. මර්සිඩිස් කොම්පැනියත්, ලෙයිලන්ඩ් කොම්පැනියත් අඩු කළා. මේ සතියේ ෆියට් කොම්පැනිය තව ලක්ෂ හයාමාරක් අඩු කළා. ලෙයිලන්ඩ් කොම්පැනිය ලක්ෂ 10 ක් අඩු කළා. මෙපමණ කාලයක් මේ විධියට කළේ නැහැ. ලාභම කොම්පැනියෙන් හොඳම බඩුව අපට වුවමනා පිළිවෙළට ගන්න අපි අද ඇස්ති කරගෙන තියෙනව. මීට කලින් ඒ අය අපට නියම කළා, මේ විධියට ගන්න ඕනැය කියා. දැන් අපි ඒ අයට නියම කරනව, මේ විධියට දෙන්න ඕනැය කියා. අප අනුගමනය කරන්නෙ ඒ විධියේ ප්‍රතිපත්තියක් බව වැලිමඩ මන්ත්‍රීතුමාට මතක් කරනව.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

මම ප්‍රශ්නයක් අහන්නද? කරුණා කරල ඔය විධියටම ටයර් ගැනීමත් කරනවද? මැදින් මිනිහකු ඉන්ද ගන්නෙ නැතිව කෙළින්ම ගන්නවද?

**ගරු අනිල් මූණසිංහ**
*(கௌரவ அனில் முனசிங்க)*
(The Hon. Anil Moonesinghe)

හැම බඩුවක්ම එහෙම තමයි, ගන්න යන්නෙ. අපි තමයි, ඒජන්තවරු වන්න ඕනැ.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

බොහොම සන්තෝෂයි. අපි පිළිගන්නව, මැද කෙනකු නැතිව කෙළින්ම බඩු ගැනීමේ ප්‍රතිපත්තිය ගරු ඇමතිතුමා ක්‍රියාවේ යොදවනවය කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු අනිල් මූණසිංහ**
*(கௌரவ அனில் முனசிங்க)*
(The Hon. Anil Moonesinghe)

සමහර බඩු අද ලංකාවේ නිෂ්පාදනය කරන බව මම මතක් කරන්න කැමතියි. බ්රේක් ඩ්රම්ස් අපි හදන්නෙ දුම්රිය දෙපාර්තමේන්තුවෙ. බස්වලට වුවමනා එක්සෝස්ට්ස් හදනව, වරායේ ඉංජිනේරු fපැක්ටෙරියේ. පෙට්රල් ටැන්කි හදන්නෙ වරායෙ fපැක්ටරියෙ. අපේ විදේශීය විනිමය ආරක්ෂා කර ගැනීමට අපි ඒ විධියේ ප්රතිපත්තියක් අනුගමනය කරනව. දුම් දමන බස් ගැනත් ප්රශ්නයක් මතු වුණා. ඇත්ත තමයි, පොඩි උපකරණයක් තමයි, මේකට වුවමනා කරන්නෙ. ඒ උපකරණය ශුද්ධ කිරීමට සමහර ගරාජවල යන්ත්ර තියෙනව. මේ උපකරණය ගැළෙව්වම තවත් එකක් සවි කරන්න ස්ටොක් තියෙන්න ඕනෑ. මෙපමණ කාලයක් ලංගමයේ ගරාජවල ඒ ස්ටොක් හරියාකාර තියා ගත්තෙ නැහැ. අදත් රත්මලානේ ඩබල් ඩෙකර්ස් බස් 16 ක් තියෙනව, එන්ජින්ස් නැතිව. මේ විධියේ උපකරණ සැම ගරාජ් එකකම—සැම ඩෙපෝ එකකම—ස්ටොක් කරල තියෙන්න ඕනෑ. එසේ නොතිබීම නිසා තමයි, අපට මේ දුම් දමීම නවත්වන්න අමාරු වෙලා තියෙන්නෙ. ඒ වුවමනා උපකරණ අහස් යාත්රාවකින් හෝ ගෙනැවිත් සවි කර දෙන්නය කියා දැන් නියම කර තියෙනව.

අනියම් විධියට දුවන බස් නැවැත්වීම ගැන කොට්ටාවේ මන්ත්රීතුමා (ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.) ප්රශ්නයක් මතු කළා. ලංකා ගමනාගමන මණ්ඩල පණත යටතේ අපට බලයක් නැහැ, වාහනයක් වැන් රථයක් හැටියට දුවනව නම් ඒක ගැනීමට. බස් එකක් හැටියට බලපත්රයක් ඇතිව දුවවනව නම් අපට ඒ බස් ජනසතු කරන්න පුළුවන්. යාපනයේ බස් 175 ක් වැන් රථ හැටියට දුවවනව. අපේ ආදායම වැඩියෙන් යන්නෙ ඒ උදවියටයි. මේ වැන් 175 ම ගන්න ඕනෑය කියා මම කල්පනා කළා. නමුත් මට ඒකට බලයක් නැහැ. ඒ නිසා මම පණතට සංශෝධනයක් ඉදිරිපත් කරනව. එය සම්මත වුනාම කල්ලතෝනි බස් ටික අරගෙන නියම විධියේ ධාවනයක් ඇති කරන්න පුළුවන්. මේ විස්තරය ප්රමාණවත්ය කියා මම හිතනවා.

**ප්රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**කෙටුම්පත් පණත, ඊට අනුකූලව, දෙවන වර කියවන ලදී.**

**මතු පළ වන යෝජනාව සභාසම්මත විය :**

**"කෙටුම්පත් පණත පූර්ණ මන්ත්රී මණ්ඩල කාරක සභාවට පැවරිය යුතුය"—[ගරු අනිල් මූණසිංහ]**

**[කාරක සභාවෙහිදී]**

**කාරකසභා නියෝජ්ය සභාපතිතුමා මූලාසනාරූඪ විය.**

**1 වන වගන්තියේ සිට 7 වන වගන්තිය තෙක් කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

**ප්රඥප්ති වගන්තිය සහ නාමය කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

**කෙටුම්පත් පණත, සංශෝධන රහිතව, වාර්තා කරන ලදී.**

**මතු පළ වන යෝජනාව සභාසම්මත විය :**

**"කෙටුම්පත් පණත දැන් තුන්වන වර කියවිය යුතුය"—[ගරු අනිල් මූණසිංහ]**

**කෙටුම්පත් පණත, ඊට අනුකූලව, තුන් වන වර කියවා සම්මත කරන ලදී.**

## මෝටර් වාහන (සංශෝධන) පණත් කෙටුම්පත

## MOTOR TRAFFIC (AMENDMENT) BILL

**දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.**

**ගරු අනිල් මූණසිංහ**
*(கௌரவ அனில் முனசிங்க)*
(The Hon. Anil Moonesinghe)

කෙටුම්පත් පණත දැන් දෙවන වර කියවිය යුතු යයි මා යෝජනා කරනවා.

අ. භා. 6.6

**පී. ආර්. රත්නායක මයා.**
*(திரு. பீ. ஆர். ரத்நாயக்க)*
(Mr. P. R. Ratnayake)

ගරු නියෝජ්ය සභාපතිතුමනි, එය මම විස්තර කරන්නම්. 2, 3 හා 4 වන වගන්තිවල නීතියේ බලපෑම වනාහි, පනත යටතේ පිළිවෙළින් ලියාපදිංචි කිරීමේ ආදායම් බලපත්ර හා රිය පැදවීමේ බලපත්ර නිකුත්කිරීමේ කාර්යයන් සඳහා මෝටර් ට්රයිසිකල් වැන් රථ නම් වූ අලුත් වාහන පන්තියක් ඇති කිරීම සඳහා මෝටර් වාහන පණතෙහි 5, 26 හා 122 වැනි වගන්ති සංශෝධනය කිරීමයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. ආර්. රත්නායක මයා.]

5 වැනි වගන්තියෙහි නීතියේ බලපෑම වනාහි, මෝටර් කෝච් රථයක් හෝ ලොරියක් සඳහා රිය පැදවීමේ පරීක්ෂණයකින් පසු දෙනු ලැබූ රිය පැදවීමේ බල පත්‍රය මෝටර් ටිරයිසිකල් වැන් රථ සඳහා වලංගු කිරීම අත්හැරවීම සඳහා මෝටර් වාහන පණතෙහි 128 වැනි වගන්තිය සංශෝධනය කිරීමයි.

6 වැනි වගන්තියෙහි නීතියේ බලපෑම වනාහි, මෝටර් වාහන පණතෙහි 240 වෙනි වගන්තියෙහි අර්ථ දැක්වීම් සම්බන්ධයෙන් අවශ්‍ය සංශෝධන කිරීමයි.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**කෙටුම්පත් පණත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.**

**මතු පළ වන යෝජනාව සභාසම්මත විය :**

"කෙටුම්පත් පණත පූර්ණ මන්ත්‍රී මණ්ඩල කාරක සභාවට පැවරිය යුතුය"—[ගරු අනිල් මූණසිංහ]

**[කාරක සභාවෙහිදී]**

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ විය.**

CLAUSE 1. (*Short title and date of Operation*).

**රෝයි රාජපක්ෂ මයා.**
*(திரு. ரோய் ராஜபக்ஸ)*
(Mr. Roy Rajapakse)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇමතිතුමාගෙන් මා එකක් අහන්න කැමතියි. මේ මෝටර් එක්සැමිනර්ලා කියන උදවිය ගෙන් අපේ ඩ්‍රයිවර්වරුන්ට ලොකු කරදරයක් තිබෙනව. හැමෝගෙන්ම ඇහුවොත් කියන්නෙ රුපියල් පන්සියය, දහ ආදී වශයෙන් අල්ලස් දෙන්නට ඕනෑය කියලයි. බස් ලයිසන්ස් එකකට රුපියල් 100 යි. කාර් ලයිසන්ස් එකකට රුපියල් 500 යි. මේ මෝටර් ටිරයිසිකල් එකට ලයිසන්ස් දෙන විටත් පගාව ගන්න ගියොත් අපේ දුප්පත් මිනිහාට හිඟා කන්ට වෙනව. එම නිසා ගරු ඇමතිතුමා කරුණා කර මේ ගැන සොයා බලන්න. "ප්ලයින් ස්කෝඩ්" එකක්වත් තියා මේ අය අල්ලා ගෙදර පිටත් කළොත් මේ අල්ලස ටිකක්වත් වළක්වන්න පුළුවන් වේවි.

**ගරු අනිල් මූණසිංහ**
*(கௌரவ அனில் மூனசிங்க)*
(The Hon. Anil Moonesinghe)

ඒ ගැන පිළිතුරක් දෙන්නට මා කැමතියි. අපි මේ මාසයේ පළමු වැනිදා සිට මෝටර් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සම්පූර්ණයෙන්ම ප්‍රතිසංවිධානයක් ඇති කර තිබෙනව. ඩී. ආර්. ටී. ඕ. කියන ප්‍රාදේශීය ගමනාගමන නිලධාරි මහත්වරුන් කියන කොටස සම්පූර්ණයෙන්ම ඉවත් කර තිබෙනවා. එසේ ඉවත් කර ප්‍රාදේශීය ගමනාගමන කන්තෝරු සියල්ලම වසා තිබෙනව. එසේ කර එක්සැමිනර් මහත්වරුන්ව දිසාපතිවරුන් යටතේ වැඩ කරන්නය කියා පත් කර තිබෙනව. ඊළඟට දිසාපතිවරයයි, උප දිසාපතිවරයයි, උප කොමසාරිස්වරුන් හැටියට රථවාහන දෙපාර්තමේන්තුවේ උප කොමසාරිස්වරුන් හැටියට, අප පත් කර තිබෙනව. එතකොට ඒ උදවියගෙ සැලකිල්ල ඇතිව තමයි මේ දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය වැඩ කටයුතු ඉදිරියට ගෙන යන්නෙ. තවත් එකක් අපි බලාපොරොත්තු වෙනව. දැන් සිටින කොමසාරිස්තුමාට නියම කර තිබෙනව මේ මාසය තුළදී සෑම කච්චේරියකටම ගොස් මේ ප්‍රතිසංවිධාන අනුව මණ්ඩලයක් පත් කරන්නය කියා. එතකොට මෙම බලපත්‍ර දීමේ මණ්ඩලය කින් පරීක්ෂණ පැවැත්වූවාට පසුවයි බල පත්‍ර දෙන්නට යන්නේ. සමහර විට බල පත්‍ර නොදී ඉන්නටත් පුළුවනි. නමුත් පගා දීල නම් බලපත්‍ර ගන්නට අමාරු වෙනව. මොකද ? සාමාන්‍යයෙන් රුපියල් සියයක් හෝ දෙසීයක්—

**රෝයි රාජපක්ෂ මයා.**
*(திரு. ரோய் ராஜபக்ஸ)*
(Mr. Roy Rajapakse)

ඊටත් වැඩියි.

**ගරු අනිල් මූණසිංහ**
*(கௌரவ அனில் மூனசிங்க)*
(The Hon. Anil Moonesinghe)

මම කිව්වෙ අපේ පළාත්වල පවතින තත්වය ගැනයි. සමහර විට ලොරියකට බලපත්‍රයක් ගන්න නම් රුපියල් 250හේ සිට 300 දක්වා මුදලක් දෙන්න වෙනව. ටිරයිසිකල්වලට කොයි තරම් දෙන්න වෙනවද කියල මම කියන්න දන්නෙ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නැහැ. නමුත් අප බලාපොරොත්තු වන ප්‍රතිසංවිධානය කළාට පසු මේවා සියල් ලක්ම නවත්වන්නට පුළුවන් වෙයි. ප්‍රදේශය භාර පොලිස් නිලධාරිතැනත්, දිසාපති තුමා කැමති නිලධාරියකුත් නිල නොලත් පරීක්ෂකවරයකු හැටියට—මෙම ප්‍රතිසංවිධානය යටතේ බලපත්‍ර නිකුත් කිරීමේදී ඒ ගැන සෝදිසි කර බැලීමේ නිලධාරීන් ලෙස පත් කරන්න පුළුවන් වෙයි. මේ අන්ද මට කරන ප්‍රතිසංවිධානය සතුටුදායක නැතිනම් කරුණා කර දන්වන්න. එවිට ඒ ගැන වෙනත් වැඩ පිළිවෙලක් යොදන්නට හැකි බව මේ අවසථාවේදී දන්වන්න කැමතියි.

**රෝයි රාජපක්ෂ මයා.**
*(திரு. ரோய் ராஜபக்ஸ)*
(Mr. Roy Rajapakse)

බස් රථයකට රියදුරු බලපත්‍රයක් ලබා ගැනීම සඳහා දැනට කුලියට බස් රථයක් අරගන්න වෙනව. පැය කීපයකට ගන්න වුණත් රුපියල් පන්සියයක තරම් මුදලක් කුලී වශයෙන් ගෙවන්න වෙනව. දුප්පත් උදවියට මේ නිසා ලොකු අමාරුවකට මුහුණ පාන්න අද සිදු වී තිබෙනව. එම නිසා බස් රථයකට රියදුරු බලපත්‍රයක් ලබාගැනීමට වුවමනා වුණු විට සී. ටී. බී. එකෙන් බස් රථයක් ලබාගැනීමට හැකි වන විදියට යම් වැඩ පිළිවෙළක් සකස් කර දෙනවා නම්, ඒ දුප්පත් උදවියට ලොකු සහනයක් එයින් සැලසෙනව.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

ප්‍රතිසංවිධානය පිළිබඳ ප්‍රශ්නයක් මතු වී තිබෙන නිසා මේ කාරණය ගරු ඇමති තුමාට ඉදිරිපත් කරන්න කැමතියි. ප්‍රතිසංවිධානය නිසා කෙනෙකුට බලපත්‍රයක් ලබා ගැනීම සඳහා, බණ්ඩාරවෙල කෙනෙකුට නම් බදුල්ලට යන්න වෙනව මොකද? ප්‍රතිසංවිධානය යටතේ දිසාපතිතුමාගේ මාර්ගයෙන් එය ලබාගත යුතු නිසා. එත කොට බණ්ඩාරවෙල අවට ප්‍රදේශවල උදවියට විශාල වියදමක් දරමින් බදුල්ලෙ තිබෙන මධ්‍යස්ථානයට යන්න සිදු වෙනව. එම නිසා ප්‍රදේශයේ ජනතාවගේ පහසුව සඳහා, විශේෂයෙන්ම බණ්ඩාරවෙල, වැල්ලවාය, වැලිමඩ, හපුතලේ ආදී ප්‍රදේශවල ජනතාවගේ පහසුව තකා අඩු ගණනේ මාසයකට දින 10 ක් හෝ 15ක් එම ප්‍රදේශවලින් බලපත්‍ර ලබාගැනීමට පහසුකම් සැලසුවොත් එය ඉතාමත්ම හොඳ දෙයක් ලෙස පෙන්නා දෙන්න පුළුවන්. ඒ කාරණාව ගැන ගරු ඇමතිතුමාගේ විශෙෂ සැලකිල්ල යොමු වෙනවා ඇත කියා මම බලාපොරොත්තු වෙනව.

**ගරු අනිල් මූණසිංහ**
*(கௌரவ அனில் முனசிங்க)*
(The Hon. Anil Moonesinghe)

මම වැලිමඩ ගරු මන්ත්‍රීතුමාට (කේ. එම්. පී. රාජරත්න මයා.) කෘතඥ වෙනවා මෙවැනි වැදගත් අදහසක් ඉදිරිපත් කිරීම ගැන. ඇත්ත වශයෙන්ම අප කල්පනා කරනව, ඒ ඒ ප්‍රදේශයේ ආදායම් නිලධාරි මහතුන්ගේ කාර්යාලවල යම්කිසි දිනයක් නියම කර ගන්නට වැඩ පිළිවෙළක් යොදන්නට.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

ඒක වැඩිය හොඳයි.

**ගරු අනිල් මූණසිංහ**
*(கௌரவ அனில் முனசிங்க)*
(The Hon. Anil Moonesinghe)

ඊළඟට හක්මන මන්ත්‍රීතුමා (රෝයි රාජපක්ෂ මයා.) ප්‍රශ්නයක් නැගුවා, බස් රියදුරු බලපත්‍ර ලබා ගැනීම සඳහා ලංගම යට අයත් බස් සපයන්ට නොහැක්කේ මන්ද කියා. මේ ගැන අප බොහෝ දුර කල්පනා කර තිබෙනව. දැනටමත් දුප්පත් අයගෙන් පැමිණිලි රාශියක්ම ලැබී තිබෙනවා, ඒ අයට බස් රථයක් ලබා ගැනීම සඳහා රුපියල් 50 ක් 100 ක් ගෙවන්න සිදු වී තිබෙනවාය කියා. නමුත් දුප්පත් අයට එපමණ මුදලක් ගෙවා බස් රථයක් ලබා ගන්නට අමාරුයි කියා පැමිණිලි කර තිබෙනව. මේ පිළිබඳව මම ලංගම නිලධාරි මහතුන් සමග සාකච්ඡා කළ විට මේ අවස්ථාවේදී එවැන්නක් කිරීමට අමාරු බව පෙනී ගියා. මන්ද? අප පාවිච්චියට ගත හැකි සෑම බස් රථයක්ම ධාවනය සඳහා යොදවාලයි තිබෙන්නෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු අනිල් මූණසිංහ]

කෙසේ වුණත්, ඉදිරි කාලයේදී මෙය ක්‍රියාත්මක කරන්නට පුළුවන් වෙනවා ඇත කියා අප බලාපොරොත්තු වෙනව.

**වගන්තිය කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**1 වන වගන්තිය කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදි.**

**2 වන වගන්තියේ සිට 6 වන වගන්තිය තෙක් කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදි.**

**ප්‍රඥප්ති වගන්තිය සහ නාමය කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදි.**

**කෙටුම්පත් පණත, සංශෝධන රහිතව වාර්තා කරන ලදි.**

**ගරු අනිල් මූණසිංහ**
*(கௌரவ அனில் முனசிங்க)*
(The Hon. Anil Moonesinghe)

"කෙටුම්පත් පණත දැන් තුන්වන වර කියවිය යුතුය" යි මම යෝජනා කරනවා.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**කෙටුම්පත් පණත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදි.**

**ගරු අනිල් මූණසිංහ**
*(கௌரவ அனில் முனசிங்க)*
(The Hon. Anil Moonesinghe)

ගරු සභාපතිතුමනි, අංක 11 දරන යෝජනාව ඉදිරිපත් නොකර අංක 12 දරන යෝජනාව ඉදිරිපත් කිරීමට අවසර දෙන ලෙස ඉල්ලනව.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

මම ඒකට විරුඩ වෙනව. ඇත්ත වශයෙන්ම අපේ උපකාරය ඇතුව පණත් ගණනාවක්ම මේ ගරු සභාවෙදි අද දින සම්මත කරගත්ත. එසේ සම්මත කර ගැනීමට අප කිසි අන්දමකින් අකුල් හෙළීමක් කළේ නැහැ. නමුත් අවශ්‍ය එක ඇමතිවරයකුවත් මේවා ඉදිරිපත් කරන්නට නැහැ. එහෙම තිබෙද්දී මෙම යෝජනාව පමණක් ඉවත් කර අනික් යෝජනා ඉදිරිපත් කරන්නට ඉඩ දුන් නොත්, ඉක්මනින් ඉතාමත් වැදගත් වන 17 වන යෝජනාවට එනවා; අංක 17 දරණ පනතට එනව. මොකද? ඊට කලින් ඇති යෝජනා, එහෙම නැත්නම් පණත්, ගැන ඒ තරම් දුරට සාකච්ඡා වෙන්නෙ නැති නිසා. නුවරඑළියෙ ගරු මන්ත්‍රීතුමා (ටී. විලියම් ප්‍රනාන්දු මයා.) ඉඩම් අත්පත් කර ගැනීම ගැන. මෙම ගරු සභාවෙදි මතක් කළා. ඇත්ත වශයෙන් මේ කාරණය ප්‍රමාද වෙනව වැඩියි. ඇමතිතුමා නැති නිසා අදත් මෙය ප්‍රමාද වෙනව. දැන් මේකට ඉඩ දුන්නොත් 17 වැනි පණතට පැය බාගෙන් එනව. මේ අනිත් ඒවා සම්මත කරන්න පැය බාගයකට වඩා ගත වන්නෙ නැහැ. අපි උපකාර කරන්න සතුටුයි, නමුත් ආණ්ඩුවට වුවමනා නැහැ අපේ ඒ උපකාරය ලබා ගන්න. ඇමතිවරුන් නැති වීමෙන් පෙනෙන්නෙ ඒකයි. අපට කරන්න දෙයක් නැහැ.

**ගරු මන්ත්‍රීවරු**
*(கௌரவ அங்கத்தினர்கள்)*
(Hon. Members)

ප්‍රවාහණ ඇමතිතුමා සිටින නිසා ඒ පණත් සම්මත කරමු.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

ඒව හෙට ගන්න පුළුවන්. මේ ඔක්කොම අපි හෙට සම්මත කරමු. ඒ නිසා, ඇමතිවරුන් නැති නිසා කල්තැබීමේ යෝජනාව ඉදිරිපත් කරන්න. හෙට අපි මේව ඔක්කොම සම්මත කරල දෙන්නම්. ප්‍රමාද කරන්නට මෙතන එක පණතක් වත් නැහැ. නමුත් ඇමතිවරු නැති නිසා ඉක්මනින් සම්මත කරන්න වුවමනා දේවල් සම්මත වෙන්නෙ නැහැ.

**ගරු මන්ත්‍රීවරු**
*(கௌரவ அங்கத்தினர்கள்)*
(Hon. Members)

17 වැනි යෝජනාවට ආවම නවත්වමු.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

ඒක කරන්න අපි කැමති නැහැ. 17 වැනි යෝජනාවට ඇවිත් නැවැත්වීමෙන් වැඩක් නැහැ. හේතුව 17 වැනි යෝජනාව

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

දැනටමත් දවස් ගණනක් සම්මත කරන්න ප්‍රමාද වී තිබීමයි. ගිය සතියෙ මේක සම්මත කරගන්න තිබුණා. අපි උදව් කරන්න සතුටුයි, නමුත් ඇමතිවරු නැතිව කොහොමද මේව ගැන සාකච්ඡා කරන්නෙ? ඒ නිසයි අප විරුද්ධත්වය පාන්නෙ. සම්මත කරන්නට වුවමනා දේවල් සම්මත වෙන්නෙ නැහැ. අඩුපාඩු කම් තිබුණත් වැදගත් ජාතික දේවල් සම්මත වෙනවා නම් අපිත් සතුටුයි. තියෙන තත්ත්වයට වඩා ටිකක් හරි හොඳ නිසා අපි ඒව සම්මත කර දෙනව.

**ගරු අනිල් මුණසිංහ**
*(கௌரவ அனில் முனசிங்க)*
(The Hon. Anil Moonesinghe)
12 යි 14 යි ගනිමු.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)
ඇමතිතුමාට අවශ්‍ය නම්, මේකටත් එකඟ වෙනවා නම්, 12, 14 යන ඒව ගනිමු. 12, 14 සම්මත වූ හැටියෙම කල්තැබීමේ යෝජනාව ඉදිරිපත් කරන්න ඇමතිතුමා එකඟ වෙනවද?

**ගරු අනිල් මුණසිංහ**
*(கௌரவ அனில் முனசிங்க)*
(The Hon. Anil Moonesinghe)
ඔව්.

# වරාය (නැව් බඩු) නීතිගත සංස්ථා (සංශෝධන) කෙටුම්පත් පණත

## PORT (CARGO) CORPORATION (AMENDMENT) BILL

දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.

අ. භා. 6.16

**පී. ආර්. රත්නායක මයා.**
*(திரு. பீ. ஆர். ரத்நாயக்க)*
(Mr. P. R. Ratnayake)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, "වරාය (නැව් බඩු) නීතිගත සංස්ථා (සංශෝධන) පණත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනව. ඒ සම්බන්ධයෙන් මා විස්තරයක් කරන්න සතුටුයි.

වරාය සංයුක්ත මණ්ඩලයේ රැකියාවන් පිළිබඳ හිමිකම් හා පාරිතෝෂිකයන් පිළිබඳ හිමිකම් තීරණය කැරෙන්නේ ප්‍රධාන පනතේ 60 වෙනි ඡේදයේ වගන්ති අනුවය. මුල් පනතේ 59 (1) දරණ වගන්තියේ ප්‍රකාර වරාය සංයුක්ත මණ්ඩලයීය කම්කරු විනිශ්චය සභාව 1962 සැප්තැම්බර් මස 1 වෙනි දින පිහිටුවන ලදී. එහෙත්, විනිශ්චය සභාවට හිමිකම් ඉදිරිපත් කිරීම තවදුරටත් කරගෙන යන බව පෙනෙන්නට ඇති අතර, එවැනි ඉල්ලීම් භාර ගැනීම සඳහා කිසියම් කාල සීමාවක් සඳහන් කර නොමැති බැවින් විනිශ්චය සභාවට අවිනිශ්චිත කාලයක් කටයුතු කිරීමට සිදු වෙතැයි යනු අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහසයි. එම නිසා, ප්‍රධාන පනතේ 60 වෙනි වගන්තිය සංශෝධනය කිරීමෙන් අදහස් කැරෙන්නේ, රජයේ ගැසට් පත්‍රයේ ඇමතිවරයා විසින් ප්‍රසිද්ධ කරනු ලබන දිනයකදී හෝ ඊට පළමු රැකියාවන් හා පාරිතෝෂිකයන් පිළිබඳ සියලු හිමිකම් සඳහා ඉල්ලීම් ඉදිරිපත් කළ යුතු බවයි. කාලසීමාවක් නියම කිරීමෙන් නියමිත කාලය නික්ම යැමට පළමු ස්වකීය ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීම සඳහා අව්‍යාජ හිමිකම් පෙන්වීම් පිළිගනු ඇත. මේ සංශෝධනය නිසා අනවශ්‍ය හා නාස්තිකර වියදම් ඉතිරි කර ගැනීමට සංයුක්ත මණ්ඩලයට පිළිවන්වනු ඇතැයි අදහස් කෙරේ.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

කෙටුම්පත් පණත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.

මතු පළ වන යෝජනාව සභාසම්මත විය:

"කෙටුම්පත් පණත පූර්ණ මන්ත්‍රී මණ්ඩල කාරක සභාවකට පැවරිය යුතුය."—[ගරු අනිල් මුණසිංහ]

[කාරක සභාවෙහිදී]

කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ විය.

1 වන වගන්තිය සහ 2 වන වගන්තිය කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කෙටුම්පත් පණත, සංශෝධන රහිතව, වාර්තා කරන ලදි.

ගරු අනිල් මූණසිංහ
*(கௌரவ அனில் முனசிங்க)*
(The Hon. Anil Moonesinghe)

"කෙටුම්පත් පණත දැන් තුන්වන වර කියවිය යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

කෙටුම්පත් පණත, ඊට අනුකූලව, තුන්වන වර කියවා සම්මත කරන ලදි.

## ගුවන් ගමනාගමන (සංශෝධන) පණත් කෙටුම්පත

## AIR NAVIGATION (AMENDMENT) BILL

දෙවනවර කියවීමේ නියෝගය කියවන ලදි.

ගරු අනිල් මූණසිංහ
*(கௌரவ அனில் முனசிங்க)*
(The Hon. Anil Moonesinghe)

"ගුවන් ගමනාගමන (සංශෝධන) පණත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදි.

අ. භා. 6.18

කේ. එම්. පී. රාජරත්න මයා.
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලංකා ගුවන් සේවා සංස්ථාව ගැන මට කාරණයක් මතක් කරන්න තියෙනවා .

ගරු අනිල් මූණසිංහ
*(கௌரவ அனில் முனசிங்க)*
(The Hon. Anil Moonesinghe)

ඒක මේකට එන්නෙ නැහැ. නමුත් මම පිළිතුරු දෙන්නම්.

කේ. එම්. පී. රාජරත්න මයා.
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

ඇමතිතුමා දන්නවා, ලංකා ගුවන් සංස්ථාවේ දූෂණ ගැන සොයා බැලීම සඳහා ජේ. පී. ඔබේසේකර වාර්තාවෙන් පසුව, ඇමතිතුමාගේම පක්ෂයේ උදවිය, වැල්ලවත්ත-ගල්කිස්සෙ ගරු මන්ත්‍රීතුමා, (ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා) රත්නපුරේ ගරු මන්ත්‍රීතුමා (ඩී. පී. ආර්. වීරසේකර මයා.) සහ ඇමතිතුමාගේ සහෝදරයෙක් ඇතුළු කාරක සභාවක් පත් කළා ගුවන් සංස්ථාවේ නොයෙකුත් දූෂණ තිබෙනවා. ජේ. පී. ඔබේසේකර පාර්ලිමේන්තු ලේකම්තුමාගේ වාර්තාව හොඳ වාර්තාවක්ය කියා අපි පිළිගන්නවා. හොඳට මහන්සි වී කරුණු සොයා බලලයි ඒ වාර්තාව සකස් කළේ. හවුල් ආණ්ඩුව ඇති වුණාට පසුවත් වර්තමාන ඇමතිතුමාගෙ පක්ෂයෙන් කාරක සභාවක් පත් කළා. එම කාරක සභාවත් අර වාර්තාව අනුමත කළා. ඊට පසුව ඔබේසේකර කාරක සභාවෙ හිටපු මහත්වරු දෙදෙනෙක්—එයාර් සිලෝන් සංස්ථාවෙ අබේකෝන් මහතා සහ ද මෙල් මහතා—වාර්තාවක් ඉදිරිපත් කළා, එහි සමහර නිගමනයනට ඒ අය එකඟ නැත කියා. පත්‍රවල පළ වූ ආරංචිවල හැටියටයි, මා එසේ කීවෙ. එහෙම එකක් නැතිනම්, මම එය ඉල්ලා අස් කර ගන්නවා. මගේ තර්කයට එම කරුණු අවශ්‍ය වන්නෙත් නැහැ.

යථෝක්ත වාර්තාවෙන් එහි කෙරෙන දූෂණ ගණනාවක් හෙළි කොට තිබුණා. ගරු ඇමතිතුමත් පිළිගන්නව ඇති, එහි දූෂණ තිබෙන බව. නමුත් අද වනතුරු කර තිබෙන්නෙ මොනවද කියා මා එතුමගෙන් ප්‍රශ්න කරනවා. එයාර් සිලෝන් සංස්ථාවෙ දූෂණ කටයුතු කරන අය තවත් සිටිනවා. විනිමය මුදල් වංචාවක් පිළිබඳව එතන සිටින ගණකාධිකාරි තැනට විරුද්ධව බරපතල චෝදනාවක් ඉදිරිපත් කර තිබෙනවා. එය සාමාන්‍ය වරදක් නොවෙයි; දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම් ලැබියයුතු වරදක්. එම චෝදනාව හරිය කියා ජේ. පී. ඔබේසේකර වාර්තාවෙනුත් කියනවා. එම වාර්තාවෙන් කියා නැහැ, එම චෝදනාව වැරදිය කියා. එම වැරදිකාරයා තවමත් ඉන්නවා, එතන. එහි සාමාන්‍යාධිකාරි තැන ගැනත් නොයෙකුත් දේ සඳහන් කර තිබෙනවා. නමුත් ඔහු තවමත් සේවයෙ යෙදෙනවා. මේවා පිළිබඳව ගරු ඇමතිතුමා මොනවද කළේ ? ඇයි, තමුන්නාන්සෙ නිශ්ශබ්දව සිටින්නෙ ? ඉහළින් කෙරෙන බලපෑම් නිසාද, නිශ්ශබ්දව සිටින්නෙ ? සාමාන්‍යාධිකාරි තැන සමග ලොකු ඥාති සම්බන්ධකමක් තියෙන නිසාද ? බලපුළුවන්කාරකම් තිබෙන නිසාද ? උසස් තැන්වලට ඥාති සම්බන්ධකම් තියෙන බලපුළුවන්කාරකම් ඇති අය මොන වරදක් කළත් ඊට සුදු හුණු ගෑමද, හවුල් ආණ්ඩුවෙ අළුත් ප්‍රතිපත්තිය ? තමුන්නාන්සෙ කියනවද, ජේ. පී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඔබේසේකර වාර්තාව වැරදියි කියා ? එම සංස්ථාවෙ කිසිදු දූෂණයක් නැත කියා තමුන්නාන්සෙ කියනවද? එසේ නම් ප්‍රශ්නයක් නැහැ. එසේ නම් විනයානුකූලව ක්‍රියා කරන්න වුවමනාවකුත් නැහැ. එසේ නැතුව එය හරිය කියා තමුන්නාන්සෙ පිළිගන්නව නම්, නිසියාකාර වැඩ කටයුතු කරන්න ඕනැ. අද වන තුරු මේ ගැන වැඩ කටයුතු කරල නැහැ. එම නිසා තමුන්නාන්සෙට ප්‍රශංසා කරන්න බැහැ. තමුන්නාන්සෙ අළුත් නිසා තව ටිකක් කල් දෙනව, මේව ගැන සොයා බලන්න. තමුන්නාන්සෙට පහරගසන්නෙ නැහැ, එම නිසා. නමුත් තමුන්නාන්සෙට තදින් දෝෂාරෝපණය කරනව. තමුන්නාන්සෙ මේව ගැන අනුගමනය කරන වැඩ පිළිවෙළ කුමක්ද කියා කරුණා කර අපට දන්වන්න ඕනැ.

අ. භා. 6.22

**ඇල්බට් මයා.**
*(திரு. அல்பேட்)*
(Mr. Albert)

වැලිමඩ ගරු මන්ත්‍රීතුමාගෙ (කේ. එම්. පී. රාජරත්න මයා.) කතාවෙන් ප්‍රශ්නයක් උද්ගත වෙනව. නැදෑකම් නිසා මේවායෙ කෙරෙන දූෂණ වහනවය කියනව. මේ සම්බන්ධයෙන් යමක් කියන්න ඕනැ. " උසස් තැන්වලට නෑදෑකම් තියෙන අය සමාජයෙන් සම්පූර්ණයෙන්ම අයින් කර මඩේ ඔබා තියන්න ඕනැ " කියන විධියෙ මඩ ගැසීමක් දැන් පවතිනව. එම චෝදනාව නිතර නිතර එල්ල කරන්න එපාය කියා මා එතුමාට කියනව. උසස් තැන්වලට නෑදෑකම් තියෙන අයට, මේ ගරු සභාවෙ මන්ත්‍රීවරුන්ට නෑදෑකම් තියෙන අයට, රැකී රක්ෂා කරන්න නරකද ? ඒ අයට උසස් තනතුරු දරන්න නරකද ? [බාධා කිරීම්] ජේ. පී. ඔබේසේකර වාර්තාවෙන්—

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

තමුන්නාන්සෙට තේරී නැහැ.

**ඇල්බට් මයා.**
*(திரு. அல்பேட்)*
(Mr. Albert)

ජේ. පී. ඔබේසේකර වාර්තාවෙන් වරදක් කියා නැහැ; හරිය කියාත් නැහැ. දූෂණ තිබෙනවාය කියන එක ඇත්ත. ඒව හරිය කියල නැහැ. කවුරු කෙසේ කීවත්, මේවා පිළිබඳව මධ්‍යස්ථ ලෙස කල්පනා කර බලා සාධාරණ ලෙස සේවකයන්ට සලකන්නය කියා මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලනව.

අ. භා. 6.24

**විලියම් ප්‍රනාන්දු මයා.**
*(திரு. வில்லியம் பெர்னாண்டோ)*
(Mr. William Fernando)

ගුවන් ගමන් පිළිබඳව වචන ස්වල්පයක් කියන්න තියෙනව. කාලයක පටන්ම නුවරඑළියට ගුවන් ගමන් පහසුවක් සලසා දෙන ලෙස ඉල්ලනව. නුවරඑළියට ගුවන් ගමන් සේවයක් දුන්නොත් එය විශාල වශයෙන් ධනය උපයන්න පුළුවන් ව්‍යාපාරයක් වෙනව ඇති. අද ලංකාවට පැමිණෙන දේශ සංචාරකයන් විශේෂයෙන්ම නුවරඑළියට යනව ඇති, එවැනි සේවයක් පවතිනව නම්. වැඩි වශයෙන් නැව්වලින් පැමිණෙන එම සංචාරකයන් නුවරඑළියට ගොස් එහි රැඳී සිටීම නිසා විශාල මුදලක් උපයා ගන්න අපට හැකි වෙනව ඇති. අප බලාපොරොත්තු වන්නේ හැම පරිශ්‍රමයක්ම යොදා විදේශ සංචාරකයින් වැඩි වැඩියෙන් මේ රටට ගෙන්වා ගෙන අපේ රටට පිටරට ධනය ඇද ගැනීමටයි. සවභාව ධර්මයා විසින් අපේ ලංකා ද්වීපයට දී තිබෙන වරප්‍රසාදයන් වන ඉතා අගනා සෞන්දර්යය නැරඹීමට ආශාවක් දක්වන පිටරටියන් නැව්වලින් අපේ මේ කුඩා දිවයිනට නිතර නිතර පැමිණෙන නමුත්, ගමන් පහසුකම් නැති නිසා ඒ අයට තිබෙන කෙටි කාල සීමාව තුළ නුවරඑළිය වැනි ප්‍රදේශවලට යන්න ලැබෙන්නෙ නැහැ. අපේ රටේ තිබෙන වාහනවලින් කෙටි දුර ප්‍රමාණයක් පමණයි ගමන් කරන්න ඒ අයට අවස්ථාව ලැබෙන්නෙ. එසේ කෙටි දුරක් ගමන් කිරීමෙන් මේ රට ගැන පැහැදිලි වැටහීමක් ඇති කර ගන්න අමාරුයි. එහි ප්‍රතිඵලය මොකක්ද? කොළඹට නැව්වලින් පැමිණෙන විදේශිකයින් කොළඹ අවට තිබෙන පැල්පත් ආදිය බලා ආපසු සිය මව්රටවලට ගියාම තමන් දුටු දේ පමණයි කියන්න වෙන්නෙ. ඒ අනුව අපේ රට ගැන වර්ණනා කිරීමට දෙයක් නැති වෙනවා. ඒ නිසා බොහෝ දෙනෙක් කල්පනා කරන්නේ ලංකාව ඉතාම නොදියුණු, කිසිම හරයක් නැති රටක් හැටියටයි. ඒ නිසා කෙටි කාලයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විලියම් ප්‍රනාන්දු මයා.]

තුළදී නුවරඑළියට යාමට පහසුකම් ඇති කිරීම ඉතාම අවශ්‍යයි.

නුවරඑළියේ මූන් ප්ලේන් නැමැති ප්‍රදේශය ගුවන් තොටුපොළක් සඳහා තෝරා ගන්න පුළුවන් නිසා එහෙන් බිම් කොටසක් ගැනීම සම්බන්ධයෙන් 1957 සිට යෝජනා කර තිබෙනවා. ඒ ගැන කල්පනා කර බලා ඉතා ඉක්මනින් ඒ ඉඩම වෙන් කර තබන්න ඕනෑ. දැන් දැන් ඒ ඉඩමේ වෙනත් වෙනත් ගොඩනැගිලි හැදීගෙන එනවා. බෞද්ධසාර මහත්මයත්, මහවත්තේ මහත්මයත් එලවලු විය ලන කර්මාන්ත ශාලාවක් ඒ බිම් ප්‍රදේශයේ හදා තිබෙනවා. බැංකුවෙන් ණය මුදලකුත් ලබාගෙනයි ඒ කර්මාන්ත ශාලාව ආරම්භ කරන්නෙ. ඔය විධියට පෞද්ගලික කර්මාන්තශාලා ඇති කිරීමෙන් මතුවට ඇති විය හැකි භයානක ප්‍රතිඵල ගැන හිතන්න ඕනෑ. අවසානයේදී යම් දවසක ගුවන් තොටුපළක් හදන්න යන විට ඒ බිම් ප්‍රදේශය ගන්න ගියාම ඒ උදවියට වන්දියකුත් ගෙවන්න වෙනවා. දැන්ම මේ බිම් ප්‍රදේශය සීමා නොකළොත් ඒකයි වෙන්නෙ. ගුවන් තටාකයක් හදන්න බලාපොරොත්තු වෙනවා නම් ඒ සඳහා අපට පිටරටවලින් ආධාර පවා ලබා ගන්න ඉඩ තිබෙනවා. දීර්ඝකාලීන වැඩ පිළිවෙලක් අනුව මෙය කිරීම සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවන්න ඕනෑ. එසේ කළොත් අපට සහයෝගය දෙන්න ඉදිරිපත් වෙන්න පුළුවනි. පසුගිය කාලයේ තිබුණු ලෝක තත්ත්වය දැන් සම්පූර්ණයෙන්ම වෙනස් වෙලයි තියෙන්නෙ. නවීන විද්‍යාව අතින් ලෝකය මේ තරම් උසස් දියුණුවක් නොලබා තිබුණු පසුගිය කාලයේදී අහස් යානයක් ඉහළට නැගීමට පෙර සැතපුමක් නැත් නම් ඊට වැඩි දුර ප්‍රමාණයක් ධාවනය කරන්න සිදුවුණා. එහෙත් දැන් ගුවන් යාත්‍රාවක් අහසට නැගීමට පෙර ඊට වඩා කෙටි දුර ප්‍රමාණයක් පමණයි ධාවනය කළ යුතුව තිබෙන්නෙ. දැන් ඒ තරම් පහසුකම් තිබෙනවා. ඒ නිසා පරණ මිනුම් අද සම්පූර්ණයෙන්ම ඒ ආකාරයටම තිබෙන්න වුවමනාවක් නැහැ. පරණ මිනුම් අනුවම අදත් වැඩ කරන්න යනවා නම් ඒක වැරදියි.

ලෝකයේ යම් දවසක ගුවන් ගමන් ආරම්භ වුණා නම් එය මුලින්ම ආරම්භ වුණේ නුවරඑළියේ බව වාර්තාගත වෙලා තියෙනවා. රාවණා කාලේ දඬු මොනර යන්ත්‍රයකින් අහසේ ගමන් බිමන් කළ බවට කථා ප්‍රවෘත්තියක් තිබෙනවා. ඒ අනුව කල්පනා කරන විට අද නුවරඑළියේ ගුවන් තටාකයක් නැති වීම එක් අතකින් අවනම්බුවක් හැටියට සලකන්න පුළුවනි. සීතා දඬු මොනර යන්ත්‍රයකින් ගමන් කළ බව කියාපාන කථාව සත්‍යයක් නම් ලෝකයේ පළමුවෙන්ම ගුවන් තටාකයක් ඇති කළ යුතුව තිබුණේත් නුවරඑළියේ බව කියන්න පුළුවනි. නුවරඑළියට ගුවන් තටාකයක් නොතිබීම ගැන මා කණගාටු වෙනවා. මෙය තව දුරටත් අතපසු වීම ඊටත් වඩා කනගාටුදායකයි.

ගරු අගමැතිනිය දේශ සංචාරක ගමන් පහසුකම් සඳහා කටයුතු කරනවා. සමහර විට පසුගිය කාලයේ දී පිටරට ගිය අවස්ථාවල එතුමියට දකින්න ලැබෙන්න ඇති විදේශීය ධනය අපේ රටට අද ගැනීමට කළ යුතු එක් දෙයක් නම් දේශ සංචාරකයින්ට අපේ රට නැරඹීමට පහසුකම් දීමේ වටිනාකම. මේ සම්බන්ධයෙන් ස්විට්සර්ලන්තය වැනි රටවල් වැඩ කරන ආකාරය අපට ආදර්ශවත් වෙන්න පුළුවනි.

අපේ රට විශාල එකක් නොවෙයි. හතරදස් සැතැපුම් විසි පන්දාස් ගණනක් පමණයි අපේ රටේ විශාලත්වය. අපේ රට තුළ නොයෙක් අන්දමේ දේශගුණ කලාපවලට අයිති ප්‍රදේශ තිබෙනවා. විවිධ කාලගුණයන් ඇති ප්‍රදේශවලට යාමට ගත වෙන්නෙ ඉතා කෙටි කාලයක් පමණයි. වැඩි උෂ්ණත්වයක් තිබෙන සර්ම කලාපික දේශගුණයක් තිබෙන ප්‍රදේශයක් පසුකර සම ශීතෝෂ්ණ දේශගුණයක් තිබෙන තැනකට යාමට ගත වෙන්නෙ ඉතා සුළු වෙලාවක් පමණයි. යා යුත්තේ ඉතා කෙටි දුර ප්‍රමාණයක් පමණයි. යුරෝපීය දේශගුණය ඇති නුවරඑළියට යාමට ඒ තරම් විශාල දුරක් යා යුතු නැහැ. ඒ තරම් දීර්ඝ කාලයක් යා යුතුත් නැහැ. එහෙත් ගමන් පහසුව නැති නිසා විදේශිකයන්' ඒවා බලන්න යන්නවත් කැමැත්තක් දක්වන්නෙ නැහැ. සති අන්තයක් ගත කිරීම සඳහාවත් සනීපදා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යක ප්‍රදේශවලට යන්න අද ලංකාවේ බොහෝ දෙනෙක් කැමැත්තක් නොදක්වන්නෙ ගමන් බිමත් ආදිය සම්බන්ධයෙන් යම් යම් අවහිරකම් තිබෙන නිසයි. ඒ සඳහා පහසුකම් ලබා දීමට මුදල් වැය කරන්න පුළුවනි. මුදල් තිබෙන අවස්ථාවකදී වැඩ පටන් ගැනීම සඳහා හෝ මේ ඉඩම් ප්‍රමාණය හැකි තාක් ඉක්මනින් වෙන් කර ආරක්ෂා කර ගන්නට නව ඇමතිතුමා ක්‍රියා කරනවා නම් අනාගතයේ දී මේ සඳහා වන්දි මුදල් ගෙවන්නට සිදු වන්නේ නැහැ. එම නිසා මේ ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා. ගරු ඇමතිතුමා 17 වැනිදා නුවරඑළියට ගිය විට "මූන් ප්ලේන්" හි අලංකාරය බලා මේ සඳහා ඉක්මනින් ක්‍රියා කිරීමට සූදානම් වෙනවා ඇතැයි බලාපොරොත්තුවෙන්ද, මේ සඳහා ගරු ඇමතිතුමාගේ අවධානය යොමු වේවායි ප්‍රාර්ථනා කරමින් ද මගේ කථාව අවසන් කරනවා.

අ. භා. 6.30

**ලක්ෂ්මන් ජයකොඩි මයා.** (දිවුලපිටිය)

*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி—திவுலுப் பிட்டிய)*

(Mr. Lakshman Jayakody—Divulapitiya)

Mr. Deputy Chairman, in the Obeyesekere Report there was a glaring instance of some of those who are checking out pilots in the Department of Civil Aviation not having the minimum qualifications to check out pilots who are in the Air Ceylon Service. In fact, it was clearly shown that some of them who had not got the minimum qualifications, even instrument rating, have been kept in charge of checking out pilots who have higher qualifications.

In cases of that nature, I think the Obeyesekere Report has given a definite method as to how that anomalous position can be cleared. I hope the Hon. Minister has taken some steps to see that that position, of people who have lesser qualifications trying out pilots who have higher qualifications, does not occur at all. I hope the Hon. Minister will clear that position.

අ. භා. 6.32

**රෝයි රාජපක්ෂ මයා.**

*(திரு. ரோய் ராஜபக்ஸ)*

(Mr. Roy Rajapakse)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැනට යාපනයෙහිත්, අම්පාරෙහිත්, අනුරාධපුරයෙහිත් ප්‍රාදේශීය වශයෙන් ගුවන් තොටුපළවල් තිබෙනවා. කලකට ඉහත කොග්ගලත් ගුවන් තොටුපළක් තිබුණා. නමුත් දැන් එය පාවිච්චි නොකරනවාදැයි මා දන්නේ නැහැ. ගුවන් තොටුපලක් සඳහා කොග්ගල හොඳ මදි නම්, කතරගම හෝ තිස්ස ප්‍රදේශයට ගුවන් තොටුපළක් ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

විදේශයකින් පැමිණි සංචාරකයන් පිරිසක් මට ඊයේ හමු වුණා. ලංකාවට පැමිණි මේදී මුහුණ පාන්නට සිදු වන කරදර ඔවුන් මට කීවා. ලංකාවට පැමිණි විට සියලුම ඇඳුම් ගළවා පරීක්ෂා කිරීමෙන් පසුවලු, යන්නට ඉඩ හරින්නේ. ඇත්තෙන්ම මේ විධියේ තත්ත්වයක් තිබුණොත් දේශ සංචාරකයන් ගෙන්වා ගැනීම පහසු වන්නේ නැහැ. මේ ගැන සොයා බලා මේ මාර්ගයෙන් ආදායමක් ලබා ගන්නට වුව මනා නම්, සැක නැති උදවියට හිරිහැර නොවන්නට විධිවිධාන යෙදුවොත් හොඳයි.

අ. භා. 6.34

**අමරනන්ද රත්නායක මයා.**

*(திரு. அமரானந்த ரத்ணயக்க)*

(Mr. Amarananda Ratnayake)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නුවරඑළියෙහි ගුවන් තොටුපලක් පිහිටුවීමේ අවශ්‍යතාව ගැන නුවරඑළියේ ගරු මන්ත්‍රීතුමා (පී. විලියම් ප්‍රනාන්දු මයා.) විසින් සඳහන් කරන්නට යෙදුණා. බදුල්ල ප්‍රදේශයේ ගුවන් තොටුපලක් පිහිටු වීම සඳහා ඉඩමක් සොයන ලෙස ඉල්ලීමක් කර තිබුණු හෙයින් ඒ සඳහා ඉඩමක් සොයා ගැනීම පිණිස රජයේ නිලධාරීන් මෙන්ම මන්ත්‍රීවරුන්ද උනන්දුවෙන් ක්‍රියා කළ බව මේ අවස්ථාවේදී මතක් කරන්නට කැමතියි. පහසුවෙන් ගුවන් තොටුපලක් ඇති කළ හැකි ඉඩම් දෙකක් දැනට සොයා තිබෙනවා. නුවරඑළිය ගුවන් තොටුපලක් පිහිටුවීමට සුදුසු ප්‍රදේශයක් හැටියට මා පිළිගන්නවා. ඒ වගේම බණ්ඩාරවෙල, දියතලාව, බදුල්ල යන අමතක කළ නොහැකි ප්‍රදේශද තිබෙනවා. රජයේ වැඩ දෙපාර්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගුවන් ගමනා ගමන (සංශෝධන) පනත් කෙටුම්පත

[අමරතන්ද රත්නායක මයා.]

මෙන්තුව භාර ඇමතිතුමා මා නියෝජනය කරන ප්‍රදේශයට ගිය අවස්ථාවේදී එහි එක්තරා ස්ථානයක් ගැන සඳහන් කර මින් ලෝකයේ කිසිම රටක ඒ තරම් අලංකාර ස්ථානයක් තමන් දැක නැති බව ප්‍රකාශ කළා. ස්විට්සර්ලන්තයේ ඇති අලංකාර ස්ථානවලටත් වඩා අලංකාර තැනක් හැටියට ඒ ගරු ඇමතිතුමා ඒ ස්ථානය හැඳින් වූ බව මට මතකයි. ඒ නිසා සංචාරක අංශය මගින් එහි සංචාරක බංගලාවක් සෑදීමටත් යෝජනා කළා. එම නිසා ඒ ප්‍රදේශයටත් මධ්‍යස්ථානයක් වන, බදුල්ල හා බණ්ඩාරවෙල යන නගරවලටද ආසන්න ඉඩම් දෙකක් දැන් ගුවන් තොටු පලක් පිහිටුවීම සඳහා සොයාගෙන තිබෙ නවා. ඒ ඉඩම් සම්බන්ධයෙන් දිසාපති වරයාගේ රපෝර්තුව ලැබුණු වහාම ක්‍රියා කොට ඌව ප්‍රදේශය සඳහා ගුවන් තොටු පලක් පිහිටුවන ලෙස මා ඉල්ලා සිටිනවා. මේ ගුවන් තොටුපල පිහිටු වුවහොත් අප ටත් බොහොම පහසුයි. හදිසියේ වුවත් ඒ ප්‍රදේශයේ සිට මෙහි එන්නට පුළුවනි. එපමණක් නොව දැන් ඒ ප්‍රදේශවල සිටින මහතුන්ට වුවත් හදිසියේ කොළඹ එන්ට සිදු වෙනව. එම නිසා ඒ ගුවන් තොටුපොළ තැනීම සම්බන්ධයෙන් ඇමතිතුමා ගන්න උනන්දුව හා උත්සාහය ගැන ප්‍රශංසා කර මින් ඉක්මනින් එය ඉටු කර දෙන ලෙස ඉල්ලනවා.

අ. භා. 6.35

**ගරු අනිල් මූණසිංහ**

*(கௌரவ அனில் மூனசிங்க)*

(The Hon. Anil Moonesinghe)

වැලිමඩ ගරු මන්ත්‍රීතුමා (කේ. එම්. පී. රාජරත්න මයා.) මතු කළ ප්‍රශ්නය මේ ශීර්ෂයට අයිති නැති වුණත්, පිළිතුරක් දෙන්ට ඕනෑ. ගුවන් සේවාවේ වැඩ කටයුතු රාශියක් ප්‍රතිසංවිධානය කරන්ට සිදු වී තිබෙනව. ඔබේසේකර වාර්තාව ක්‍රියාත්මක කළ යුතුය කියා මා පිළිගන්නවා. මා මේ ගැන විශේෂ කමිටුවක් පත් කර පරීක්ෂණයක් පැවැත්වූවා. ඒ කමිටුවේ වාර්තාවත් ජේ. පී. ඔබේසේකර වාර්තාව අනුමත කිරීමක් හැටියටයි, ඉදිරිපත් කළේ.

ඒම් ප්‍රතිසංවිධානයේදී නොයෙක් අමාරු කම්වලට මුහුණ පාන්ට සිදු වී තිබෙනව

—දෙවන වර කියවීම

කියන එක වහන්ට මා අදහස් කරන්නෙ නැහැ. ඒ ප්‍රතිසංවිධානයත් ටිකක් සුනංගු වී තිබෙනව. මන්ද? මගේ කල්පනාවේ හැටියට දැන් පවතින මණ්ඩලයට කටයුතු බහුල නිසා, තවත් වැඩ තිබෙන නිසා, ඒ මණ්ඩලයේ මහත්වරුන්ට මුළු කාලයම යොදවන්ට බැරි වී තිබෙනව, ලංකා ගුවන් සේවය ප්‍රතිසංවිධානය කරන්ට. ඒ නිසා මා බලාපොරොත්තු වෙනව, ඒ මණ්ඩලයෙන් ප්‍රතිසංවිධානයක් ඇති කරල මේ මාසයේ 20 වැනිදායින් පසු, මේ මස අවසාන වීමට මත්තෙන් ගුවන් සේවාවේ ප්‍රතිසංවිධාන යක් කරන්න. සමහර මහත්වරුන් සිටි නව, ඒ උදවියට යන්ට කියා නියම කර නව. තවත් උදවියටත් රක්ෂාව අහිමි වෙනවා කියා ප්‍රතිඥාවක් දෙනව, ලෑහැස්ති වී සිටින්න කියා. මන්ද? හුඟක් ලාභ පෙන් වන්ට නම් රක්ෂා දී තිබෙන උදවිය අස් කරන්ටයි, සිදු වී තිබෙන්නෙ. රැකිරක්ෂා ප්‍රශ්නය ඒ විධියට විසඳන්ට බැහැ.

ගාස්තු අඩු කර ලංකා ගුවන් සේවාවේ දේශීය සේවාවලින්, විශේෂයෙන්ම පල්ලෙහා මධ්‍යම පන්තියට හා කම්කරු පන්තියටත්, ගමන් කිරීමේ පහසුකම් ලබා දෙන්ට අපි බලාපොරොත්තු වෙනව. ගාස්තු ක්‍රමක්‍රමයෙන් තවත් අඩු වන්ව පුළුවන්. අපි දන්නව, ඇමරිකාව ඇතුළත සෙන්ට් ෆ්‍රැන්සිස්කෝවල සිට නිව්යෝර්ක් දක්වා ගමන් කිරීමට වැය කරන මුදල යුරෝපයේ අනිකුත් රටවලට වඩා භාගයකින් විතර අඩු බව. මන්ද? ඒ තත්ත්වය ඇති වී තිබෙන්නෙ, නිතරම ගුවන් යාත්‍රා ගමන් කිරීම නිසයි. ගුවන් යාත්‍රා ගමන් කරන ප්‍රමාණයටයි, ගාස්තු අඩු කරන්ට පුළුවන් වෙන්නෙ. එම නිසා අපි කල්පනා කරනව, අපට දැනට තිබෙන ඩැකෝටා වර්ගයේ ගුවන් යානා තුන තබාගෙන අළුත ලැබෙන ඇව්රෝ යාත්‍රාව පාවිච්චි කරන්ට, ඉන්දියාවේ ගමනටත්, ලංකාවේ ගමනටත්. එවිට උදේ සවස සේවා හොඳින් පවත්වන්ට පුළුවන්. මා හිතන්නෙ ගාස්තු අඩු කිරීම පිළිබඳව හෙට පත්‍රවල පළ වෙයි. රුපියල් 40 ට බස්වා තිබේනව, කොළඹ සිට යාපන යට යාමට අය කරන ගාස්තුව.

**කේ. එම්. පී. රාජරත්න මයා.**

*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*

(Mr. K. M. P. Rajaratna)

අද පත්‍රයේ පළ වී තිබෙනව, සියයට 25 කින් අඩු කරන්ට යනව කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු අනිල් මූණසිංහ**
*(கௌரவ அனில் மூனசிங்க)*
(The Hon. Anil Moonesinghe)

නොයෙක් ඒවායේ ගාස්තු අඩු කරන්ට යනවා. තවත් ලංකාවේ දේශ සංචාර වැඩි කිරීම සඳහා අළුතින් ගුවන් තොටුපොළ වල් පිහිටුවන්ට අදහස් කරනවා. සීගිරිය ගුවන් තොටුපොළ ප්‍රතිසංස්කරණය කරන්ට අපි බලාපොරොත්තු වෙනවා. විදේශික සංචාරකයන් ලංකාවට ආවිට කැළණියට හා රත්මලානට පමණක් යවන්නෙ නැතුව ඒ කාලය තුළ සීගිරිය, පොළොන්නරුව, අනුරාධපුරය, ආදි ස්ථාන වලට ගෙන ගොස් පෙන්වන්න අපි අදහස් කරනවා. බැරි නම් එක ස්ථානයකටවත් ගෙන යන්න උත්සාහ කරනවා.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

නුවරඑළිය වැදගත්.

**ගරු අනිල් මූණසිංහ**
*(கௌரவ அனில் மூனசிங்க)*
(The Hon. Anil Moonesinghe)

ඒ ප්‍රශ්නය මතු කර තිබෙනවා. නුවර එළියේ පොඩි අමාරුවක් තිබෙනවා. අමාරුව මේකයි. නුවරඑළියේ ගුවන් තොටුපොළක් පිහිටුවන්න තැනක් තිබෙනවා. එහෙත් අවුරුද්දේ හය මාසයක පමණ කාලයක් අහස් යානාවලට එහි බහින්න අමාරුයි. එහි බසින්ට නම් රාඩාර් නමැති උපකරණ පාවිච්චි කරන්ට සිද්ධ වෙනවා. ඒකට වැඩි මුදලක් වැය කරන්ට සිද්ධ වෙනවා. එම නිසා ඒක ටිකක් කල් යන්ට පුළුවනි. එහෙත් මම ඒ ගැන පරීක්ෂා කරන්ට නියම කර තිබෙනවා.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

බදුල්ල?

**ගරු අනිල් මූණසිංහ**
*(கௌரவ அனில் மூனசிங்க)*
(The Hon. Anil Moonesinghe)

බදුල්ලේ ඉඩමක් සොයා තිබෙනවා.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

ඇයි, මහ පිට්ටනිය?

**ගරු අනිල් මූණසිංහ**
*(கௌரவ அனில் மூனசிங்க)*
(The Hon. Anil Moonesinghe)

මා දන්නෙ නැහැ, දිසාපතිතුමාට නියම කර තිබෙනවා, ඉඩමක් ගැන පරීක්ෂා කර බලන්ට කියා. ඉඩම එවිට මිළ දී ගන්ට බලාපොරොත්තු වෙනවා.

**රෝයි රාජපක්ෂ මයා.**
*(திரு. ரோய் ராஜபக்ஸ)*
(Mr. Roy Rajapakse)

කොග්ගල?

**ගරු අනිල් මූණසිංහ**
*(கௌரவ அனில் மூனசிங்க)*
(The Hon. Anil Moonesinghe)

නොවැම්බර් මාසයේ අන්තිමේ තරම කොග්ගලට සති දෙකකට පමණ අහස් යානා දුවවන්ට බලාපොරොත්තු වෙනවා. ඒ කාලයේ දී අපට ලාභයක් ලැබුණොත් ඒ සේවාව දිගටම ගෙන යන්ට පුළුවනි.

**රෝයි රාජපක්ෂ මයා.**
*(திரு. ரோய் ராஜபக்ஸ)*
(Mr. Roy Rajapakse)

කතරගමට දික් කළොත් හොඳයි.

**ගරු අනිල් මූණසිංහ**
*(கௌரவ அனில் மூனசிங்க)*
(The Hon. Anil Moonesinghe)

මම ඒකටත් දැන් වැඩ පිළිවෙළක් යොදවා තිබෙනවා. දැන් මාර්ගය හා ප්ලෑන් ආදිය සකස් කර තිබෙනවා. තව මාසයකින් පමණ වැඩ පටන් ගන්ට කිරින්දේ—

**රෝයි රාජපක්ෂ මයා.**
*(திரு. ரோய் ராஜபக்ஸ)*
(Mr. Roy Rajapakse)

පත්‍ර පනත ඉදිරිපත් කළ නිසා ස්වාමීන් වහන්සේලා එහෙම කතරගම යනවා, දැන් ඉක්මනින් කතරගමට ගුවන් සේවයක් ඇති කළොත් හොඳ ආදායමක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගුවන් ගමනා ගමන (සංශෝධන) පනත් කෙටුම්පත :

—දෙවන වර කියවීම

[රෝයි රාජපක්ෂ මයා.]

ලැබෙයි, ලේක් හවුස් එකෙනුත්, ටයිම්ස් එකෙනුත්, "දවස" පත්තරෙනුත්. මන්ද? ඒ අයිතිකරුවනුත් සමහර සවාමීන් වහන්සේලාත් භාර වෙන්ට දැන් කතරගම යනව.

**ගරු අනිල් මූණසිංහ**
*(கௌரவ அனில் முனசிங்க)*
(The Hon. Anil Moonesinghe)

කතරගම ශුද්ධ නගරයට ගුවන් සේවාවක් තව මාස 3 කටත් 6 කටත් අතර ඇති කරන්ට පුළුවන් වෙයි. කොහොමටත් කොග්ගලටත් අපට ගුවන් ගමන් සේවයක් ලබා දෙන්ට පුළුවන් වෙයි.

Another question was asked about the training and licensing of air pilots. The complaint is that some pilots are being tested for instrument rating by people who do not have adequate qualifications. There is also the complaint that some of the people who do have qualifications perhaps have an animus against these people. So I have laid down a new rule that anybody who is an air pilot in Air Ceylon should be given facilities to go to India and obtain the instrument rating and licensing facilities through the Indian authorities in order to avoid heartburning and complaints that they have not been given a proper test.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

කෙටුම්පත් පණත ඊට අනුකූලව දෙවන වර කියවන ලදි.

මතු පළ වන යෝජනාව සභාසම්මත විය :

"කෙටුම්පත් පණත පූර්ණ මන්ත්‍රී මණ්ඩල කාරක සභාවකට පැවරිය යුතුය"—[ගරු අනිල් මූණසිංහ]

[කාරක සභාවෙහිදී]

කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ විය.

1 වන හා 2 වන වගන්ති කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදි.

ප්‍රඥප්ති වගන්තිය හා නාමය කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදි.

කෙටුම්පත් පණත, සංශෝධනය රහිතව, වාර්තා කරන ලදි.

**ගරු අනිල් මූණසිංහ**
*(கௌரவ அனில் முனசிங்க)*
(The Hon. Anil Moonesinghe)

" කෙටුම්පත් පණත දැන් තුන්වන වර කියවිය යුතුය " යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

කෙටුම්පත් පණත ඊට අනුකූලව, තුන්වන වර කියවා සම්මත කරන ලදි.

## කල් තැබීම

## ஒத்திவைப்பு

## ADJOURNMENT

**ගරු බදිඋද්දීන් මහ්මූද් (සෞඛ්‍ය කටයුතු පිළිබඳ ඇමති)**
*(கௌரவ பதியுத்தீன் மஹ்மூது—சுகாதார அமைச்சர்)*

කාරක සභාවෙහිදී

(The Hon. Badiuddin Mahmud—Minister of Health)

I move,

"That the House do now Adjourn."

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදි.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,—

අ. භා. 6.42

**ගරු බදිඋද්දීන් මහ්මූද්**
*(கௌரவ பதியுத்தீன் மஹ்மூது)*
(The Hon. Badiuddin Mahmud)

I would like to make a Ministerial Statement. I am sorry the hon. Member for Akuressa (Dr. S. A. Wickremasinghe) and the hon. Member for Avissawella (Mr. D. P. R. Gunawardena) are not present. In any case I wish to read a statement in connection with the Paul affair.

The hon. Member for Akuressa and the hon. Member for Avissawella have referred to what has now come to be known as the "Paul affair" in this House. I shall deal with the points raised by each of them separately.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

The hon. Member for Akuressa stated as follows:

"This patient collapsed in the hospital and Dr. C. Umagiliya and Dr. L. D. C. Austin had both declared that Dona Carolina Ranasinghe was clinically dead." —[OFFICIAL REPORT, 6th October, 1964; Vol. 57, c. 3889.]

Dr. Umagiliya in his evidence states, "Her pulse was feeble", and later, "there was no improvement in the patient's condition." Dr. Austin states, "She had no pulse and was not breathing."

The hon. Member for Akuressa goes on to say:

"To say that after Dr. Paul handled this patient she died of cardiac-respiratory embarrassment is, I say, a physiological and pathological impossibility, for the patient never died at the hands of Dr. A. T. S. Paul of cardiac-respiratory embarrassment."

This statement raises two questions. Firstly, whether there was blood in the chest cavity and secondly, whether it caused death by embarrassment to the heart or lungs.

I shall deal with the first issue whether there was blood in the chest cavity. According to a note sent by Dr. Paul immediately after the death of this patient when this incident was fresh in his mind, the patient was dead, but Dr. Paul succeeded in reviving her and the patient lived for one hour, thanks to the efforts of Dr. Paul. She died at about 12 noon. From this it will be clear that the patient lived after the cardiac massage was started and there was blood circulation. The Deputy J. M. O. found that there were 24 ounces of blood in the left chest cavity, and there was damage to the heart muscle with collapse of the left lung. Dr. Paul in his evidence at the inquest by the Coroner on 6.6.63 has stated as follows:

"The Deputy J. M. O., Colombo, Dr. C. Amerasekera, had informed me that he found a quantity of blood in the chest. This is quite possible specially since the circulation was being maintained artificially."

In fairness to Dr. Paul, I must also state that he continued as follows:—

"In my opinion the patient died of cardiac failure which was proved by the electrical reading and the visual evidence that the heart was fibrillating in the theatre."

The hon. Member for Akuressa is a medical man, and I am sure he will now appreciate that the finding of blood in the chest cavity by the Deputy J. M. O. was not a physiological and pathological impossibility. I have to make this statement and clear the Deputy J. M. O., because he is called upon to give evidence very frequently in the courts and on his opinion a man may be hanged or saved. It is unfair to question the *bona fides* of such a responsible officer on the basis of hearsay information which is contradicted by the note sent by Dr. Paul himself and his evidence before the Coroner in which he did not contest the presence of blood in the chest cavity.

As the hon. Member for Akuressa is not in Ceylon, I must add this in fairness to him. I had occasion to discuss this statement with the Member for Akuressa. He desired to check the facts further. However, he disagreed with the inferences on two points. Firstly, he stated that the life of this lady was kept going artifically by Dr. Paul and as soon as he stopped the massage the lady would have died. The real cause of death was the original cause of death before the cardiac massage. His second point is though the presence of 24 ounces of blood may have embarrassed the heart or the lungs in a closed space, there can be no embarrassment in an open heart massage.

I have consulted my technical officers on these two points, and I am advised as follows. Regarding the first point, whether the real cause of death is the original cause given by Dr. Paul or the immediate cause given by the Deputy J. M. O., I am advised that the opinion of the Deputy J. M. O. is consistent with the findings of the post-mortem examination and the note of Dr. Paul already read out

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

by me. Regarding the second point, whether in open heart massage there can be no embarrassment, I am advised that even though the chest is opened up for internal cardiac massage, this does not exclude embarrassment of either the heart or the lungs, especially when there has been injury to the heart muscles. there was blood in the chest cavity and the left lung had collapsed as indicated in the post-mortem examination.

The hon. Member for Akuressa has also referred to the inquiry against Dr. Karunaratne and referred by name to individual officers in the Health Department. I would earnestly appeal to all Members of this House not to comment on or criticize individual public officers without being fully satisfied that they are really to blame. In this case the P. S. C. is keeping the contents of the report of the Committee of Inquiry secret. So, there is no authentic information about the report and it is not fair to criticize public officers purely on hearsay. They have no chance of replying. If they wish to reply, the only way in which they can do so is to approach another Member of the House and ask him to given them a good certificate. This, obviously, is not in the public interest. Therefore, may I ask for the co-operation of all Members of this House in ensuring that public officers are not criticized unnecessarily.

Now, coming to the points made by the hon. Member for Avissawella (Mr. D. P. R. Gunawardena), it will be remembered that immediately after I read the statement on the 1st, he stated, " It is a false statement and it is a statement obtained from stooges." He has repeated on the 9th also that my statement is false. He has been a Minister and he should appreciate that it is improper to brand public officers working under a Minister as stooges merely because the hon. Member for Avissawella disagrees with them. It is also a sweeping statement to say that information obtained from official files are all lies, as acceptance of that position would mean that no reliance whatever can be placed on official files. One would expect a greater sense of responsibility from a former Cabinet Minister.

He has stated on the 9th that I have commented on matters that are *sub judice*. That is not correct. Of the five charges that were suggested against Dr. Paul, the first four charges relating to the death of Mrs. D. C. Ranasinghe have been dropped. My comments related to those four charges only. The fifth charge which is pending against Dr. Paul is for refusing to make a statement on the death of Mrs. D. C. Ranasinghe and insubordination towards the Inquiry Officer on which I have carefully refrained from making any comments whatsoever.

The hon. Member for Avissawella has also, in his statement, mentioned that Dr. Paul was not allowed to see the findings of the post-mortem examination and that the Deputy J. M. O. had shown these to the Superintendent, General Hospital. Actually, Dr. Paul was informed on the 5th evening to be present for the inquest at 10 a.m. on the 6th at the General Morgue. The post-mortem examination disclosed the presence of 24 ounces of blood in the left chest cavity and, as this is unusual, the Deputy J. M. O. tried to contact Dr. Paul and failed. As he could not contact Dr. Paul, he summoned the Medical Superintendent of the General Hospital and showed him the findings of the post-mortem examination. Subsequently Dr. Paul himself arrived there and he too was shown the findings of the post-mortem examination. Not only was he shown the findings but there was also an animated argument between Dr. Paul and the Deputy J. M. O. about the inferences drawn from the findings.

As Dr. Paul has indicated to me that he desires two disciplinary inquiries to be held into matters connected with the death of Mrs. D. C. Ranasinghe, I would ask hon. Members of this House to await the out-

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

come of these inquiries and refrain from discussing this subject till the results of these inquiries are known.

අ. භා. 6.51

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සභා නායකතුමාගෙන් ප්‍රශ්නයක් ඇසිය යුතුව තිබෙන නමුත්, එතුමා මෙහි නොසිටීම ගැන කණගාටු වෙනව. එම නිසා මා අසන ප්‍රශ්නය ගරු සෞඛ්‍ය ඇමතිතුමා විසින් ගරු සභානායකතුමා වෙත ඉදිරිපත් කර නවා ඇතැයි මම බලාපොරොත්තු වෙනව.

පුවත්පත් කොමිෂන් සභාවෙ අවසාන වාර්තාවෙ—1964, 11 වන සැසි වාර්තාව වශයෙන් නිකුත් කර ඇති වාර්තාවෙ—94 වෙනි පිටුවෙ මෙසේ සඳහන්ව තිබෙනව:

"The scheme we devised for the break-up of the monopoly was necessarily dependent on the existence of a Press Council as recommended by us in paragraphs 47 and 49 of our Interim Report. In the absence of such a Press Council we certainly would not have envisaged the formation of a public corporation to take over the Lake House Press. The monopolistic ownership of the Lake House group of newspapers must, however, be terminated in any event. For that purpose, if a Press Council as suggested by us in our Interim Report is not set up, we would definitely refrain from recommending the take-over of the Lake House group of newspapers, but instead we would recommend that the ownership of those newspapers be diffused in the hands of a public company in the manner set out in paragraph 89 to 97 of our Interim Report."

එහි සිංහල අනුවාදය මේකයි. පුවත්පත් ඒකාධිකාරය නැති කොට පුවත්පත් මණ්ඩලයක් ඇති කිරීමට අපේ අතුරු වාර්තාවෙ 47 සහ 49 ඡේදවලින් අපි යෝජනා කර තිබෙනව. එවැනි පුවත් පත් මණ්ඩලයක් නොමැතිව, ලේක් හවුස් පුවත්පත් සමාගම රජයට ගැනීමක් හෝ පොදු සංස්ථාවකට පැවරීමක් කිසිසේත්ම අපි බලාපොරොත්තු වෙන්නෙ නැහැ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

කවුද කියන්නෙ?

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

පුවත්පත් කොමිෂන් සභාවෙ අවසාන වාර්තාව.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

කියන හැම එකක්ම පිළිගන්න බැඳී ඉන්නවද?

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

මේ වාර්තාවෙන් තවත් දුරට මෙසේ කියනවා: ලේක්හවුස් ආයතනයේ පුවත් ඒකාධිකාරිය කෙසේ හෝ වේවා අවසන් කළ යුතුයි. එසේ හෙයින් අපේ අතුරු වාර්තාවේ සඳහන් කර තිබෙන පරිදි ඒ සඳහා පුවත්පත් මණ්ඩලයක් පත් කළ යුතුයි. එසේ පුවත්පත් මණ්ඩලයක් පත් නොකර එය රජයට ගැනීම ගැන අපේ විරෝධය පළ කරන අතර, ඒ වෙනුවට අපි ඉල්ලා සිටිනව, අපේ අතුරු වාර්තාවේ 89 සහ 97 වන ඡේදයන් හි සඳහන් කර තිබෙන පරිදි පොදු සමාගමක් ඇති කර පුවත්පත් අයිතිය පවරන්නය කියා. අව සාන වාර්තාවෙ සඳහන් කර ඇත්තේ ඒ විධියටයි.

අපේ රටේ නායිකාව වූ ගරු අගමැති නියත්, ඒවාගේ ම සභානායක තුමාත් ළඟදී ප්‍රසිද්ධ ප්‍රකාශයක් කර තිබුණා, ආණ්ඩුව විසින් පුවත්පත් ගැනීම පිළිබඳ වැඩ පිළිවෙල සකස් කරන්නෙ පුවත්පත් කොමිෂන් සභාවෙ නිර්දේශ අනුවය කියා. ඒ කොමිෂන් සභාවෙන් නිර්දේශ කරන විධියට ආණ්ඩුවට යට වන්නෙ නැති පුවත්පත් මණ්ඩලයක් පත් කළ යුතුයි. එයින් අදහස් කරන්නේ ලේක් හවුස් ආයතනය රජයට පවරා ගැනීම හෝ සංයුක්ත මණ්ඩලයට පවරා ගැනීම වැරදි බවයි. කොමිෂන් සභාවෙන් එසේ පැහැදි ලිව කියා තිබියදීත්, අගමැතිනිය සහ සභා නායකතුමාත් පැහැදිලි වශයෙන්ම අර විධි යේ ප්‍රකාශයක් කර තිබියදීත් ලේක්හවුස් ආයතනය ගැනීම ඒ වාර්තාවටත් අර ප්‍රකා ශයටත් සම්පූර්ණයෙන්ම පටහැණියි. අග මැතිනිය දැනට රටින් පිට විදේශයක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. එම්. පී. රාජරත්න මයා.]

සිටින නිසා මම හිතනවා මෙම අවසාන වාර්තාව කියවන්නට එතුමියට අවසථා වක් ලැබුණේ නැත කියා. පුවත්පත් කොමිෂන් සභාවෙ අවසාන වාර්තාවෙ සඳහන් කර ඇත්තේ මෙසේය කියා වහාම එතුමියට දන්වා, අද ඉදිරිපත් කළ පුවත් පත් පණත නොව, මෙම අවසාන වාර්තාව ගැන සකාචඡා කිරීමට අපට ඉක්මනින්ම අවසථාවක් ලබා දෙන්නය කියා මම ඉල් ලනව.

මම මෙය කියන්නේ මේ පිළිබඳව ගරු අගමැතිනියට දැනුම්දීමට ගරු සභානායක තුමාට යුතුකමක් තිබෙන නිසයි. පුවත් පත් ගැනීම සඳහා පුවත්පත් කොමිෂන් සභාව උපයෝගී කරගන්නවා නම්, ඒ කොමිෂන් සභාව කියන අන්දමට කටයුතු කර නැති බවයි, මට කියන්න තිබෙන්නේ. කොමිෂන් සභාව කියනවා, එම කොමිෂන් සභාවේ අතුරු වාර්තාවේ සඳහන් ආකාර යට පුවත්පත් ගන්න එපාය කියා, ස්වා ධීන මණ්ඩලයක් ඇති කරන තුරු. තවම එවැනි ස්වාධීන මණ්ඩලයක් ඇති කර නැහැ. ආණ්ඩුවේ බලාපොරොත්තුවකුත් නැහැ, එවැනි ස්වාධීන මණ්ඩලයක් ඇති කිරීමට. මේ පිළිබඳව අද උත්තර නැති වූවාට කමක් නැහැ; අගමැතිනියගෙනුත් අසා හෙටවත් උත්තරයක් දෙන මෙන් මම ඉල්ලා සිටිනවා. හැංගි හොරා වැඩ කරන්න එපායයි මම කියා සිටිනවා. මේ වාර්තාව ගැන ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාවක් දෙන්න. අපි විරුද්ධ වුවත් ආණ්ඩුවට වුවමනා දෙයක් කරන්න පුළුවන් ශක්ති යක් තිබෙනවා. ඒ නිසා මේ කෙටුම්පත් පණත සාකචඡා කරන්න පෙර මේ වාතීාව සාකච්ඡා කිරීමට මේ සභාවට අවස්ථාවක් ලබා දෙන්නායයි මම ඉල්ලා සිටිනවා. මේ අවසාන වාර්තාවයි. එම කොමිෂන් සභාවේ අවසාන තීරණයයි. මේ අවසාන තීරණය පිළිබඳව නිසියාකාර සාකච්ඡා කිරීමට අපට අවස්ථාවක් දෙන්න. ගරු සෞඛ්‍ය ඇමති තුමා මේ කාරණය සභානායකතුමාට දන්වා අපට හෙට උත්තරයක් ලැබෙන්න සලස්වනවා ඇතැයි මම බලාපොරොත්තු වෙනවා.

අ. භා. 6.57

**රෝයි රාජපක්ෂ මයා.**

*(திரு. ரோய் ராஜபக்ஸ)*

(Mr. Roy Rajapakse)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට ලැබී තිබෙන පෙත්සමක් මම ඉදිරිපත්කරන්න කැමතියි. එය ඉංග්‍රීසියෙන් තිබෙන්නේ. ඒ නිසා මම එය කියවන්නම්:

"Ceylon Council for the Welfare of Cripples".

I am not going to read the whole letter, but I will read portions.

The petition has been addressed to the Hon. Minister of Health. It says:

"Hon. Sir,

*Manager, Orthopaedic Workshop, Orthopaedic Clinic, General Hospital, Colombo.*

The Orthopaedic Clinic, mainly the workshop attached to the General Hospital, has been a butt for criticism and numerous complaints have been received from these handicapped persons who go for treatment, as much displeasure has been caused to these cripple inmates, due to the very callous attitude of the Manager of the workshop and due to the mismanagement by this officer concerned.

Questions have even been raised in Parliament pertaining to the activities of the Orthopaedic Workshop and I would refer to the Hansard Reports Volume 46, No. 38 of 8th June 1962 pages 6534 and 6535; Volume 40 No. 1 of 18th September 1962; pages 2, 3 and 4; Volume 49 No. 5 pages 918 and 919........"

Then he says that the manager comes to office at about 10.30 or 11 a.m. after having all kinds of business dealings in Maradana, at Bristol Agencies and so on. There was a district court case where very serious allegations were made against him. The Hon. Minister should get down the case record and look into the matter.

The petition further says:

"The Manager of the Orthopaedic Workshop is more engaged outside his official scope of legitimate duties than attending on these poor helpless cripples who come for treatment. He is a President of Hakmana Co-op. Society of Textile Weavers and in this capacity he has even raised a loan of nearly one million rupees from Government and whole time busy on this outside work dabbling in other money-earning projects than attending on his legitimate work. Moreover, this man's character has been

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

doubted in a court case in which he conspired and fraudulently got a last will executed on one Mrs. P. Dona Seelawathie Hamine who died in the General Hospital on December 26, 1958. The Additional District Judge of Colombo, described this man, even ignoring the common decency of prefix 'Mr.' and referred him as viz; 'Paramour Dillimuni'. (Vide Court case dated 27.7.60)"

I would like the Hon. Minister to get a copy of the court case. We cannot expect anything from officers like this who come into office at about 10.30 or 11 a.m. and neglect the cripples.

There is another question of which I gave notice to the Hon. Minister of Industries.

**කාරක සභා නියෝජ්‍ය සභාපති**
*(குழுக்களின் பிரதி அக்கிராசனர்)*
(Mr. Deputy-Chairman of Committees)

Order, please! Business is now interrupted.

එකල්හි වේලාව අ. භා. 7 වූයෙන්, ප්‍රශ්නය නොවිමසන ලදුව මන්ත්‍රී මණ්ඩලය කල් තැබීමේ යෝජනාව අහෝසි විය.

යෝජනාව යළිත් ඉදිරිපත් කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදි:

"මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය" [ගරු බදිඋද්දීන් මහ්මූද්]

**රෝයි රාජපක්ෂ මයා.**
*(திரு. ரோய் ராஜபக்ஸ)*
(Mr. Roy Rajapakse)

මේ ප්‍රශ්නය ගරු ග්‍රාම හා කර්මාන්ත සංවර්ධන ඇමතිතුමාටයි. මේ දිල්ලිමුනි මහත්මයා හක්මන රෙදි වියන්නන්ගේ සමිතියේ සභාපති. මේ සමිතියට බලවේගයෙන් රෙදි වියන යන්ත්‍ර 48ක් තිබෙනවා. රුපියල් 11,64,649.16 ක් වැය වී තිබෙනවා. ආණ්ඩුවෙන් ලක්ෂ 6 ක් මුදල් ගෙන තිබෙනවා. මේ දිල්ලිමුනි මහත්මයා මේ සමිතියේ සභාපති වූයේ කොහොමද? කොළඹ වැඩ කරනවා නම් මේ තරම් භාර දුර ව්‍යාපාරයක්—11 ලක්ෂයක් වටිනා ව්‍යාපාරයක්—ගෙනයන සමිතියක සභාපති වූයේ කොහොමද? මොහු සමග ඩී. ඕ. ලා වංචා සහගත සම්බන්ධකම් ඇති කරගෙන තිබෙනවා. තවත් නිලධාරීන් ඒ විදියේ සම්බන්ධකම් ඇති කරගෙන තිබෙනවා. මේ සඳහා ආණ්ඩුවේ මුදල් ගෙන තිබෙනවා. මේවා කජු නොවෙයි. රුපියල් ලක්ෂ 6 ක් ගෙන තිබෙනවා. ඒ නිසා මේ පිළිබඳව සොයා බැලීම මේ අමාත්‍යාංශයේ යුතුකමක්.

ඉඩමට වැය වී ඇති මුදල රුපියල් 4,869. ඉඩම් අක්කර දෙකයි. මහපාරේ සිට සැතපුම් එකහමාරක් ඈත ගම්සභා පාරකයි, මෙය පිහිටුවා තිබෙන්නේ. මම ගම්සභාවේ සභාපති නම් කවදාවත් මම ඒ පාරේ ගඩොල්, සිමෙන්ති හා වෙනත් උපකරණ ගෙන යන බර ලොරි යාමට ඉඩ දෙන්නේ නැහැ. සුදුසු මධ්‍යස්ථානවල ඕනෑ තරම් ඉඩම් තිබෙනවා. නමුත් ඒවා ගෙන නැහැ. මෙහි ගොඩනැගිලි සඳහා රුපියල් 3,71,166.50 ක් වැය වූ බව පෙන්වා තිබෙනවා. ගොඩනැගිලි සඳහා ඉදිරිපත් කළ ඇස්තමේන්තු "ලෝඩඩ්" ඒවා. මට ආරංචියි, කොන්ත්‍රාත්කාරයාට ලොකු ගණනක් ලැබුණාය කියා. ලක්ෂ 3 ක් කියන්නෙ කජු ඇට නොවෙයි, ආණ්ඩුවෙ මුදල්; මහ ජනයගෙ මුදල්. ඇයි මේ විධියට මුදල් කාබාසිනියා කරන්ට ඉඩ දෙන්නෙ? අමාත්‍යාංශයෙන් මේවා ගැන සොයා බලන්නෙ නැත්තෙ ඇයි? ඩී. ආර්. ඩී. ටයි, මාතර ඉන්න ඩී. ඕ. ටයි වුවමනා විධියට වැඩ කරන්න දෙනව නම් මේකෙන් ඇති වැඩක් නැහැ. මේ ගොඩනැගිලි හදන තෙක් පළාතේ මන්ත්‍රීවරය හැටියට මම ඒ ගැන දන්නෙ නැහැ. බල වේග යන්ත්‍ර 48 ක් එනවය කියන්නෙ ඇත්තද, සේවකයන් ගන්නවය කියන්නෙ ඇත්තද, කියා පළාතේ මිනිස්සු මගෙන් ප්‍රශ්න කරනව. මම ඒ ගැන දන්නෙ නැත කියා මම කීව. ආසනයේ කෙරෙන වැඩ ගැන ඒ ආසනයට පත් වූ නියෝජිතය දන්නෙ නැත්නම් ඒක කොයි තරම් නින්දාවක්ද? අපට ඇමති අංශයෙන් මේවා දන්වන්නෙ නැත්නම්, නිලධාරි මහත්වරු දන්වන්නෙ නැත්නම්, ඩී. සී. සී. එකේ දිවත් කියන්නෙ නැත්නම්, අපි දැන ගන්නෙ කොහොමද? ඩී. ආර්. ඩී. ටයි, මාතර ඩී.ඕ. ටයි වුවමනා විදියට මේ කටයුතු කරන්න ඉඩ දෙන්නෙ ඇයි කියා මම ප්‍රශ්න කරනව.

යන්ත්‍ර උපකරණවලට රුපියල් 3,75,514යි බ්‍රිස්ටල් ඒජන්සියයි, මේවා ගෙන්වන්නෙ. මේකට වික්‍රමසිංහ කියන මහත්මයකුගෙ සම්බන්ධකමක් තියෙනවලු. දිල්ලි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රෝයි රාජපක්ෂ මයා.]

මුණ්ටත් සම්බන්ධකමක් තියෙනව. සිය යට විසි පහක් කොමිස් ලැබෙනවය කියා ආරංචියි. මේ ගැනත් සොයා බලන්න ඕනෑ. අර නිලධාරියා මේක හැදුවය, මේකට අනුමැතිය දුන්නය, කීවට හරි යන්නෙ නැහැ. මේ විධියට සෑම දෙපාර්තමේන්තුවකින්ම ආණ්ඩුවේ මුදල් කාබා සීනියා කරනව. මේවා වළක්වන්න ඕනෑ. දක්ෂ පාර්ලිමේන්තු ලේකම්වරයෙක් ඉන්න නිසා මේවා ගැන හොඳින් සොයා බලාවියයි අපි බලාපොරොත්තු වෙනව.

විදුලි යන්ත්‍ර සවි කිරීමට රුපියල් 1,79, 545 යි; තෙමසක වැඩ කරන මුදල රුපියල් 75,000; අමු ද්‍රව්‍ය රුපියල් 1,50,000යි; වෙනත් ලී බඩු ආදිය රුපියල් 8,554 යි.

මේ දිල්ලිමුණි මහත්මය තවත් ලොකු වැරදි වැඩක් කරල තියෙනව. අර මා කලින් කී අම්මණ්ඩිගෙ පුතා—කොළඹ ආනන්ද විද්‍යාලයේ ඉගෙන ගත් ජය තිලක නමැති කෙනෙක්—ජපන් රටට යවා තිබෙනව, පුහුණු කිරීමට. මොල්ලි ගොඩ ඉංජිනේරු මහත්මයගෙ මල්ලි කෙනකුත් යවා තිබෙනව. හක්මන ආසන යෙන් විද්‍යාව දන්න උදවිය ඉන්න බව මම ඇමතිතුමාට මතක් කරනව. ජපන් රටට ගිහින් පුහුණු වෙලා ඇවිත් රෙදි වියන මධ්‍යස්ථානයට ඇතුළු වන්න පුළු වන් අය හක්මන ආසනයෙත් ඉන්නව. කොළඹ ආනන්ද විද්‍යාලයේ අයට පුහුණු වක් ලබා දී ඔවුන් ලවා අපේ ගම්බද ගැහැණු ළමයින්ට රෙදි වියන්න උගන්වන්නයි, ලැස්ති වන්නෙ. ඉල්ලුම් පත්‍ර කැඳවන්නෙ නැතිව, ප්‍රසිද්ධ කරන්නෙ නැතිව, මේ විදියට තක්කඩි පිළිවෙළට පිට රට යවන්නෙ ඇයි කියා මම ප්‍රශ්න කරනව.

මධ්‍යස්ථානයක් වශයෙන් තෝරා ගන්න ආණ්ඩුවේ ඉඩම් ඕනෑ තරම් තියෙනව, නමුත් මධ්‍යස්ථානයට සුදුසු තැනක් තෝරා ගත්තෙ නැහැ. ඩී. ආර්. ඕ. බැලුවය, ඩී. ආර්. ඕ. තක්සේරු කළාය, කියා මේ වාර්තාවෙ කියා තිබෙනව. නමුත් ඩී.සී.සී. එකේදි ඇහුවම ඩී. ආර්. ඕ. කියනව, ඔහු තක්සේරු කළෙත් නැත, මේ ඉඩම ගන්න බව ඔහු දන්නෙත් නැත කියා.

තව ලොකු වැරද්දක් තියෙනව. රුපියල් ලක්ෂ 11 ක මේ වැඩය පාලනය කරන්න අරගෙන තියෙන්නෙ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවෙ බිල්ඩිං ඔවර්සියර් කෙනකු හැටියට වැඩ කරද්දි වංචාවක් නිසා සේවයෙන් පහ කළ එරික් සමරවික්‍රම නමැති කෙනෙක්. ලක්ෂ 11 ක වැඩක් පරීක්ෂා කරන්න මේ වගේ කෙනෙක් හිටියොත් ලක්ෂ කීයක් හොරුන්ගෙ අතට යයිද කියා මම ප්‍රශ්න කරනව.

ගොඩ කරපු පසෙයි, අඩිතාලම කපා තිබුණේ. මා ප්‍රශ්න කළ පසු යන්තම් අඩි 12 ක් හාරල හයිය පොළව අරගෙන තියෙනව, අඩිතාලම දැමීමට. මේ ගැන තියුණු පරීක්ෂණයක් කළේ නැත්නම් මට කියන්න කනගාටුයි, මම මේ ප්‍රශ්නය උඩ පාර්ලිමේන්තුවෙන් අස් වෙලා මහජනයා ඉදිරිපිටට ගිහින් මේ ගැන විස්තර කරනව.

ගරු බදිඋද්දීන් මහ්මූද්
*(கௌரவ பதியுத்தீன் மஹ்மூது)*
(The Hon. Badiuddin Mahmud)

I shall bring to the notice of the Leader of the House the matter raised by the hon. Member for Welimada.

කේ. එම්. පී. රාජරත්න මයා.
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

මේ වාර්තාව ඉංග්‍රීසියෙන් තියෙන්නෙ. මේ රටේ මහජනයාට දැන ගන්න මෙය සිංහලෙන් දෙන්නෙ නැද්ද?

ගරු බදිඋද්දීන් මහ්මූද්
*(கௌரவ பதியுத்தீன் மஹ்மூது)*
(The Hon. Badiuddin Mahmud)

දෙනව, දෙනව. ඉක්මනට දේවි. සිංහලෙන් අච්චු ගහගෙන යනව.

රෝයි රාජපක්ෂ මයා.
*(திரு. ரோய் ராஜபக்ஸ)*
(Mr. Roy Rajapakse)

මගේ කලින් ප්‍රශ්නයට විභාගයක් දෙනවද?

ගරු බදිඋද්දීන් මහ්මූද්
*(கௌரவ பதியுத்தீன் மஹ்மூது)*
(The Hon. Badiuddin Mahmud)

ඔව්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 7.9

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

මට මීට පෙර මේ ප්‍රශ්නය එතුමා ඉදිරිපත් කළා. මා ඒ ගැන පරීක්ෂණයක් පැවැත්තුවා. මෙය මට මේ අවස්ථාවේදී කලින් දැනුම් නොදුන්නත්, මට පිළිතුරක් දෙන්න පුළුවන්. මෙය හක්මන සමුපකාර රෙදි වියන්නන්ගේ සංගමයේ සිද්ධියක්. මේ සමුපකාර සංගමය තුළ යම්කිසි වරදක් සිදු වී තිබෙනවා නම්, ඒ වරද ගැන පරීක්ෂණයක් කරන්නට ඕනෑ කරන්නෙ කර්මාන්ත අමාත්‍යාංශය මගින් නොවෙයි, සමුපකාර අමාත්‍යාංශයෙන් බව මා තමුන්නාන්සේට දැනුම් දෙන්න කැමතියි. දිල්ලිමුනි මහතා එහි සභාපති වශයෙන් පත්කර තිබෙන්නෙ සමුපකාර කොමසාරිස් තුමායි. ඒ පත් කරන අවස්ථාවේදී කර්මාන්ත දෙපාර්තමේන්තුවේ නිලධාරින් ගෙනුත් අදහස් විමසා තිබෙන බව ඇත්තයි. අපේ නිලධාරීන් කියන හැටියට ඒ මහත්මයාගේ පත්වීම මෙසේයි: ඒ අවස්ථාවේදී රජයේ නිලධාරීන් කීප දෙනෙකු පත් කිරීම හෝ මාරු කිරීම සාමාන්‍යයෙන් සමුපකාර දෙපාර්ත මේන්තුවේ ප්‍රතිපත්තියක්. රජයේ සේවක යෙකුගේ නමක් හැටියට එය ඉදිරිපත් වූ අවස්ථාවේදී අපේ දෙපාර්තමේන්තුවෙන් විරුද්ධත්වයක් පෙන්වා නැහැ, ඒ අවස්ථාවේදී ඒ මහත්මයාට විරුද්ධව යම්කිසි චෝදනාවක් නොතිබුණු නිසා. මා හිතන්නෙ නැවත පත් කරන අවස්ථාවක දී—දැන් කාලය අවසාන වීගෙන යනවා කියා මා හිතනව—අපේ දෙපාර්තමේන්තුවෙන් විමසුවොත්, ගරු මන්ත්‍රීතුමා දැක්වූ කරුණු ගැන අපේ දෙපාර්තමේන්තුව සලකා බලනවාට කිසිම අඩමානයක් නැහැ.

ඇස්තමේන්තු සෑදීම, ඒ වගේම ශිෂ්‍යයින් තෝරා ගැනීම, ටෙන්ඩර් කැඳවීම, ඉඩම් තෝරා ගැනීම, ආදී මේ ප්‍රශ්න සියල්ලම සමුපකාර කොමසාරිස්තුමාගේ පාලනය යටතේ තිබෙන රෙදි වියන්නන්ගේ සමුපකාර සංගමයක සිද්ධීන් නිසා, ඒවා ගැන සොයා බලන්න කර්මාන්ත දෙපාර්තමේන්තුවට පුළුවන්කමක් නැහැ. අපට පුළුවන් කාර්මික උපදෙස් අතින් යම් යම් දේවල් ඒ සංගමය බලාපොරොත්තු වෙනවා නම් ඒවා ලබා දීමයි. මේ තොරතුරු වුණත් අපි එතුමාට ලබා දෙන්නේ අපේ නිලධාරීන් ඒ කාරක සභාවේ සිටින නිසයි.

මේ වාගේ සුළු ප්‍රශ්නයක් උඩ ගරු මන්ත්‍රීතුමා අස් වන්නට වුවමනාවක් නැහැ. මෙය වැඩි කලක් යන්නට පෙර බොහොම ලක්ෂණට විසඳන්නට පුළුවන් වේවි. සමහරවිට දිල්ලිමුනි මහතා නොයෙක් විධියේ අභියෝග කරනවා වෙන්න පුළුවන්. නමුත් නීත්‍යානුකූලව නැවත වරක් පත් කිරීමේදී එවැනි පුද්ගලයින් පත් නොකිරීමට කටයුතු කරනවා ඇත කියා මා විශ්වාස කරනව. මේ ගැන අපේ අමාත්‍යාංශයට තව දුරටත් යමක් කරන්න පුළුවන් නම් ඒ සියල්ලක්ම ඉටු කරන බවට ඇමතිතුමා වෙනුවෙන් මා පොරොන්දු වෙනව.

**රෝයි රාජපක්ෂ මයා.**
*(திரு. ரோய் ராஜபக்ஸ)*
(Mr. Roy Rajapakse)

ගරු කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් මෙයින්ම අපට පෙනෙනවනෙ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවත් සමුපකාර දෙපාර්තමේන්තුවත් අතරේ සම්බන්ධතාවක් නැහැ කියල. අද සමුපකාර කොමසාරිස්තුමා කියනවා ඩී. ඕ. කාරක සභාවෙ සිටිනවලු. ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවෙ කෙනෙකුත් සිටිනවලු. ආර්.ඩී.ඕ. සිටිනව. එස්ටිමේට් හැදුවෙ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවෙන්. ණය මුදල් දෙන්නෙ කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන්. එහෙම වුණත්, සමුපකාරය පිහිටෙව්වට පස්සෙ එක නියෝජිතයෙක් පමණක් මේ කාරක සභාවෙ සිටිනව. මේ 7 වැනි පන්තිය පාස් කළ කෙනෙකුට කොළඹ සිට දැන් පාලනය කරන්න පුළුවන්ද? ඒක කරන්න බැහැ. (බාධා කිරීම්)

**කාරකසභා නියෝජ්‍ය සභාපති**
*(குழுக்களின் பிரதி அக்கிராசனர்)*
(Mr. Deputy Chairman of Committees)

ගරු මන්ත්‍රීතුමා කථාවක් කරනවද? කථාවක් කරන්න—[බාධා කිරීමක්]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රෝයි රාජපක්ෂ මයා.
(திரு. ரோய் ராஜபக்ஸ)
(Mr. Roy Rajapakse)
නැහැ, මම කියන්නෙ මේ කාරණය ගැනයි. [බාධා කිරීමක්]

ටී. බී. එම්. හේරත් මයා.
(திரு. ரீ. பி. எம். ஹேரத்)
(Mr. T. B. M. Herath)
ගරු කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමනි, මා දන්නා හැටියට කාරක සභාවට නියෝජිතයෙක් පත් කිරීම සමුපකාර කොමසාරිස්තුමාගේ මගින් කෙරෙන එකක්. [බාධා කිරීමක්]

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 7.12 ට, අද දින සභාසම්මතිය අනුව, 1964 ඔක්තෝබර් 16 වන සිකුරාදා පූ. භා. 10 වන තෙක් කල් ගියේය.

*சபையினது இன்றைய தீர்மானத்திற்கிணங்க, பி. ப. 7.12 மணிக்கு, 1964 ஒக்ரோபர் 16 ஆம் தேதி வெள்ளிக்கிழமை மு. ப. 10 மணிவரை சபை ஒத்திவைக்கப் பெற்றது.*

*Adjourned at 7.12 p.m. until 10 a.m. on Friday, 16th October, 1964, pursuant to the resolution of the House this Day.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි. මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපැලෙන් ශත 45යි. මුදල්, කොළඹ, ගාලු මුවදොර මහ ලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் செலுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம்; தனிப்பிரதி சதம் 30. தபால்மூலம் 45 சதம். முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32 00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months. Each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

---


ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි

இலங்கை, வாழைச்சேனை ஈஸ்ரேண் பேப்பர் மில்ஸ் கோப்பரேஷனால் உற்பத்தி செய்யப்பட்ட காகிதத்தில், இலங்கை அரசாங்க அச்சகத்திற் பதிப்பிக்கப்பெற்றது

Printed at the Government Press, Ceylon, on paper manufactured at the Eastern Paper Mills Corporation, Valaichchenai, Ceylon



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org